


★★★

අඛණ්ඩවම 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

30420214-DLD

30 වැනි කාණ්ඩය | 179 වැනි පත්‍රය | පිටු 16 යි | විජය ප්‍රකාශනයක් | 2021 අප්‍රේල් මස 3 වැනිදා සෙනසුරාදා | අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk | මිල රුපියල් 30.00 යි


## අන්තවාදී කල්ලියක ප්‍රබලයෝ දෙදෙනෙක් කාත්තන්කුඩියේදී අත්අඩංගුවට

10 වැනි පිටුව බලන්න

# අවුරුද්දට ගමේ යන අයට අහඹු ඇන්ටිජන් පරීක්ෂණ





## වසංගත රෝග අංශ ප්‍රධානී කියයි

(සුජිත් හේවාජුලිගේ)

අවුරුදු සමයේදී ගම්බිම්බලා යන ජනතාව අතුරින් යම් යම් පිරිස් අහඹු ලෙස තෝරාගෙන ඇන්ටිජන් පරීක්ෂණවලට යොමු කිරීමට සැලසුම් කර ඇතැයි වසංගත රෝග විද්‍යා අංශය පවසයි.

කොළඹ සිට පිට පළාත් සඳහා යන ප්‍රධාන මාර්ග කිහිපයක දී මෙම ඇන්ටිජන් පරීක්ෂණ ක්‍රියාත්මක කෙරේ. ඒසඳහා සෞඛ්‍ය අංශ නිලධාරී කණ්ඩායම් කිහිපයක් එම ස්ථානවලට යොමු කිරීමට ද පියවර ගෙන ඇතැයි වසංගත රෝග විශේෂඥ සුදත් සමරවීර මහතා පැවැසීය.

6 වැනි පිටුවට


## පළමු මාත්‍රාව දීම නැවැත්වීමේ තීරණය වෙනස් කරයි

(රංජන් කස්තූරි)

ඇස්ට්‍රාසෙනෙකා කොවිෂීල්ඩ් එන්නතේ පළමු මාත්‍රාව ලබාදීම අත්හිටුවීමේ තීරණය වෙනස් කළ බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවසීය.

6 පිටුවට

## බුදුපුතුන් කූරගල මහ සෑ ශ්‍රමදානේ...



ඓතිහාසික කූරගල පුදබිමේ අසදිසි සුගත මහා සෑයේ ඉදිකිරීම් කටයුතු ඉකුත් 28 වැනිදා ආරම්භ කෙරුණු අතර එහි ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රම දයකත්වය ලබාදීමට දිවයිනේ සිවුදෙසින් ගිහි පැවිදි පිරිස් පැමිණෙමින් සිටිති.

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ භික්ෂූන් වහන්සේලා එම කටයුත්ත සඳහා එක්ව සිටි අයුරු ඡායාරූපයේ දැක්වේ. (ඡායාරූපය බෙලිහුල්ඔය ප්‍රින්ස් රත්නායක)

## අලුත් අවුරුදු නැගම් යැමත් සීමාකරයි

10 පිටුව බලන්න

## ගම සමග පිළිසඳර උතුරේ පළමුවැන්න අද වව්නියාවේ

## රිය අනතුරුවලින් එක් දිනකදී 12 ක් මරුට

## හිඟමනේ යන අම්මා බාරගන්න පොලිසියට නොආ පුතාට නඩු

## දඹුල්ලෙන් ඇල්ලූ පොල්තෙල් කන්ටේනරයටත් ගබඩාවටත් සීල්

10 වැනි පිටුව බලන්න



## පල්ලිවලට මහ සිකුරාදා දැඩි ආරක්ෂාව...

මහ සිකුරාදා දිනය ඊයේ (2) ට යෙදී තිබූ අතර ඒ වෙනුවෙන් දිවයිනේ සියලුම කතෝලික දේවස්ථානවලට විශේෂ ආරක්ෂාවක් යොදවා තිබිණි. ප්‍රධාන දේව මෙහෙය මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරුතුමන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ, කොටහේන ශාන්ත ලුසියා ආසන දෙව්මැදුරේ දී ඊයේ (2) පස්වරුවේ පැවැති අවස්ථාවේ එම දේවස්ථානයට යුද හමුදා ආරක්ෂාව යොදවා තිබූ අයුරු. (ඡායාරූපය ළහිරු හර්ෂණ)

## මිනිස්කමේ විස්කමක්

## කොරෝනා රෝබිය නොතකා ශුද්ධි මල්ලීට උපස්ථාන කරන අයියා

10 වැනි පිටුව බලන්න

## නැකැත් සීට්ටුව බෙදහැරීම අද

(ඩයනා උදයංගනී)

නව අවුරුදු නැකැත් චාරිත්‍ර ඇතුළත් නැකැත් සීට්ටුවක් ජනතාව වෙත ලබා දීමට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කටයුතු යොදා ඇති අතර එය බෙදාහැරීමේ කටයුතු අද (03) පෙරවරු 7.57 ට යෙදෙන සුබ මොහොතින් දිවයින පුරා ආරම්භ කිරීමට නියමිතය.

6 වැනි පිටුවට

පංකජ රුවින්ද්‍රගේ

සරදම



පිළිකාකාරක පොල් තෙල් ආවා, පරිප්පු ආවා. තව?

කොයිවෙලේ හරි විදුලි පුටුවත් එයි!


කලා පොළ



පළමු POP-UP සල්පිල

අප්‍රේල් 10

පෙ.ව. 8 සිට ප.ව. 8 දක්වා

විශේෂාංග
- ජ්‍යෙෂ්ඨ කලා පොළ කලාකරුවන් 25 ක්
- පෝට්රේට් සිතුවම් ඇඳීම
- ආහාර පාන සහ විනෝදාස්වාද අංග

ආකේඩ් නිදහස් චතුරශ්‍රය, කොළඹ 07

ඇතුල්වීම නොමිලේ

සංවිධානය: ජෝර්ජ් කීට් පදනම

අනුග්‍රහය: John Keells Group, JOHN KEELLS FOUNDATION


## පුත්තලම පාඩිගල රජයේ ඉඩමක නීති විරෝධීව කැණීම් කරලා

### වැලි ව්‍යාපාරිකයෙක්-බැකෝ ක්‍රියාකරුවෙක් දැලේ

(ආණමඩුව හිරාන් ප්‍රියංකර ජයසිංහ)

පුත්තලම සෙල්ලකන්දල් මානවේරිය පාඩිගල ප්‍රදේශයේ රජයට අයත් ඉඩමක නීති විරෝධි ලෙස කැණීම් කිරීමක් සම්බන්ධව වැලි ව්‍යාපාරිකයකු හා බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවකු බැකෝ යන්ත්‍රයක් ද සමග ඊයේ (02) අත්අඩංගුවට ගත් බව පුත්තලම පොලිසිය කියයි.

6 වැනි පිටුවට

## බසයක් එනතුරු පාරේ සිටින වයසක කතුන් යතුරු පැදියේ නංවාගෙන මාල කඩයි

10 වැනි පිටුව බලන්න

## චීන එන්නත චීනුන්ට අනිද්දා

| ශනිදා වාසනාව | වාසනා සම්පත | අද කෝටිපති | ලග්න වාසනාව | ජාතික සම්පත | මහජන සම්පත | සංවර්ධන වාසනාව | කෝටිපති කප්රුක | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|
| 3571 වැනි වාරය | 1672 වැනි වාරය | 1241 වැනි වාරය | 3122 වැනි වාරය | 1105 වැනි වාරය | 4438 වැනි වාරය | 423 වැනි වාරය | 710 වැනි වාරය | 30 වැනි වාරය |
| අප්‍රේල්: 02 වැනිදා | මාර්තු : 22 වැනිදා | අප්‍රේල්: 02 වැනිදා | අප්‍රේල්: 02 වැනිදා | මාර්තු : 17 වැනිදා | මාර්තු 26 වැනිදා | අප්‍රේල්: 01 වැනිදා | අප්‍රේල්: 02 වැනිදා | මාර්තු: 14 වැනිදා |
| ඉංග්‍රීසි අකුර - N | ඉංග්‍රීසි අකුර - M | ඉංග්‍රීසි අකුර - E | ලග්නය: තුලා | ජයග්‍රාහී ලග්නය - වෘෂභ | ඉංග්‍රීසි අකුර - G | දෛව අංකය - 07 ඉංග්‍රීසි අකුර - H | ඉංග්‍රීසි අකුර - R | ඉංග්‍රීසි අකුර - M |
| 30-44-57-58 | 02-58-62-84 | 29-42-60-77 | 07-41-52-55 | 5-0-8-1-3-5 | 1-7-3-5-7-8 | 29-33-44 | 06-22-39-56 | 30-53-56-83 |

| සුපර් බෝල් | ජයෝදා | සුපිරි වාසනා | සසිරි | මෙගා පවර් | සෙවණ | ධන නිධානය | ගොවිසෙත | සම්පත ලග්න වරම |
|---|---|---|---|---|---|---|---|---|
| 1415 වැනි වාරය | 1746 වැනි වාරය | 1586 වැනි වාරය | 065 වැනි වාරය | 800 වැනි වාරය | 320 වැනි වාරය | 475 වැනි වාරය | 2733 වැනි වාරය | 01 වැනි වාරය පෙබ: 25 |
| අප්‍රේල්: 02 වැනිදා | මාර්තු: 31 වැනිදා | මාර්තු 26 වැනිදා | මාර්තු: 31 වැනිදා | මාර්තු 26 වැනිදා | මාර්තු: 07 වැනිදා | මාර්තු 26 වැනිදා | මාර්තු 26 වැනිදා | E-9-4-9-4-6-8 |
| ඉංග්‍රීසි අකුර - H | ඉංග්‍රීසි අකුර - B | සුපිරි අංකය - 13 | | සුපිරි අංකය: 16 ඉංග්‍රීසි අකුර - A | ඉංග්‍රීසි අකුර- F | ජයග්‍රාහී අක්ෂරය - L | ඉංග්‍රීසි අකුර- D | ලග්න වරම කටක |
| 03-18-30-77 | 18-47-53-69 | 03-21-31-52 | 02-05-31 | 31-39-77-78 | 31-46-51-61 | 49-61-73-75 | 08-16-44-61 | 42-64-76 |

# පාර දෙපැත්තේ පවුල් දෙකක හබය ජීවිතයක් බිලිගනී

## පාර පැන්න තරුණිය ලොරියට යටවී නසී

**(අවිස්සාවේල්ල විශේෂ සෝමසිරි හිඟුරලආරච්චි)**

**අවිස්සාවේල්ල තල්දුව පාර දෙපැත්තේ ගෙවල් දෙකක් අතර ඇතිවූ රණ්ඩුවක දී එක් ගෙදරක තරුණියක 1 වැනිදා රාත්‍රියේ 11.00ට පමණ හදිසියේ කලබලයෙන් පාර මාරු වෙමින් සිටිය දී ලොරියක ගැටී එතැනම මියගිය බව අවිස්සාවේල්ල මූලස්ථාන පොලිසිය පවසයි.**

මෙලෙස මියගියේ අවිස්සාවේල්ල තල්දුව අංක 466 නිවසේ පදිංචි ගම්ලක්ෂගේ සජිනි කෞශල්‍යා නමැති 20 හැවිරිදි තරුණියකි.

අවිස්සාවේල්ල කෑගල්ල ප්‍රධාන මාර්ගයේ තල්දුවේ දී මෙම අනතුර සිදුවී තරුණිය මියගොස් ඇති බවත් දෙහිඕවිට දෙස සිට අවිස්සාවේල්ල දෙසට මේ අවස්ථාවේ ලොරිය ගමන් කර ඇති බවත් ලොරිය සහ රියදුරු පොලිස් අත්අඩංගුවට ගත් බවත් අවිස්සාවේල්ල පොලිසිය පවසයි.

මියගිය තරුණියගේ සිරුර අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

මරණ පරීක්ෂණය අවිස්සාවේල්ල නාගරික හදිසි මරණ පරීක්ෂක එම්.ජී.සී.ආර්. ජයවර්ධන මහතා ඉදිරියේ පැවැත්වීමට නියමිතය.

අවිස්සාවේල්ල මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වික්‍රම් වීරසේකර මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

## හොරට හැදූ රියැදුරු බලපතින් යතුරු පැදිය පැද අත්අඩංගුවට

**(පානදුර සුමිත් ප්‍රේමතිලක)**

**වසර තුනකට ආසන්න කාලයක් ව්‍යාජ රියැදුරු බලපත්‍රයක් භාවිතා කළ බව කියන පුද්ගලයකු පෙරේදා (01) රාත්‍රියේ අත්අඩංගුවට ගත් බව පානදුර කොට්ඨාස රථවාහන ඒකකය කියයි.**

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ පානදුර, පින්වත්ත ප්‍රදේශයේ පදිංචි 46 හැවිරිදි පුද්ගලයකු බව පොලීසිය කියයි.

එදින රාත්‍රී 9.20 ට පමණ පානදුර, නල්ලුරුව ප්‍රදේශයේ වාහන පරීක්ෂා කිරීමේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන් පානදුර දෙසින් පැමිණි යතුරුපැදියක් නවතා පරීක්ෂා කර තිබේ.

වේරහැර මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රය ලබාගෙන ඇති බවට සැකකරු මුලින් ප්‍රකාශ ලබා දී ඇතත්, ඇස් පෙනීමේ දුර්වලතාවයක් හේතුවෙන් ව්‍යාජ ලෙස සකසන ලද බලපත්‍රයක් බව තහවුරු කර ගැනීමෙන් පසු සැකකරු අත්අඩංගුවට ගෙන යතුරුපැදිය ද පොලිස් භාරයට ගෙන තිබේ.

සැකකරු පානදුර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතයි.

පානදුර කොට්ඨාස පොලිස් අධිකාරී අධිකාරි සමන්ත වෙදගේ, ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රෝහණ ජයසිංහ යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි සැරයන් ජීවක සුදර්ශන (51878) සහ කොස්තාපල් සමිත් අංජන (94072) නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

## බස්වලට නැග මාලකඩන කල්ලියක කාන්තාවෝ තිදෙනෙක් මාට්ටු

**(හලාවත ඔගස්ටින් ප්‍රනාන්දු)**

**බස් රථවල නැග ගමන් බිමන් යන කාන්තාවන් කර පැළඳි රන් මාල කඩන කාන්තා කල්ලියක තිදෙනකු එසේ කඩා ගත් රන් මාලයක් සමග පෙරේදා ( 1දා ) හලාවත කුරුණෑගල අතර ධාවනය වූ බස් රථයක දී අත් අඩංගුවට ගත් බව හලාවත කොට්ඨාස බුද්ධි විමර්ශන ඒකකය කියයි.**

එම ඒකකයේ සැරයන් කළුබෝවිල මහතා (51745) වෙත හදිසියේ පෙරේදා (1දා) ලද දුරකතන ඇමතුමක් අනුව වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් කණ්ඩායම හලාවත සිට කුරුණෑගල බලා ධාවනය වූ බස් රථයක් මල්වත්ත ප්‍රදේශයේ දී නවතා සිදු කළ පරීක්ෂණයක දී මෙම අත්අඩංගුවට ගැනීම සිදු කළ බව කියයි.

සැකකාරියන් තිදෙනා වයස අවුරුදු 30 ත් 35ත් අතර පසුවන්නියන් වූ අතර ඔවුන් සරණාගතයින් ලෙස අවතැන් වී මන්නාරමේ සිට පුත්තලම වෙප්පමඩුව ප්‍රදේශයේ පදිංචියට පැමිණි පවුල්වල සාමාජිකාවන් බවට හඳුනාගෙන ඇති බවත් කියයි.

සැකකාරියන් තිදෙනා මගීන්ගෙන් පිරුණ බසයට ගොඩවී තදබදයෙන් යුතුව ගමන් ගත් මුගුණුවටවන පදිංචි හේමලතා සූරියආරච්චි මහත්මිය කර පැළඳ සිටි පවුම් දෙකක් බරැති රන් මාලය ඇයට නොදැනෙන ලෙසින් ගලවා ගෙන තිබූ බවත් ඔවුන්ගේ මෙම ක්‍රියාව බසයේ ගිය වෙනත් මගියකු දැක පොලිසියට දන්වා තිබූ බවත් කියයි.

සැකකාරියන් මේ අයුරින් බස් රථවල ගමන් ගන්නා කාන්තාවන් කර පැළඳ සිටින රන්මාල කොල්ලකන කල්ලියක සාමාජිකාවන් බවටත් හඳුනාගෙන ඇති බවත් කියයි.

සැකකාරියන් නඩු කටයුතු සඳහා හලාවත පොලිසියට බාර දී ඇත.

හලාවත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් රෝහණ ගමගේ, සහකාර පොලිස් අධිකාරි විජේවර්ධන, මූලස්ථාන පොලිස් පරීක්ෂක එදිරිසිංහ මහත්වරුන්ගේ උපදෙස් මත කොට්ඨාස බුද්ධි විමර්ශන ඒකකයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක වික්‍රමසිංහ, සැරයන්වරුන් වන කළුබෝවිල 51745, නිහාල් 6781, නිශාන්ත 41398, කරුණාතිලක 52391, කොස්තාපල් ජගත් 41421 යන මහත්වරුන් මෙම අත් අඩංගුවට ගැනීම සිදු කර ඇත.

## සූර්වී සද්දෙ දාගෙන යතුරු පැදියේ ගිය තරුණයෝ තිදෙනා අත්අඩංගුවට

**(හක්මණ විශේෂ - දෙනගම යසන්ත ආරියසේන)**

**බීමතින් යතුරුපැදියක නැගී මහජනයාට පීඩාවක් ඇතිවන පරිදි අප්‍රසන්න ලෙස ශබ්ද නගමින් හක්මන නගරයේ ගමන්කරමින් සිටි තරුණයන් තිදෙනකු ඉකුත් තිස් එක් වැනි දින අත්අඩංගුවට ගත් බව හක්මන පොලීසිය පවසයි.**

තරුණයන් තිදෙනා යතුරුපැදියක නැගී අප්‍රසන්න ලෙස ශබ්ද නගමින් ගමන්කරමින් සිටියදි පොලිස් නිලධාරීන් යතුරුපැදිය නතර කිරීමට අණකර ඇති අතර යතුරුපැදිය නතර කළ විගස එක් තරුණයකු පලාගොස් ඇති අතර අනෙක් තරුණයින් දෙදෙනා පරීක්ෂා කිරීමේදී දෙදෙනාම මත්පැන් පානය කර ඇති බව අනාවරණය වූ බව පොලිසිය පැවසීය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා පොලිසිය වෙත රැගෙන ගොස් වැඩිදුර විමර්ශන කරන අවස්ථාවේදී එක් සැකකරුවකු කළහකාරි ලෙස හැසිරෙමින් නිලධාරීන්ට සාපරාධි බලහත්කාරය පෑම සිදුකළ බවත් පලාගිය සැකකරු වැඩිදුර විමර්ශන සිදුකළ අතර ඔහු නගරයේ මත්පැන් පානය කරමින් සිටිය දී අත්අඩංගුවට ගත් බව පොලිසිය කියයි.

අත්අඩංගුවට ගත් බෙරුවේවෙල ප්‍රදේශයේ පදිංචි විසිපහ, තිස්හත, සහ තිස්අට හැවිරිදි සැකකරුවන් තිදෙනා ඉකුත් පළමු වැනි දින දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බව පොලිසිය කියයි.

හක්මන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.පී.ඒ. සනත් කුමාර මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් පරීක්ෂක ආර්. ප්‍රේමතිලක, පොලිස් සැරයන් 64035 රංජිත්, පොලිස් කොස්තාපල්වරුන් වන75823 සම්පත්, 73057 චන්දන යන මහත්වරු සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සිදුකළහ.

## පොලිසියට පැමිණිල්ලක් කරමින් සිටි පස් දරු පියා හෘදයාබාධයකින් මරුට

**(වලස්ගල - නිමල් ලන්දගේ)**

**දික්වැල්ල පොලිසියේ විවිධ පැමිණිලි අංශයට පැමිණිල්ලක් කරමින් සිටි පුද්ගලයකු, හෘදයාබාධයකට ලක්වීමත් සමඟ 1990 සුවසැරිය ගිලන් රථයකින් වහා දික්වැල්ල රජයේ රෝහලට ඇතුළත් කිරීමට කටයුතු කළත් ඒ වනවිටත් මියගොස් සිටි බව දික්වැල්ල පොලිසිය පවසයි.**

මෙසේ මියගොස් ඇත්තේ දික්වැල්ල, යෝනකපුර නයිගලේ පදිංචි අබ්දුල් ජලීල් අබ්දුල් නමැති 56 හැවිරිදි පස්දරු පියෙකි.

අබලි යකඩ එකතු කිරීමේ කටයුතුවලදී වෙනත් පාර්ශවයක් සමග ඇති වූ ආරවුලක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට මොහු පොලිසියට පැමිණ තිබේ.

මළසිරුර පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය පෙරේදා (01) මාතර රෝහලේ මෘතශරීරාගාරයේදී, මාතර අධිකරණ වෛද්‍ය නිලධාරි සුමිත් අබේපිටිය මහතා විසින් සිදුකළ අතර එහිදි ලබාගත් නිගමනය පරිදි එම මරණය හදිසි හෘදයාබාධයක් නිසා සිදුවූ මරණයක් බවට තීන්දු කළ බව දික්වැල්ල වැඩ බලන හදිසි මරණ පරීක්ෂක ජයන්ත සමරසිංහ මහතා පැවසීය.

මෙම තැනැත්තාට කලක සිට හෘදයාබාධ රෝග ලක්ෂණ තිබී ඇතත් ඒ පිළිබඳව සැලකිලිමත් වී නොමැති බව මරණ පරීක්ෂණයේදි හෙළි වී ඇත.

දික්වැල්ල වැඩ බලන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අලවත්ත මහතාගේ උපදෙස් පරිදි විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුදත් චන්ද්‍රකුමාර මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන් (47427) චන්දික, ( 45071) මනම්පේරි යන නිලධාරීහු පරීක්ෂණ පැවැත්වූහ.

## ඉරෙක්කණ්ඩියේ ගෙදරක ජෙලග්නයිට් කූරු 82 ක්

### සඟවා තබාගෙන සිටි සැකකරු අත්අඩංගුවට

**(ත්‍රිකුණාමලය අමදෝරු අමරජීව)**

**කුච්චවේලි පොලිස් වසමට අයත් ඉරෙක්කණ්ඩි ප්‍රදේශයේ නිවෙසක සඟවා තිබූ ජෙලග්නයිට් කූරු 82ක් සමග පුද්ගලයකු පෙරේදා (01) පස්වරුවේ අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් විය.**

නාවික හමුදාවෙන් ලබාදුන් බුද්ධි තොරතුරකට අනුව ක්‍රියාත්මක වූ කුච්චවේලි පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනක විතානගේ මහතාගේ මෙහෙයවීම මත උප පොලිස් පරීක්ෂක ඉලංගසිංහ, පොලිස් කොස්තාපල් (92601) මේනක යන මහත්වරු මෙම වැටලීම සිදුකර සැකකරු අත්අඩංගුවට ගත්හ.


සැකකරු මෙම පුපුරණ ද්‍රව්‍ය මසුන් මැරීම සඳහා භාවිත කිරීමට සඟවා තබාගෙන ඇති අතර මොහු ධීවර කාර්මිකයකු බවද පොලිසිය කියයි.

සැකකරු ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනක විතානගේ මහතාගේ ප්‍රධානත්වයෙන් වැඩිදුර පරීක්ෂණ ක්‍රියාත්මකයි.



ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනක විතානගේ මහතා ඇතුළු නිලධාරීන් ජෙලග්නයිට් පරීක්ෂා කරද්දී.

## තිස්ස හේවාවිතාරණගේ හිනා වැස්ස



## විනෝදකාරඩිය

**වීරයෙක් වගේ සෘතුවක් ලු. වැඩ කෙලින් යැයි නිතර දොඩනවලු. ඒ වුණාට වටේටම කැරකෙන බව කාටත් පේනව ලු. වටේ ගිය වැඩේක කඩදාසිය හොයන්න දැන් පිරික්සුමක් කරන්නටත් ඕන කියනව ලු. පොල් පරාල දෙස බලාගෙන කෙන්දක් නොසොයා වැඩේ හරියට කළොත් මීට වඩා හොඳ ලු. නැත්තං ආයෙත් වරක් හිස දන් දුන් පෙදෙසේදී වගේ බව් බව් කියන්න වෙයිද නොදනී ලු.**


**(පුෂ්පකුමාර මල්ලවආරච්චි)**

## පැළ වෙළෙන්දාගේ බොරු හිතවත්කම ගිනිගෙඩියක් වෙලා

**(වියලුව වාර්තාකරු)**

**ගෙයින් ගෙට ගොස් එළවළු සහ පලතුරු පැළ වෙළෙඳාමේ නියුතු වයෝවෘද්ධ පුද්ගලයකු පවුලක් අවුල් කළ බව කියැවෙන කතා පුවතකි.**

**සිද්ධිය මෙසේය. ඔහු විශ්‍රාමිකයෙකි.**



එළවළු හා පලතුරු පැළ තවානක් ආරම්භ කළේ විශ්‍රාම වැටුපෙන් පමණක් ජීවත්වීමට නොහැකිවූ නිසාවෙනි.

පැළ අලෙවිය වර්ධනය කර ගන්නට සිතූ ඔහු කුඩා ටිපර් රථයක් ද මිලදී ගත්තේ ගෙන් ගෙට ගොස් මෙන්ම සතිපොළවලට ද ගොස් පැළ අලෙවි කිරීමෙන් තවත් අමතර මුදලක් සොයා ගන්නට හැකිවූ බැවිනි.

කතාවේ දක්ෂයකු වූ හෙතෙම ඕනෑම නිවසකට ගොඩවූ සැනින් එම නිවැසියන් දන්නා හඳුනන පුද්ගලයින් බවට ඒත්තු ගන්වා බොරු හිතවත්කමක් මවාගෙන පැළ දෙක තුනක් හෝ ඔවුන්ගේ ඇගේ ගැසීමට ඔහු තුළ වූයේ අපූරු හැකියාවකි.

පසුගිය දිනක තම ලොරි රථයෙන් පැමිණි ඔහු ප්‍රදේශයේ නිවසකට ගොඩවූවේ තමුන් සතුව ඇති පැළ කීපයක් එම නිවැසියන්ට අලෙවි කරන්නටය.

ගෙහිමියා දුටු හෙතෙම එක්වරම ''ආ මහත්තයා එද මහත්තයයි නෝනයි ගිහින් ගෙනාව පැළ ටික හොඳට තියෙනවා දැයි'' ගෙහිමි කාන්තාවද ඉදිරියේ විමසා සිටියේ ඔවුන් පෙර සිටම දන්නා හඳුනන බව පෙන්වීම සඳහාය.

එහෙත් එවැනි මතකයක් ගෙහිමි කාන්තාවට මෙන්ම සැමියාටද නොතිබුණත් වෙළෙන්දගේ කතාව වැරදි කොනෙන් අල්ලාගත් ගෙහිමි කාන්තාව වෙළෙන්දගෙන් මෙන්ම සැමියාගෙන්ද දිගින් දිගටම ප්‍රශ්න කරන්නට වූවේ ඇගේ සැමියාට යන එන මං අහිමි කරමිනි.

''මම එක්ක ගිය ගෑනියෙකුත් නැහැ. මම ගෙනාපු පැළේකුත් නැහැ. මේ මනුස්සයගෙ තවාන තියෙන තැන මම දන්නෙත් නැහැ. මේකගේ ඔලුව හොඳ නැද්ද කොහෙද'' යැයි කියමින් ගෙහිමි පුද්ගලයා තම බිරිය ඉදිරියේ නිදෙස් වන්නට කොතෙක් උත්සාහ කළ ද ඉන් පලක් අත් නොවිණි.

තම කතාවෙන් නිවසේ දෙන්නා දෙමහල්ලෝ ඇවිළී ගිය බව දැනගත් පැළ වෙළෙන්දා ''අනේ නෝන මහත්තයෝ මගේ ඇස් හරියට පේන්නෙ නෑ මට පොඩි වැරදීමක් වුණේ. මේ මහත්තයා නෙවෙයි ඒ වෙන කෙනෙක් වෙන්න ඇති'' යැයි කොතෙකුත් කියා සිටියද එය පිළිගන්නට මැලි වූ ගෙහිමි කාන්තාව දිගින් දිගටම සැමියාට බැණ වදින්නට වූයේ සතුටින් සාමයෙන් පිරී ගිය ඔවුන්ගේ කැදැල්ල දෙදරායාමේ ආරම්භක වෙඩිමුරය දල්වමිනි.



# පරිසර අලුත් ඒකකය ඉදිරි පියවරක්

පරිසරය සම්බන්ධයෙන් මේ දවස්වල ඇසෙන්නේම අවර ගණයේ කතාය. කැලෑ කැපීම්, සිංහරාජය ආසන්න ප්‍රදේශවල පරිසරයට හානිකර ඉදිකිරීම්, කඩොලාන පරිසර පද්ධති විනාශකර දැමීම්, කුඹුක් ගස් කපා දැමීම් මේ අතරින් ප්‍රධාන ධාරාවේ මාධ්‍යවල පමණක් නොව සමාජ මාධ්‍ය ජාලවල ද අවධානය දිනාගත් මාතෘකා අතර විය. මේ විවේචන සහ වාර්තා කිරීම් පිළිබඳව පරිසරය භාර අමාත්‍ය මහින්ද අමරවීර මහතා ප්‍රකාශකර තිබුණේ මේ ගැන සොයාබැලීමට කටයුතු කරන නමුත් බොහොමයක් වාර්තා රජය අපහසුතාවට පත් කිරීම සඳහා සංවිධානාත්මකව සිදුකෙරෙන අසත්‍ය සිදුවීම් පදනම් කරගත් ඒවා බවය.

එය එසේ වුවද පරිසර විනාශය සම්බන්ධයෙන් කඩිනමින් සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම සඳහා නව ඒකකයක් පිහිටුවීමට රජය පියවර ගෙන තිබේ. පරිසර අමාත්‍යාංශ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව මගින් ගනු ලැබූ තීරණයකට අනුව පිහිටුවනු ලබන නව ඒකකයට මාධ්‍ය ඒකකයක් ද අනුයුක්ත කිරීමට තීරණය වී තිබේ. පරිසරය සම්බන්ධයෙන් රටේ අසත්‍ය ප්‍රවෘත්ති සංසරණය වැළැක්වීමත් පරිසරය හා බැඳෙන වැදගත් ප්‍රවෘත්ති කෙරෙහි වැඩි අවධානය යොමු කිරීමත් නව ඒකකය මගින් අරමුණු කරගෙන තිබේ.

පරිසර විනාශය සම්බන්ධයෙන් රජය දැඩි පරික්ෂාවකින් සිටින බව මේ තීන්දුවෙන් පැහැදිලි වෙයි. පරිසර, වනජීවී, වනසංරක්ෂණ, මහජන ආරක්ෂාව ඇතුළු අමාත්‍යාංශ ද මධ්‍යම පරිසර අධිකාරිය වැනි රාජ්‍ය ආයතනවල ඉහළ නිලධාරීන් ද එම අලුත් පරිසර ඒකකයට ඇතුළු කිරීමට තීරණය කිරීම ද යහපත් පියවරකි. එහෙත් මෙම ඒකකයේ අරමුණ විය යුත්තේ පරිසර විනාශය පිළිබඳ සත්‍ය තොරතුරු හෙළිදරව් කරමින් නීත්‍යානුකූලව කටයුතු කරන පරිසර සංවිධානවලට පාඩමක් ඉගැන්වීම නොවන බව ද පෙන්වාදීමට කැමැත්තෙමු. අලුත් ඒකකයට රටේ පිළිගත් පරිසර සංවිධානවල වගකිවයුතු නිලධාරීන් කිහිප දෙනකුගේ හෝ සහාය ලබාගත හැකි ක්‍රමවේදයක් සැකසිය හැකි නම් එය එහි පරමාර්ථ වඩාත් කුළුගන්වනු ඇතැයි අපගේ වැටහීමය.

නව පරිසර ඒකකයට සහාය වීම සඳහා පිහිටුවනු ලබන මාධ්‍ය ඒකකයට තාක්ෂණික දැනුමින් පිරිපුන් පිරිසක් ද සම්බන්ධ කරගත හැකි නම් එය වඩාත් ඵලදායී වනු ඇති බව ද අපි අදහස් කරමු. එය රජයට සුදු හුණු ගාන හුදු මාධ්‍ය ප්‍රචාරක ආයතනයක් නොවිය යුතුය. පරිසරය පිළිබඳ අසත්‍ය තොරතුරු සහ ව්‍යාජ ඡායාරූප මුදහරින පුද්ගලයන් සහ කණ්ඩායම් සිටී නම් ඔවුන් පිළිබඳ තොරතුරු සොයාබැලීම මෙන්ම සැබෑ කැලෑ පාළුවන්ගේ වතගොත හෙළිකරන ඒකකයක් වශයෙන් ද නව මාධ්‍ය ඒකකය ක්‍රියාත්මක වීම අවශ්‍යය. ප්‍රධාන අරමුණ වන පරිසරය රැක ගැනීමට සත්‍ය ලෙසම දයක විය හැක්කේ එවැනි නවමං ඔස්සේ ක්‍රියාත්මක වන ඒකකයකින් පමණි.

පරිසරය වැනසීමට කැලෑ කැපීම ප්‍රධාන හේතුවක් වුවද ඊට හේතුවන තවත් කාරණා ද බොහෝමයකි. ජල මූලාශ්‍ර අපවිත්‍ර කිරීම, ගංගාවලට හානිදයක ලෙසට වැලි ගොඩදැමීම, කැළි කසළ අවිධිමත් ලෙස මුදහැරීම, යෝගට් කෝප්පයේ පටන් ප්ලාස්ටික් ඇතුළු නොදිරන භාණ්ඩ පරිහරණයෙන් පසුව විද්‍යානුකූල ලෙස බැහැර නොකිරීම, විස සහිත දුමාරය වාතලයට එකතු කරන කම්හල්, මුහුද සහ ආසන්න ප්‍රදේශ අපවිත්‍ර කිරීම ඒ අතුරින් කිහිපයක් පමණි. පරිසරය වනසන මේ සියලු හේතු පිළිබඳ විධිමත් ලෙස ගවේෂණය කිරීමත් ඊට වගකිවයුතු පුද්ගලයන් නීතියේ රැහැනට හසුකර ගැනීමත් නව ඒකකයට පැවරෙන වගකීමක් වනු ඇත. පරිසර සංහාර පිටුපස සිටින සංවිධානාත්මක පිරිස හඳුනා ගැනීමට එය මෙවලමක් කරගත හැකිය.

පරිසරයට මහා පරිමාණ මට්ටමින් හානිදයක ලෙස කටයුතු කරන බලවත් පුද්ගලයන්ට දේශපාලන අධිකාරියේ සහාය ලැබීම මේ ගැටලුවේ සංකීර්ණ බව ඉහළටම ඔසවා තිබේ. සංචාරක හෝටල් සහ වැව් තාවුලු සහ ගංගා පෝෂණ ප්‍රදේශ මත නවාතැන් පොළවල් ඉදිකිරීම හැම ව්‍යාපාරිකයකුටම කළ නොහැක. හිතුමතේ වැලි ගොඩදැමීම් සම්බන්ධයෙන් ද කිව යුත්තේ එයමය. මේ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී දේශපාලන අධිකාරියේ සහාය ගැනීම බලවත් පුද්ගලයන්ගේ සිරිත වී තිබේ. සංවර්ධනයේ නාමයෙන් පරිසර හානි සිදුවීමට මග පෑදෙන්නේ ඒ ආකාරයෙනි.

පරිසර අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ නව ඒකකයක් පිහිටුවීමේ තීරණය ඉතා යහපත් ප්‍රවේශයක් බව කියන අතරම ඉහත සඳහන් කාරණා කෙරෙහි අවධානය යොමු කිරීම එය වඩාත් ඵලදායී ව්‍යාපෘතියක් බවට පත්කිරීමට හේතු වනු ඇතැයි පෙන්වාදීමට ද කැමැත්තෙමු.

ලංකාදීප
2021 අප්‍රේල් මස 3 වැනිදා සෙනසුරාදා
අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත
වෙබ් අඩවි--: වෙබ්.ලංකාදීප.ලංකා- www.lankadeepa.lk
කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237 ෆැක්ස් : 2438039, 2479240, 5383240 බෙදාහැරීම් : 2479625 ෆැක්ස් : 2479650
දැන්වීම් :2479540, 5383383, 5330330, ෆැක්ස් : 2314864, 2479595

## සති අග විග්‍රහය

# ජ.වි.පෙට ජනතාව නොවැටහීම

**ජනතා විමුක්ති පෙරමුණ විසින් ලෝකයේ පළමු අගමැතිනිය වූ සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ ආණ්ඩුවට එරෙහිව ක්‍රියාත්මක කරන ලද පළමු කැරැල්ල හෙටට අඩ සියවසක් සම්පූර්ණ වේ.**

> **ජවිපෙට නුදුරු අනාගතයේදී බලයට පත්වීමට හැකිවේදැයි යන්න ඕනෑම කෙනකු තුළ මතුවන ප්‍රශ්නයයි. ජනතාව පක්ෂයක් බලයට පත් කිරීමේදී ආකර්ශණීය ප්‍රතිපත්ති මෙන්ම එම පක්ෂයට බලයට පත්වන තත්ත්වයක් තිබේදැයි යන සාධක දෙක බලපායි. ඒ කාරණා දෙකේදී ජවිපෙට ඒ ඒ කාලවල ඇති ප්‍රධාන පක්ෂ දෙක සමඟ තරග කරන්නට මෙතෙක් හැකි වී නැත. ඔවුන් දේශපාලනය වෙනුවෙන් කරන පෞද්ගලික කැපකිරීම්වලින් ජනතාවට වැඩක් නැත.**

මාක්ස්වාදය අනුව සමාජවාදී සමාජයක් ගොඩ නැඟීම අරමුණු කොට ගෙන ඇති වූ එම තරුණ නැගිටීම මාක්ස්වාදය පිළිගත් පක්ෂ දෙකක් ද හවුල් වූ එවකට පැවැති සමඟි පෙරමුණ ආණ්ඩුව විසින් දරුණු ලෙස මර්දනය කෙරිණි.

කැරැල්ලට සම්බන්ධ වූ සහ නොවූ දස දහස් ගණන් තරුණ තරුණියෝ ඝාතනය කරනු ලැබූහ. තවත් ඒ හා සමාන පිරිසක් අත්අඩංගුවට ගෙන හෝ රජයට භාරවීමෙන් පසු සිරගත කරනු ලැබූහ. මාර්ග අයිනේත් ගංගාවල පාවෙමිනුත් මළ සිරුරු දක්නට ලැබිණි. ''ටයර් සෑය'' යන වචනය මෙරට දේශපාලන ශබ්ද කෝෂයට එකතු වූයේ එම කැරැල්ල සමයේදීය. ඒ අත්අඩංගුවට ගන්නා ලද ඇතැම් තරුණ තරුණියන් ඝාතනය කරනු ලැබ හෝ පණපිටින් ටයර් දමා පුළුස්සා දමනු ලැබූ බවට වාර්තා වූ හෙයිනි.

ඉන් වසර හතරකට පමණ පසු ආරම්භ වී දශක තුනක් තිස්සේ ප්‍රධාන වශයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල ආරක්ෂක හමුදා හා කොටි සංවිධානය අතර කෙරුණු යුද්ධය හා සමඟ සසඳන කල 71 කැරැල්ල කුඩා ළමයින්ගේ හිතුවක්කාරකමක් වැනිය. කැරැලිකරුවෝ තමන්ම නිෂ්පාදනය කරගත් අතිශයින් අනතුරුදායක වූ අත්බෝම්බ හා සොරකම් කරන ලද තුවක්කු ඉතා සුළු සංඛ්‍යාවකින් සන්නද්ධව සිටි අතර ඔවුන් මර්දනය කිරීම එවකට සාපේක්ෂ වශයෙන් කුඩා වූ පොලීසියට හා ත්‍රිවිධ හමුදාවනට වුවද එතරම් දුෂ්කර වූයේ නැත.

ඇතැම් පොලිස් ස්ථාන අල්ලා ගැනීමටත් ඇතැම් ප්‍රදේශ දින කිහිපයකට පාලනය කිරීමටත් කැරැලිකරුන්ට හැකිවූ නමුත් ක්‍රමවත් අවි පුහුණුවකින් හා අඛණ්ඩ අවි සැපයුම් මාර්ගයකින් තොරව ඉතා පහසුවෙන් ආරක්ෂක හමුදා තමන්ට යටත්වනු ඇතැයි යන පදනමකින් තොර විශ්වාසයකින් යුතුව ක්‍රියා කළ ඔවුනට ආරක්ෂක හමුදාවන්ගේ අඛණ්ඩ සුළු අවි ප්‍රහාරවලට හෝ මුහුණ දී ගත නොහැකි විය. සති දෙක තුනකින් කැරැල්ල මර්දනය කෙරිණි. සුළු පිරිසක් වන ගතවී මාස ගණනාවක් සිටියේ වුවද ඒ යළි කැරැලි ගැසීමේ අරමුණෙන් නොව ආත්මාරක්ෂාව සඳහා පමණි.

කෙසේ වෙතත් 1971 අප්‍රේල් කැරැල්ල පසුගිය සියවසේ මෙරට දේශපාලනයේ සිදුවූ වැදගත් සිදුවීම්වලින් ප්‍රධාන එකකි. කැරැල්ල පරාජය වුව ද එය මෙරට දේශපාලනයට කළ බලපෑම සැලකිය යුතු තරම්ය. කැරැල්ලට නායකත්වය දුන් ජනතා විමුක්ති පෙරමුණ කිසිදු බලයකට පත් නොවුව ද මෙරට දේශපාලනයේ ප්‍රධාන අංගයකි.

එහෙත් කැරැල්ලට පනස් වසරක් ගතවන හෙට දිනයේ දී එහි උරුමය කියා ගන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණක් නොවේ. ජවිපෙන් කැඩීගිය පිරිස් හා ජවිපෙන් කාලයත් සමග හැළී ගිය පිරිස්ද කැරැල්ලත් කැරලිකරුවන්ගේ පරිත්‍යාගයනුත් සැමරීමට වෙන වෙනම සැරසී සිටිති. අවසානයට ජවිපෙන් කැඩීගිය කණ්ඩායම වන පෙරටුගාමී සමාජවාදී පක්ෂය ඉන් එක් කණ්ඩායමකි.

## පක්ෂය කෑලිවලට බිඳීයාම

කලෙක ජවිපෙ තුළ කැපවීමෙන් ක්‍රියාකළ එහෙත් පසු කාලයේදි පවුල් බර දේශපාලන මතභේද හා අඛණ්ඩව තවදුරටත් කැප කිරීම් කිරීමට ඇති නොහැකියාව වැනි බොහෝ කාරණා හේතුවෙන් තනි තනිව එම පක්ෂයෙන් ඉවත් වූ හෝ ඉවත් කරනු ලැබූ පිරිසක්ද''71 සහෝදර සංසදය'' යන නමින් පසුගිය වසර කිහිපයක් තිස්සේ ''බක් මහ විරු සමරුව'' යනුවෙන් මේ වනවිට ජවිපෙ හා ඉන් ඉවත්වූවන් අතර ප්‍රචලිත සැමරුමක් පවත්වති.

මේ අතර තවත් පිරිසක් ද බක්මහ විරු සමරුව ඔස්සේ දේශපාලන ගොණුවක් ඇතිකර ගැනීමට උත්සාහ දරනු පෙනේ. ඒ ජවිපෙ නිර්මාතෘ, අභාවප්‍රාප්ත රෝහණ විජේවීර මහතාගේ පුත් උවිඳු විජේවීර හා රෝහණ විජේවීර මහතා සමඟ 1971 කැරැල්ලට පෙර සමීපව කටයුතු කළ කිහිප දෙනකුගේ පුතුන්ය.

පසුගිය දිනවල මෙම පිරිස ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය ඔස්සේ කැරැලිකරුවන්ගේ දෙවැනි පරම්පරාව සමඟ සබඳතා ඇති කර ගැනීමට කටයුතු කරනු පෙනිණි. එහෙත් ඔවුන්ගේ දේශපාලන අරමුණු පැහැදිලි නැත. ඔවුනට මෙරට දේශපාලනයට බලපෑමක් කළ හැකි වනු ඇත්ද? නැත්නම් එය හුදෙක් තම පියවරුන්ගේ කටයුතුවලින් ආස්වාදයක් ලැබීමේ ගොණුවක් ද යන්න පැහැදිලි නැත.

ජනතා විමුක්ති පෙරමුණ බිහිවූ ද සිට ඉන් බොහෝ කණ්ඩායම් කැඩීගොස් තිබේ. ඒවායින් යම් කාලයක් දේශපාලන කණ්ඩායමක් වශයෙන් පවතින්නට හැකි වී ඇත්තේ පෙරටුගාමී සමාජවාදී පක්ෂයට හා කර්මාන්ත ඇමැති විමල් වීරවංශගේ නායකත්වයෙන් 2008 වසරේ දී කැඩී ගොස් ජාතික නිදහස් පෙරමුණ ගොඩනැගූ පිරිසට පමණි. එහෙත් ජාතික නිදහස් පෙරමුණ මේ වනවිට ජවිපෙ දේශපාලනය පමණක් නොව එහි දේශපාලන සම්ප්‍රදායයන් හා ජවිපෙ ප්‍රචලිත කළ ඇවතුම් පැවතුම් පවා අත්හැර ඇති බව පෙනේ. ඔවුන් පසුගිය කාලයේ 1971 කැරැල්ල වෙනුවෙන් හෝ 1988/89 කැරැල්ල වෙනුවෙන් හෝ සැමරුම් උත්සව පැවැත්වූයේ නැත.

1848 මාතලේ කැරැල්ලෙන් පසු සාමාන්‍ය ජනතාව අතරින් පැවැති ආණ්ඩුවට එරෙහිව පැන නැගුණ පළමු ආයුධ සන්නද්ධ නැගිටීම 1971 අප්‍රේල් කැරැල්ලයි. ඊට පෙර හමුදා කුමන්ත්‍රණ වැනි රාජ්‍ය විරෝධී ප්‍රචණ්ඩ උත්සාහයන් දක්නට ලැබුණ ද ඒවා සාමාන්‍ය ජනතාව අතරින් පැන නැගුණු නැගිටීම් නොවේ.

තවත් අපූරු කරුණක්නම් නිදහසින් වසර 23කට පසු ඇතිවූ නැගිටීමක් වුවද 1971 කැරැල්ලද නිල වශයෙන් සැලකුණේ බ්‍රිතාන්‍ය කිරීටයට එරෙහිව එල්ල වූ නැගිටීමක් ලෙසය. ඒ එවකට ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පොදුරාජ්‍ය මණ්ඩලය යටතේ ඩොමීනියන් තත්ත්වයේ රාජ්‍යයක් වූ හෙයිනි. ඒ අනුව බ්‍රිතාන්‍ය මහ රැජින මෙරට මහ රැජින වූ අතර මෙරට සිටි ආණ්ඩුකාරයා රැජිනගේ නියෝජිතයා විය.

කැරැල්ල සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූවන් හට නඩු පැවරීම සඳහා අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව යනුවෙන් අලුත් කොමිෂන් සභාවක් පිහිටුවන ලදී. එහිදී ඔවුන්ගේ චෝදනා පත්‍රවල සඳහන් වූයේ ''නෛකශ්‍රීන් විරාජමාන වූ මහා රාජිනියන් වහන්සේ ගේ ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණය කිරීම හා යුද්ධ කිරීම'' යන චෝදනාවයි.

මෙය කැරැල්ලට පෙරම ජවිපෙ ජනතාව හමුවේ තැබූ ප්‍රධාන කාරණාවකි. එකල කැරැලිකරුවන් අලුතින් තම ව්‍යාපාරයට සම්බන්ධ වන්නන්හට පත්වන ලද පංති පහෙන් එකක් වූයේ '' නිදහස නව යටත් විජිත උපක්‍රමයකි.'' යන්නයි. එමඟින් කියවුණේ 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලැබූ බව පාලකයන් පැවසුවද රට සැබවින්ම තවමත් පවතින්නේ රැජිනගේ පාලනය යටතේ බවයි.

මෑත ඉතිහාසයේ ඇතිවූ පළමු ප්‍රචණ්ඩ නැගිටීම වුවා සේම 1971 කැරැල්ල මෑත ඉතිහාසයේ පළමු දරුණුතම රාජ්‍ය මර්දනය ද විය. එතෙක් උපවාස සත්‍යග්‍රහ වැනි සාමකාමී උද්ඝෝෂණවලට සීමා වී තිබූ උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ අරගලය ප්‍රචණ්ඩ මුහුණුවරක් ගන්නට ආස්වාදයක් ලබා ගත්තේ අප්‍රේල් කැරැල්ලෙන් යැයි ඇතැම් විචාරකයෝ පවසති.

මුල් කාලයේ දී දෙමළ සංවිධාන ද යොමු වී සිටියේ මාක්ස්වාදය වෙතය. ඒ අනුව මාක්ස්වාදය වෙතට යොමු වූ දකුණේ පිරිසකගේ සන්නද්ධ අරගලයකින් මාක්ස්වාදය වෙතට යොමුවූ උතුරේ පිරිසක් ආදර්ශයක් ගැනීම විය හැකි දෙයකි. මන්දයත් මාක්ස්වාදය ප්‍රචණ්ඩ දේශපාලනය මුළුමනින්ම බැහැර නොකරන හෙයිනි.

ඇතැම් විට 1988/89 ජවිපෙ දෙවැනි කැරැල්ලටද 1971 කැරැල්ලේදී තම සගයන් කළ කැප කිරීම් හා පරිත්‍යාග පෙළඹවීමක් වූවා විය හැකිය.

පසුකලීන උතුරු හා දකුණු කැරැලිවල දී මෙන්ම 1971 කැරැල්ලේදීද ආරක්ෂක හමුදා මෙන්ම කැරැලිකරුවෝද අතිශයින් කෲර වූහ. ඒ අතර කැරලිකරුවන් වෙතින් අසාමාන්‍ය කැපකිරීම් ද දක්නට ලැබිණි.

එසේම ජවිපෙ මුල සිටම මෙරට දේශපාලන සංස්කෘතියට ද විශාල බලපෑමක් කළේය. තම පරමාර්ථය වෙනුවෙන් ජවිපෙ නායකයන් හා සමාජිකයන් බහුතරයක් වෙතින් අසාමාන්‍ය වූ කැපවීමක් දක්නට ලැබිණි. තම පෞද්ගලික පල ප්‍රයෝජන නොතකා දින ගණන්, සති ගණන් හෝ ඇතැම් විට මාස ගණන් එක දිගට පක්ෂය වෙනුවෙන් වැඩ කිරීමට ඔවුහු ඉදිරිපත් වූහ.

දැනුදු පක්ෂය විසින් ගන්නා ලද තීරණයක් අනුව එහි පාර්ලිමේන්තු පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු තම වැටුපත් වාහනත් වෙනත් දීමනාත් පක්ෂ අරමුදලකට බැර කොට පක්ෂයෙන් දෙන දීමනාවකින් හා පක්ෂයේ ආධාරකරුවන්ගේ උපකාරයෙන් තම අවශ්‍යතා ඉටුකර ගනිති. ජවිපෙ දේශපාලන තීරණ කෙනකුට කොතෙක් පිළිගත නොහැකි වුවද ඔවුන් මෙරට දේශපාලන සදාචාරයට එක් කළ මෙවැනි අංග නොපිළිගැනීමට හේතුවක් නැත.

## දේශපාලනයට ජීවිතයම කැපකිරීම

දැනට වඩා පහසුකම් අතින් අතිශයින් දුෂ්කර වූ අතීතයේදීද බොහෝ ජවිපෙ සාමාජිකයෝ තමන්ගේ රැකියා හා උසස් අධ්‍යාපනය අත්හැර පූර්ණකාලීනව පක්ෂයේ කටයුතුවල නිරත වූහ.

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ඉගැන්වීම් කෙනකුට පිළිගත නොහැකි වුවද එහි සාමාජිකයන්ගේ හා ක්‍රියාකාරිකයන්ගේ මෙම කැපවීම පිටුපස තිබූ උත්තේජනය වූයේ ද ඔවුන්ගේ අධ්‍යාපන වැඩ පිළිවෙළයි. එය එදිනෙද ප්‍රශ්න පිළිබඳ සරල සාකච්ඡාවකින් පටන්ගෙන මාක්ස්වාදී දර්ශනය, ආර්ථික විද්‍යාව ආදි ගැඹුරු විෂයයන් කරා යන වැඩ පිළිවෙළක් විය.

එකල තරුණ පිරිස් සමාජවාදය වෙතට ආකර්ෂණය කර ගන්නට ජවිපෙ ඇතුළු ලෝකයේ වාමාංශික ව්‍යාපාරයට ඉතා ප්‍රබල ජාත්‍යන්තර උදහරණ තිබිණි. ඒ අතිශයින් පසුගාමී හා වැඩවසම් සමාජ ලෝක බලවතුන් බවට පත් කළ රුසියානු චීන හා කියුබානු විප්ලවය සමාජවාදය දේශනා කරන දේශපාලන පක්ෂවලට එල්ලවූ දරුණුම ප්‍රහාරය වූයේ සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය කැඩී බිඳී විසිරී යාමත් සමාජවාදී රටවල්ද ක්‍රමයෙන් ධනවාදී ආර්ථිකය වැළඳ ගැනීමත්ය.

1983 දෙමළ විරෝධී කෝලාහලවලින් පසු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ආණ්ඩුව ජවිපෙ ඇතුළු පක්ෂ තුනක් කිසිදු සාධාරණ හේතුවකින් තොරව තහනම් කළේය. එහි ප්‍රතිඵලය වූයේ සියලු ප්‍රජාතන්ත්‍රවාදී මාවත් ඇහිරී ජවිපෙ යළිත් 1988/89 කාල පරිච්ඡේදයේදී ආයුධ අතට ගැනීමයි. මෙය කොහෙත්ම නිවැරැදි පියවරක් නොවූ අතර එහි ප්‍රතිඵලය වූයේ හැට දහසකට වැඩි පිරිසකට ජීවිත අහිමිවීමය. ජවිපෙ නායක රෝහණ විජේවීර මහතාද ඒ අතර විය.

ජවිපෙ වෙතින් එල්ලවූ මතවාදී පීඩනය 1970 මහ මැතිවරණයට පෙරම ශ්‍රීලනිප ඇතුළු සමගි පෙරමුණට දැනිණි. ඒ අනුව ඩොමිනියන් පාලනය වෙනුවට බ්‍රිතාන්‍ය පාලනයෙන් මුළුමනින්ම වෙන්වූ ජනරජයක් සඳහා වූ නව ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරන බවට බණ්ඩාරනායක මහත්මිය 1970 මැතිවරණයේදී පොරොන්දු වුවාය. එය කැරැල්ලෙන් පසු 1972 දී ඉටුවිය.


විධායක ජනාධිපතිවරයාගේ බලතල එක්තරා දුරකට හෝ අඩු කරන්නට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය යටතේ වූ ''පරිවාස ආණ්ඩුව'' 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළේද ජවිපෙ කළ බලපෑම නිසාය.

වෙනම රාජ්‍යයකට සමාන අන්තර් කාල පරිපාලන සභාවක් සඳහා වූ යෝජනාව ඇතුළු කොටි සංවිධානයේ සියලු යෝජනා පිළිගනිමින් එ.ජා. පෙරමුණ ආණ්ඩුව සාම සාකච්ඡා ඔස්සේ යන්නට ගිය අනතුරුදායක ගමන වැළැක්වූයේ ද ජවිපෙයි.

එහෙත් ජවිපෙට නුදුරු අනාගතයේදී බලයට පත්වීමට හැකිවේදැයි යන්න ඕනෑම කෙනකු තුළ මතුවන ප්‍රශ්නයයි. ජනතාව පක්ෂයක් බලයට පත් කිරීමේදී ආකර්ශණීය ප්‍රතිපත්ති මෙන්ම එම පක්ෂයට බලයට පත්වන තත්ත්වයක් තිබේදැයි යන සාධක දෙක බලපායි. ඒ කාරණා දෙකේදී ජවිපෙට ඒ ඒ කාලවල ඇති ප්‍රධාන පක්ෂ දෙක සමඟ තරග කරන්නට මෙතෙක් හැකි වී නැත. ඔවුන් දේශපාලනය වෙනුවෙන් කරන පෞද්ගලික කැපකිරීම්වලින් ජනතාවට වැඩක් නැත.

**එම්.එස්.එම්. අයුබ්**






### පෝය ලබන ගෙවෙන වේලාවන්

| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
|---|---|---|---|
| අප්‍රේ: 04 | අව අටවක | පෙ.ව 4.12 | 05 දා පෙ.ව. 2.59 |
| අප්‍රේ: 11 | අමාවක | පෙ.ව 6.03 | 12 දා පෙ.ව. 8.00 |
| අප්‍රේ: 20 | පුර අටවක | පෙ.ව 00.01 | 21 දා පෙ.ව. 00.43 |
| අප්‍රේ: 26 | පසළොස්වක | ප.ව 12.44 | 27 දා පෙ.ව. 09.01 |

| හදිසි දුරකතන ඇමතුම් අංක | |
|---|---|
| පොලිස් මූලස්ථානය | 2421111 |
| පොලිස් හදිසි ඇමතුම් | 2433333 |
| අල්ලස් කො.දෙ. | 1954 |
| යුද හමුදා මූලස්ථානය | 2432683 |
| බෝම්බ නිශ්ක්‍රීය අංශය | 2434251 |
| ගුවන් හමුදා මූලස්ථානය | 2441044 |

# ජිනීවා ගැටලුවට එරෙහිව රටේ සියලු දෙනා එක මතයක සිටිය යුතුයි

## මහාචාර්ය ජී.එල්. පීරිස්



(ඕයනා උදයංගනී)

ජිනීවා ගැටලුවට එරෙහිව රටක් ලෙස සියලු දෙනා එක මතයක සිටිය යුතු බව අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා ඉකුත්ද (31) සඳහන් කළේය.

එහිදී පක්ෂ විපක්ෂ භේද අමතක කළ යුතු බව ද ඇමැතිවරයා පැවසීය.

අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා මේ බව පැවසූයේ බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ දී ඉකුත් 31 වැනිද පැවති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු කොළඹ දිස්ත්‍රික් නීතිඥ සංගමයේ සමුළුව අමතමිනි.

**එහිදී අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේ ද පැවසීය.**

"ජිනීවාහි ශ්‍රී ලංකාවට එරෙහි මේ යෝජනාව සම්මතවෙලා පැය 12ක් යන්නත් පෙර ශ්‍රී ලංකාව පිළිබඳ සොයන්න අවශ්‍ය යාන්ත්‍රණය සඳහා නව තනතුරු 13කට අයැදුම්පත් කැඳවා තිබුණා. මේ යාන්ත්‍රණය සඳහා වෙන්කොට තිබෙන මුදල ඇමෙරිකානු ඩොල්ර් 12.8ක්. ඒ දේවලට සල්ලි තමන් සතුව නැති බව මානව හිමිකම් කොමිසමේ ලේකම්තුමා ප්‍රසිද්ධියේම පැවසුවා. මේ පිළිබඳ සාක්ෂි කැඳවීමට ඩොලර් 72000ක්, විදේශ ගමන් සඳහා ඩොලර් 41,500ක් වෙන්කර තිබෙනවා. ඇන්ටන් ගැජ් වාර්තාව හදන්න කටයුතු කර තිබෙන්නේ ලන්ඩනයේ හෝ වෙනත් රටවල සිට ලංකාවටවත් නොපැමිණයි. ඒවා සම්මත කරලා රටට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නවා. මීට ඉදිරිපත් කරපු සාක්ෂි අවුරුදු 20ක් වනතුරු බලන්නට නොදෙන බව ඒ වාර්තාවේ කියනවා. ඒ සියල්ල සඟවා මුහුණක්, හඬක් නැති අයගේ කටින් පිටවන දේට අනුව කටයුතු කරන්න උත්සාහ කරනවා. මේවා සාධාරණත්වයට අනුකූල නැහැ. ඇඩෙලා බාලසිංහම් කිසිදු ගැටලුවකින් තොරව සැප විඳිනවා. ඒ අතර ගැජ් සත්‍ය සොයන්න කියා ඩොලර් මිලියන 2.8ක් වියදම් කරනවා. රටට විරුද්ධව තිබෙන මේ කුමන්ත්‍රණ පරාජය කරන්න අපි රටක් ලෙස එක්විය යුතුයි.

මේ වාර්තාවල තිබෙන සියල්ල අපට හෙළි කළ යුතු බවත්, එහි විනිවිදභාවයක් තිබිය යුතු බවත් සමගි ජන බලවේගයේ මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා පවසා තිබුණා. රට වෙනුවෙන් විපක්ෂය පවා ඉදිරිපත් විය යුතුයි. අපි සියලු දෙනා එක්වී මේ ගැටලුවට මුහුණ දිය යුතුයි.

නීතිඥයන් ලෙස ඔබතුමන්ලාට සුවිශේෂී කාර්යභාර්යයක් තිබෙන බව මා විශ්වාස කරනවා.

නීතිඥයන් බොහොම ස්වාධීනව ජීවත්වන මැදහත්ව සිතන කොටසක්. ඔබගේ සහයෝගය මේ සම්බන්ධව ඉතා වැදගත් වෙනවා. ඉදිරි මාස 03 තුළ පාර්ලිමේන්තුවට පැමිණීමට නියමිත පනත් සියල්ල එන්නේ අධිකරණ අමාත්‍යාංශයටයි. අපේ රටේ නීති පද්ධතියේ අවශ්‍ය වෙනස්කම් සඳහා මඟ පෙන්වීම් කරන්න ඔබට හැකියාව තිබෙනවා. අවුරුදු 10ක් තිස්සේ වෙලා නැති නීති සැකසීම, සංස්කරණය හෝ වෙනස් කිරීම සඳහා දැන් කාලය ඇවිත්. ඒ සඳහා ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරනවා." යැයි ද ඇමැතිවරයා පැවසී ය.

අමාත්‍ය බන්දුල ගුණවර්ධන, රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සාගර කාරියවසම්, ප්‍රේමනාත් දොලවත්ත, ජනාධිපති නීතිඥවරුන් වන ජයන්ත වීරසිංහ, ඩබ්. දයාරත්න, අතුල ද සිල්වා, විජයසිරි අඹගහවත්ත යන මහත්වරුන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# විදෙස් බළල් අත්වලින් මිථ්‍යාව පතුරා රට අරාජික කරන සැලැස්මක්

## ඇමැති ප්‍රසන්න රණතුංග





(යොහාන් බාසුර)

**ජාත්‍යන්තර බලවේගවල අවශ්‍යතාව මත අසත්‍ය මත පතුරුවා රට අරාජික කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක වෙමින් ඇතැයි සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවසීය.**

ව්‍යාජ විරෝධතා රැල්ලක් නිර්මාණය කරමින් 2015 වසරේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පෙරළා දැමූ ආකාරයේ සැලැස්මක් ක්‍රියාත්මක වන බවත් පරිසරය විනාශ කිරීම සම්බන්ධයෙන් ගෙන යන ප්‍රචාරය ද එහි එක් කොටසක් බවත් අමාත්‍යවරයා පැවසීය.

මිනුවන්ගොඩ දී ඉකුත්ද පැවැති තරුණ සංවිධාන නියෝජිත හමුව අමතමින් අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා එසේ පැවසීය.

එහි දී අමාත්‍යවරයා මෙසේ ද පැවසීය.

"දෙදහස් පහළොවේ දී ජාත්‍යන්තර බලවේගවල අවශ්‍යතාව මත රජයට එරෙහිව ක්‍රියාත්මක වූ රත්තරන් අශ්වයන්, ලැම්බෝගිනි, ඩුබායි බැංකු ගිණුම් වැනි ව්‍යාජ මතවාද රැල්ලක් මගින් බලයට පැමිණි යහපාලන රජය රට තවත් වසර විස්සක් ආපස්සට තල්ලු කළා.

පරිසරය විනාශ කිරීම සම්බන්ධයෙන් විවිධ රටවල ඡායාරූප යොදා ගනිමින් සහ පෞද්ගලික ඉඩම්වල ඉදිකෙරෙන ගොඩනැගිලිවල ඡායාරූප සමාජ මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කරමින් ගෙන යන ව්‍යාජ මතවාද රැල්ල ද මෙම ව්‍යාපාරයේ තවත් එක කොටසක්.

විහාර මහාදේවී උද්‍යානය අසල පරිසර හිතකාමී චිත්‍රයක් ඉවත් කිරීම සම්බන්ධයෙන් රජයට එරෙහිව සමාජ මාධ්‍ය තුළ දැඩි විවේචනයක් එල්ල කිරීමේ සිද්ධිය පසුපස හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා සිටින බවට අනාවරණය වුණා.

දෙදහස් පහළොවේ දී යහපාලන රජය බලයට පත්වීමත් සමඟ මහබැංකු මංකොල්ලය සිදුකිරීම නිසා රට ආර්ථිකමය වශයෙන් දැඩි පීඩනයකට පත්වුණා. බැංකු මංකොල්ලයට සෘජුව හෝ වක්‍රව චෝදනා ලැබූ ඇතැම් පිරිස් අද ජනතා සහනයක් ලෙස වත්මන් රජය ලබාදුන් සීනි බදු අඩුකිරීම දැවැන්ත වංචාවක් ලෙස හුවා දක්වනවා.

යහපාලන රජයේ බල අරගලය මත ජාතික ආරක්ෂාව බිඳවැටීම නිසා අමානුෂික ලෙස අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරය එල්ල වූ අතර එයින් 250 කට අධික පිරිසක් මරණයට පත්වී තවත් පිරිසක් සදාකාලික ආබාධිතයන් බවට පත්වුණා.

වසර තිහක් පැවති ත්‍රස්තවාදය අවසන් කිරීමට 2009 වසරේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය දැඩි කැපවීමකින් කටයුතු කර රට නිදහස් නිවහල් රාජ්‍යයක් බවට පත්කර ඉන්පසු සංවර්ධනය කිරීමේ මහගු කාර්යයට පණ දුන් අවස්ථාවක දී ජාත්‍යන්තර බලවේගවල අවශ්‍යතා අනුව රජයට එරෙහිව ව්‍යාජ මතවාද රැල්ලක් ක්‍රියාත්මක කර එම රජය පෙරළා දැමීමට කටයුතු කළ ආකාරය ජනතාවට අමතකයි යැයි අමාත්‍යවරයා පැවසීය.

# සහන දෙන්නේ ගජ මිතුරන්ට විතරයි

# මේක පොඩි මිනිහගේ කහට කෝප්පයෙනුත් ගසා කන ආණ්ඩුවක්



## මුජිබර් රහුමාන්

(නිමල කොඩිතුවක්කු)

**"ජනතාවගේ කහට කෝප්පයෙන් ගසා කන හිතක් - පපුවක් නැති ආණ්ඩුවකින් අලුත් අවුරුද්දට සහන බලාපොරොත්තු විය නොහැකි බව" පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා කොළඹ දී පැවැසීය.**

"ආණ්ඩුව පත් කිරීමට කැපවූ 69 ලක්ෂයක් ඇතුළු සමස්ත ජනතාවට සහන සැලසීම වෙනුවට ආණ්ඩුව තම හිතවත් ගජ මිතුරන් කිහිප දෙනකු පොහොසත් කරමින් සිටින බව" ද රහුමාන් මහතා සඳහන් කළේය.

කොළඹ - මාකස් ප්‍රනාන්දු මාවතේ විපක්ෂනායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවට එක්වෙමින් ඔහු මේ බව පැවැසීය.

**පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා මෙසේද කීවේය.**

"අපේ රටට තව සති දෙකකින් අලුත් අවුරුද්ද ලබනවා. මෙවැනි කාලයට හිටපු සෑම රජයක්ම ජනතාවට සහන දෙමින් වගකීමෙන් කටයුතු කළා. මේ ආණ්ඩුව බලයට ආවට පසු වගකීමකින් තොර ප්‍රකාශ ඉදිරිපත් කරනවා.

මුලින් සීනි වංචාවක් වුණා. සීනි බද්ද අඩු කර ආණ්ඩුවේ හිතවත් ජාවාරම්කාරයන්ට අවශ්‍ය විදියට වෙළෙඳපොළ හසුරවමින් කටයුතු කළා. ඉන් මුදල් අමාත්‍යාංශයට කෝටි 1600ක පාඩුවක් වුණා.

ආණ්ඩුව හිතාමතාම තමන්ගේ හිතවත් ජාවාරම්කාරයන්ගේ භාණ්ඩ වෙළෙඳපොළට ගේන්න අවශ්‍ය බදු පහසුකම් දෙනවා. ශත 25ට සීනි අඩු කළාම සතොස සීනි ගත් ආකාරය ගැන වාර්තාවක් නැහැ. එම වාර්තාව ලැබුණ පසුවයි, එහි පාඩුව දැනගන්න වෙන්නේ. සතොස පාඩුව ගැන නිල තොරතුරු ලැබී නැහැ. එවකට සතොස සභාපති තමයි අද ප්‍රමිති ආයතනයේ සභාපති විදියට කටයුතු කරන්නේ. එතුමා සතොසෙන් යන්නත් මෙය චෝදනාවක් වුණා.

සීනි වංචාව ආණ්ඩුව මොන තරම් වසන් කරන්න හැදුවත් වැඩක් නැහැ. ඉන් රුපියල් කෝටි 1600ක වංචාවක් වෙලා ඉවරයි. මේ ආණ්ඩුව යටතේ සීනි වංචාව කරන අය අල්ලයි කියා හිතන්න බැහැ. මේක ජනතාවගේ කහට කෝප්පයෙන් ගසා කන හිතක් - පපුවක් නැති ආණ්ඩුවක්. මේකෙන් ජනතාවට සහන බලාපොරොත්තු වෙන්න බැහැ.

මේ දිනවල පොල් තෙල් වංචාව ගැන කතා වෙනවා. අද බදු වංචාවලින් මුදල් හොයන්න පුළුවන්. ඒත් විෂ පොල් තෙල් මුදා හැරීම තුළ අහිමි වන ජීවිතයේ වටිනාකම කියන්න බැහැ.

මේ ආණ්ඩුව හිතක් පපුවක් නැති ආණ්ඩුවක් කියා අද වෙන විට ඔප්පු වෙලා. විෂ පොල් තෙල් වගකීම කිසි කෙනකු බාර ගන්න කැමති නැහැ.

ප්‍රමිති ආයතනයේ සභාපති වෙලාවක විෂ නැහැ කියනවා. තවත් වෙලාවක තියෙනවා කියනවා. වෙළෙඳ ඇමැති තවත් එකක් කියනවා. අමාත්‍යවරුන් තවත් ඒවා කියනවා. ආණ්ඩුවේ කවුරුවත් මේ ගැන ජනතාවට පැහැදිලි කිරීමක් කරන්නේ නැහැ.

**පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙදආරච්චි මහතා මෙසේ කීය.**

"මේ රජය පත්වීමත් සමග ධීවර ජනතාවට කණ කොකා හඬන තත්ත්වයක් ඇතිවෙලා. ඉන්දීය ධීවරයන්ට අපේ රටේ මුහුදේ මසුන් ඇල්ලීමට අවසර දෙන්න ධීවර අමාත්‍යාංශයත්, ඉන්දීය රජයත් කටයුතු කරමින් යනවා.

උතුරු-නැගෙනහිර ධීවර ජනතාවගේ මත්ස්‍ය සම්පත උතුරු ඉන්දියාවෙන්, තමිල්නාඩුවෙන්, චෙන්නායිවලින් පැමිණෙන ධීවර යාත්‍රාවලින් කොල්ල කනවා.

අපේ රටේ අල්ලන මසුන්වලින් 25% ක්ම උතුරු මුහුදෙන් අල්ලනවා. උතුරේ ධීවරයන් යුද්ධය නිසා අසරණ වුණා. අද ඒ අයගේ මත්ස්‍ය අස්වැන්න මංකොල්ල කන්න ආණ්ඩුව කටයුතු කරනවා.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශාල සම්පත් රාශියක් තිබෙනවා. කිරින්ද - මාගම වැලි වැටිය ඉන් ප්‍රධානයි. මෙහි ලෝකයේ වැඩිම ඉල්ලුම තිබෙන සිලිකන් හා ඉල්මනයිට් තිබෙනවා. මෙය ගන්න 2006 මහින්ද රාජපක්ෂ ජනාධිපති ආණ්ඩුව උත්සහ කළා. එවකට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ජනතාව විමුක්ති පෙරමුණ සතුව තිබූ නිසා එය වැළකුණා.

2009 දිත් රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කණ්ඩායම් මෙය ගන්න උත්සහ කළා. එහිදී ඉන්දියාව එක් අයෙකුට මෝටර් රථය ගානේ දෙන්නත් එකඟ වුණා. කිසි කෙනකු ඒ වරප්‍රසාදවලට යට වුණේ නැහැ. යහ පාලන රජයත් මේ සඳහා උත්සාහ කළා. සජිත් ප්‍රේමදාස මහතා දිස්ත්‍රික් නායක ලෙසත්, මා සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වශයෙන් මේ පිළිබඳ සෘජු තීරණ ගත්තා.

# රට පාලනය පැත්තක දමා පරිසරය වනසමින් ආණ්ඩුව බිස්නස් කරනවා

## රුවන් විජයවර්ධන

(අංජුල මහික වීරරත්න)

**රට පාලනය පසෙක තබා ආණ්ඩුව පරිසරය වනසමින් බිස්නස් කරන තත්ත්වයට පත්ව ඇතැයි එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා කොළඹ දී ඊයේ (2) පැවසීය.**

දිගින් දිගටම වැනසෙන පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා දිවිහිමියෙන් සටන් වැදීමට එක්සත් ජාතික පක්ෂය සූදානම් බව ද විජයවර්ධන මහතා පැවසීය.

"දැවැන්ත වන සංහාරයට එරෙහිව පෙළ ගැසෙමු" යන තේමාවෙන් සංවිධාන කළ සිතුවම් ඇඳීමේ වැඩසටහනක් සිරිකොත එක්සත් ජාතික පක්ෂ මූලස්ථානය ඉදිරිපිට දී ඊයේ උදෑසන පැවැත්විණි.

එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම චිත්‍ර ඇඳීමේ වැඩසටහනට සහභාගි වූ තරුණ තරුණියන්ට ඇගැයීම් සහතිකපත් ප්‍රදානය කිරීම ද එහිදී සිදු කෙරිණි.

**අනතුරුව මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් රුවන් විජයවර්ධන මහතා මෙසේද පැවසීය.**

වන සංහාරය මේ වන විට මුළු රටේම මාතෘකාවක් බවට පත්ව තිබෙනවා. වත්මන් රජය පරිසරයට එරෙහිව ගෙන යන සටන පිළිබඳව ජනතාව දැනුවත් කොට ජනතාව පෙළ ගැසීම සඳහා අද මූලික පියවර තබනු ලැබුවා. අප ඒ වැඩසටහන ආරම්භ කළේ චිත්‍ර තරගයක් ලෙසයි. මෙහිදී ඊට මූලිකත්වය ලබා දුන්නේ සමන් රත්නප්‍රිය මහතා ඇතුළු කණ්ඩායමයි.

රජය සිංහරාජ අඩවියේ ද විවිධ ව්‍යාපෘති ආරම්භ කරන්නට උත්සාහ කරන අයුරු අප පසුගිය දිනවල දුටුවා. ස්ථාන ගණනාවකම වනාන්තර එළි පෙහෙළි කර තිබෙනවා. මේ කාර්යයට විරුද්ධව අප නැගී සිටිය යුතුයි. අපට පෙනෙන්නේ මේ ආණ්ඩුව රට පාලනය කරනවා නොව බිස්නස් කරන ආකාරයයි. රටේ ජාතික සම්පත් ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් අප මහ පාරට බහින්න වුණත් ඉදිරියේදී සූදානම්. එමෙන්ම උද්සෝෂණ කරන්නත් අප සූදනම්.

වර්තමානයේ දී රට පත්ව ඇති තත්ත්වය පිළිබඳව අපට දැඩි කනගාටුවක් තිබෙනවා. ඇමතිවරුන් කුමක් කීවත් සත්‍ය වශයෙන්ම සිදු වන්නේ කුමක්දැයි දැන් ජනතාවට තේරුම් ගෙන තිබෙනවා.

සීනි බදු වංචාව කළ පිරිසම පොල්තෙල් වංචාවක් කර ඇති බවට දැන් මතයක් ගොඩනැගී තිබෙනවා. මේ සඳහා රජය මැදිහත් විය යුතුයි. රටේ ජනතාව සඳහා අවශ්‍ය තරම් පොල්තෙල් මේ රටේම නිෂ්පාදනය කිරීමට තරම් සම්පත් තිබෙනවා. පිටරට පොල්තෙල්වල පිළිකාකාරක තිබෙන බවට තහවුරු වීමත් සමඟ මේ වන විට ජනතාව ද බියට පත්ව සිටිනවා. අලුත් අවුරුදු සමයේ කැවුම් කොකිස් හදන්නවත් පොල්තෙල් පාවිච්චි කරන්නට ජනතාව බියට පත්ව සිටිනවා. මේ පොල්තෙල් ගෙන්වන්නට අනුමැතිය දුන්නේ කවුද ? ඒව ගෙනාවේ කවුද? ගබඩා කර තිබෙන්නේ කොහෙද? යන කාරණා ජනතාවට කිව යුතුයි. මේවා සොයා බලා වගකිවයුත්තන්ට දඬුවම් කළ යුතුයි. මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් කර වගකිව යුත්තන්ට දඬුවම් කරන ලෙස අප රජයෙන් ඉල්ලා සිටිනවා.


මේ රටේ ආර්ථිකය නිසා සිංහල අවුරුද්දට කැවුම් කොකිස් කන්නවත් නොහැකි වී තිබෙනවා. ජනතාවට සමීප දේශපාලනඥයන් ලෙස අපට හොඳින්ම එය අත් දකින්නට ලැබෙනවා. යැයි ද විජයවර්ධන මහතා කීය.

**එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතා මෙසේ කීය.**

ආණ්ඩුව රට මෙන්ම පරිසරය විනාශ කරන තත්ත්වයට ඇද වැටී තිබෙනවා. සිංහරාජය, විල්පත්තුව මෙන්ම රටේ සමස්ත අභයභූමි අවසන් ගමන් යමින් තිබෙනවා. ජනතාවට හුස්ම ගන්න ඔක්සිජන් ටික පවා ආණ්ඩුව විසින් අහිමි කරමින් සිටිනවා. රටේ ඇමැතිවරුන් ඔක්සිජන් කන්න ද කියා අසන තත්ත්වයකට පත්ව තිබෙනවා. එක් පැත්තකින් පරිසරය විනාශ කරනවා. අනෙක් පැත්තෙන් ආර්ථිකය විනාශ කරනවා. දැන් රටේ හැම තැනකින්ම විෂ පොල්තෙල් හසු වෙමින් තිබෙනවා. ජනතාවට විස කවන්නට කටයුතු කළ අයට අපරාධ නීතිය යටතේ කටයුතු කළ යුතුව තිබෙනවා. ආණ්ඩුව පොල්තෙල් ගෙන්වූ අය අල්ලනු වෙනුවට පොල් තෙල් විකුණන අය අල්ලමින් නාට්‍යයක් රඟ පාමින් සිටිනවා. සමස්ත රටම පිළිකා රෝගීන් බවට පත් කිරීමේ අවදානමක් මේ වනවිට තිබෙනවා. ජාතික ආරක්ෂාවට ඉහළ තැනක් දෙනවා යැයි කියූ ආණ්ඩුව අද ජාතික ආරක්ෂාව බින්දුවට ඇද දමා තිබෙනවා. ජාතික ආරක්ෂාව යනු බෝම්බයෙන් උණ්ඩයෙන් ජනතාව බේරන එක පමණක්ම නොවේ. වස විස කවා ජනතාව පීඩාවට පත් කිරීමත් ජාතික ආරක්ෂාවට තර්ජනයක් බව කිව යුතුයි.



එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා සිතුවමක් අඳින අයුරු නිරීක්ෂණය කරමින්. (ඡායාරූපය: ඩික්සන් වසන්ත)



## ගංගොඩවිල සෝමහිමි මවගේ අවසන් කටයුතු අද

අපවත්වී වදාළ ගංගොඩවිල සෝම හිමියන්ගේ මෑණියන් වූ චාලට් වීරතුංග මහත්මියගේ දේහය පිළිබඳ අවසන් කටයුතු බොරැල්ල සුසාන භූමියේදී අද (3) සිදුකෙරේ.

සෝම හිමියන් ඇතුළු දරුවන් පස් දෙනකුගේ මව වූ චාලට් වීරතුංග මහත්මිය ඉකුත් 31 වැනිදා අභාවප්‍රාප්ත වූ අතර ඇය 95 හැවිරිදි වියෙහි පසුවූවාය.

දේහය කඩුවෙල, කොතලාවල පාර, අංක 283 ලිපිනයේ තැන්පත් කර ඇත.

## චිත්‍රපට අධ්‍යක්ෂ හිටපු පළාත් මන්ත්‍රී සමන් වීරමන් කලුරිය කරයි



**චිත්‍රපට අධ්‍යක්ෂවරයකු, නිෂ්පාදකවරයකු, තිරකතා රචකයකු මෙන්ම හිටපු පළාත් සභා මන්ත්‍රීවරයකු ද වූ නීතීඥ සමන් වීරමන් මහතා ඊයේ (2) අභාවප්‍රාප්ත විය.**


කලක් අසනීප තත්ත්වයේ පසුවූ වීරමන් මහතා මියයන විට 70 වැනි වියෙහි පසුවිය.

වීරමන් මහතා ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයකු ලෙස මෙන්ම රාජ්‍ය සිනමා උපදේශක සභාවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කළේය.

ඔහු ශ්‍රී සිද්ධාර්ථ ගෞතම. ඇතුළු චිත්‍රපට කිහිපයක් අධ්‍යක්ෂණය කර ඇත. වැලිගම ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආසන සංවිධායකවරයකු ලෙස ද ඔහු කලක් කටයුතු කර තිබේ.

සමන් වීරමන් මහතා චිත්‍රපට අධ්‍යක්ෂ චතු වීරමන් මහතා ඇතුළු පුතුන් දෙදෙනකුගේ පියාණන් ද වේ. අවසන් කටයුතු පිළිබඳව පසුව දැනුම් දෙනු ඇත.

## චිත්‍ර ශිල්පී තිස්ස හේවාවිතාරණ කලුරිය කරයි



**ප්‍රකට දිය සායම් චිත්‍ර ශිල්පියකු හා කාටුන් ශිල්පියකු වූ තිස්ස හේවාවිතාරණ මහතා ඉකුත් 31 වැනිදා අභාවප්‍රාප්ත විය.**

ප්‍රවීණ චිත්‍ර ශිල්පී ජී.ඇස්. ප්‍රනාන්දු සහ සුසිල් ප්‍රේමරත්නගේ ශිෂ්‍යයකු වූ ඔහු චිත්‍ර ශිල්පියකු වශයෙන්ද දැන්වීම් අලෙවි විධායකවරයකු වශයෙන් ලේක් හවුස් ආයතනය ඇතුළු පුවත්පත් ආයතන ගණනාවක සේවය කළේය. කලක් ඔහු ඩුබායිහි පුවත්පත් ආයතනයක ද සේවය කර ඇත.

ගල්කිස්සේ සාන්ත තෝමස් විද්‍යාලයේ ආදිශිෂ්‍යයකු වූ ඔහු සිනමා සක්විති ගාමිණී ෆොන්සේකා මහතා සමග ශිල්ප හැදෑරූ අතර දෙදෙනාම සුසිල් ප්‍රේමරත්නගෙන් චිත්‍ර ශිල්පය ද හදරා තිබේ.

# අනුරපුර වෙළෙඳ සංගම් සභාපති ඇතුළු හයදෙනකුට කොරෝනා

## සංවත්සර උළෙලට එක්වූ සැමටම පී.සී.ආර්

(අතුල බණ්ඩාර)

**අනුරාධපුර එක්සත් වෙළෙඳ සංගමයේ සංවත්සර උත්සවයට හා භෝජන සංග්‍රහයට සහභාගි වූ ප්‍රභූන් ඇතැම් සියලු දෙනා සඳහා පී.සී.ආර්. පරීක්ෂණ සිදුකිරීමට පියවර ගෙන ඇතැයි අනුරාධපුර වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය තේජන සෝමතිලක මහතා පැවැසීය.**

ඊට හේතු වී ඇත්තේ එම උත්සවයට සහභාගි වූ අනුරාධපුර එක්සත් වෙළෙඳ සංගමයේ සභාපතිවරයා ඇතුළු ක්‍රියාකාරී සාමාජිකයන් තුන් දෙනකු හා ඉන් එක් සාමාජිකයකුගේ පවුලේ සාමාජිකයන් තිදෙනකු ඊයේ (02) වන විට කොරෝනා රෝගීන් ලෙස හඳුනා ගැනීම හේතුවෙනි.

මේ අයට කොරෝනා වයිරසය ආසාදනය වී ඇත්තේ එම උත්සවයේ දී බවට ප්‍රදේශයේ සෞඛ්‍ය බලධාරීන් සැක කරන අතර ඒ සම්බන්ධයෙන් වැඩිදුර සොයා බැලීම් සිදු කෙරේ.

මේ උත්සවයට ආරාධිතයන් ලෙස උතුරු මැද ආණ්ඩුකාර මහීපාල හේරත්, ඉඩම් අමාත්‍ය එස්.එම්. චන්ද්‍රසේන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන උද්දික ප්‍රේමරත්න සහ රෝහණ බණ්ඩාර යන මහත්වරුන් ද අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ඩබ්ලිව්. එම්.ආර්. වන්නිනායක මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීන් පිරිසක් ද සහභාගි වී ඇත.

ඒ අයට ද පී.සී.ආර්. පරීක්ෂණ කඩිනමින් සිදුකිරීමට අවශ්‍යව ඇති බව පැවැසූ වෛද්‍ය තේජන සෝමතිලක මහතා ඒ බව ඒ අයට දැනුම් දුන් බවත් සමහරු මේ වන විට ඊට යහපත් ප්‍රතිචාර දක්වා ඇති බවත් පැවැසීය.

උතුරු මැද ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් උත්සවයට සහභාගි වී සුළු වේලාවක් එතැන ගත කර භෝජන සංග්‍රහයට ද සහභාගී නොවී පිටව ගොස් තිබූ බව කී වෛද්‍ය සෝමතිලක මහතා උත්සවයට සහභාගි වූවන් පිළිබඳවත් ඔවුන් හැසිරුණු ආකාරයත් පිළිබඳවත් සොයා ගැනීමට ඡායාරූප හා වීඩියෝ දර්ශන පරීක්ෂා කිරීම සිදු කෙරෙන බව කීය.

උත්සවයට සහභාගි වූ වෙළෙඳ සංගයේ සාමාජිකයන් වෙනුවෙන් පී.සී.ආර්. පරීක්ෂණ ඊයේ (02) අනුරාධපුර නගරයේ අංක 2 ප්‍රජා ශාලාවේදී සිදු කරනු ලැබූ බවත් අද හෝ හෙට ඒ පරීක්ෂණවල ප්‍රතිඵල ලැබෙනු ඇති බවත් කී වෛද්‍ය සෝමතිලක මහතා දැනට කොරෝනා රෝගීන් බවට හඳුනාගත් අය ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යවා ඇතැයි පැවැසීය.

අනුරාධපුර ප්‍රදේශයේ බොහෝ දෙනකු කොරෝනා වසංගතයේ භයානක කම අමතක කර සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේද අනුගමනය කිරීමෙන් ඉවත් වී සිටින බවත් පෙනෙන්නට තිබෙන බව කී වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය තේජන සෝමතිලක මහතා මේ නිසා කොරෝනා වසංගතය යළි හිස එසවීමට ඉඩ තිබෙන බව සඳහන් කළේය.

# වැලිකන්ද ප්‍රා: සභා සභාපති ආණ්ඩුකාර අණින් ඉවතට

(අතුල බණ්ඩාර)

**වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ සභාපති පියතිස්ස ගමගේ ප්‍රියන්ත කවිඳු අබේසූරිය මහතා උතුරු මැද ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා විසින් එම ධුරයෙන් ඉවත් කරනු ලැබීය.**

ඔහු ධුරයෙන් ඉවත් කරමින් ආණ්ඩුකාරවරයා විසින් විශේෂ ගැසට් නිවේදනයක්ද පෙරේද (01) නිකුත් කරනු ලැබීය.

වැලිකන්ද, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට එරෙහිව චෝදනා රැසක් එල්ලවීම නිසා පළාතේ ආණ්ඩුකාරවරයා මෙම පියවර ගෙන ඇත.

ඔහුට එරෙහිව චෝදනා විභාග කිරීමට විශ්‍රාමික මහාධිකරණ විනිසුරු සමන් වික්‍රමාරච්චි මහතා පත්කරනු ලැබ සිටියේය.

විශ්‍රාමික මහාධිකරණ විනිසුරුවරයා කළ විභාගයේදී සභාපතිවරයාට එරෙහිව චෝදනා සනාථ වී ඇති බැවින් ඔහු සභාපති ධුරයෙන් නෙරපීමේ නියෝගය ආණ්ඩුකාරවරයා විසින් ඉකුත් 01 වැනිදු නිකුත් කරනු ලැබීය.

# ධුරයෙන් ඉවත් කිරීම දේශපාලන පලිගැනීමක්

## වැලිකන්ද හිටපු සභාපති කියයි



(මනම්පිටිය නිමල් ජයරත්න)

**එක්සත් ජාතික පක්ෂයට බලය හිමි වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයෙන් තමා නෙරපා දැමීම දේශපාලන පලිගැනීමක් මත සිදුවූවක් බව එහි හිටපු සභාපති ප්‍රියන්ත අබේසූරිය මහතා පැවැසීය.**

තමාට සභාපති ධුරයෙන් ඉවත්ව ආණ්ඩුවට සහාය දක්වන ලෙසට පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන් පිරිසක් විසින් කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කළ නිසා විවිධ චෝදනා හා පෙත්සම් ගසමින් දේශපාලන පලිගැනීමක් ලෙස තමා සභාපති ධුරයෙන් ඉවත් කළ බවද ප්‍රියන්ත කවිඳු අබේසූරිය මහතා කීවේය.

# ගිංතොට පන්සලක යකානැටූ දකුණු පළාත් සංවර්ධන නිලධාරී හිමි ගැන පරීක්ෂණයක්

(උණවටුන ඩී.ජී. සුගතපාල)

**ගිංතොට ප්‍රදේශයේ විහාරස්ථානයක දී ඉකුත් 30 වැනිදා දහවල් කලහකාරි ලෙස හැසිරුණු දකුණු පළාත් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරි හිමිනම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය පියවර ගන්නා ලෙස පළාත් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් දුන් බව දකුණු පළාත් ප්‍රධාන ලේකම් ආර්.සී. ද සොයිසා මහතා පැවසීය.**

මෙම හිමිනම දකුණු පළාත් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කරන අතර ගිංතොට විහාරස්ථානයක වැඩ වෙසෙයි. එසේ සිටියදී ඉකුත් 30වන දින අශෝභන ලෙස හා කළහකාරි ලෙස හැසිරෙමින් අසල්වාසීන් සමග ගැටුම් ඇති කර ගැනීමට උත්සාහ කළ අවස්ථාවේ පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු පණිවුඩයක් අනුව, පොලිස් නිලධාරින් පිරිසක් වහාම විහාරස්ථානයට ගොස් ඒ හිමිනම පොලිසියට රැගෙන විත් ඇත.



හිමිනම කරාපිටිය රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා හමුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ අවස්ථාවේ බීමත්ව සිටියේදැයි තහවුරු කර ගැනීම සඳහා හිමිනමගේ රුධිර සාම්පල ලබාගෙන රජයේ රස පරීක්ෂකවරයාට යැවීමට අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා පියවර ගෙන තිබේ.

මේ සම්බන්ධයෙන් ගාල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් කමල් රණසිංහ මහතාගෙන් කළ විමසීමකදී ඔහු කීවේ හිමිනම පළාත් සභාව යටතේ සේවය කරන බවය. ඒ නිසා එම සිද්ධිය සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීමට බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා දකුණු පළාත් ප්‍රධාන ලේකම්වරයාට සහ බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලේකම්වරයාටද උපදෙස් දී ඇති බවද අතිරේක දිසාපති කමල් රණසිංහ මහතා පැවසීය.

# පවුලේ ආරවුලකට එල්ලී මැරිලා මදිවාට කොරෝනාත් හැදිලා

## පරීක්ෂණය කළ පොලිස් - ග්‍රාම නිලධාරීහු දෙදෙනා ස්වයං නිරෝධායනයට

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

**මාදම්පේ ගලහිටියාව ප්‍රදේශයේ නිවසක බාල්කයේ ඇඳ ඇතිරිල්ලකින් එල්ලී මියගොස් සිටිය දී සොයාගත් පුද්ගලයකුගේ සිරුර පී.සී. ආර්. පරීක්ෂණයකට ලක් කිරීමේ දී ඔහුට කොරෝනා වයිරසය ආසාදනයවී තිබෙන බවට හෙළිවූ බව මාදම්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක කුලරත්න අතපත්තු මහතා 'ලංකාදීප'යට පැවසීය.**

මෙසේ මියගොස් ඇත්තේ මාදම්පේ ගලහිටියාව ප්‍රදේශයේ පදිංචි 45 හැවිරිදි තැනැත්තෙකි.

පවුලේ ආරවුලක් හේතුවෙන් මෙම පුද්ගලයා මෙසේ දිවි නසාගෙන ඇති බවට තොරතුරු ලැබී ඇතැයි මාදම්පේ පොලිසියේ නිලධාරියෙක් 'ලංකාදීප'යට පැවසීය.

මෙම පුද්ගලයාගේ සිරුර පී.සී.ආර්. පරීක්ෂණයකට ලක්කර එහි ප්‍රතිඵල ලැබෙන තෙක් හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර තිබූ බව ද පොලිසිය කියයි.

කොරෝනා වයිරසය ආසාදනයවී ඇති බවට පී.සී.ආර්. පරීක්ෂණයේ දී තහවුරුවීමෙන් පසුව පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමට සිරුර අද (03) කොළඹ අයි.ඩී.එච්. රෝහලේ අධිකරණ වෛද්‍ය විශේෂඥ චන්න පෙරේරා මහතා වෙත යැවීමට කටයුතු යොදා තිබෙන බව ද එම පොලිස් නිලධාරියා කීය.

මියගිය පුද්ගලයාගේ පරීක්ෂණවලට සහභාගි වූ පොලිස් නිලධාරියා සහ ග්‍රාම නිලධාරියා ස්වයං නිරෝධායනයට ලක් කිරීමට පියවර ගත් බව ද පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක කුලරත්න මහතා පවසයි.

මාදම්පේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.පී.ආර්. අබේනායක මහතාගේ උපදෙස් මත මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වාගෙන යයි.

# පරණ යකඩ බඩු කඩේ ගෑස් සිලින්ඩරයේ ලාම්පුව පිපිරී යකඩ කපන්නා එතැනම මරුට

(අවිස්සාවේල්ල විශේෂ සෝමසිරි හිඟුරලආරච්චි සහ කිතුල්ගල අංජුල නිශාන්ත)

**අවිස්සාවේල්ල මාදෙල පරණ යකඩ බඩු වෙළෙඳ සැලක ගෑස් සිලින්ඩරයක ලාම්පුවෙන් යකඩ කොටස් වශයෙන් කපමින් සිටිය දී ලාම්පුව පුපුරා යකඩ කපමින් සිටි තැනැත්තා එතැනම මියගොස් තවත් දෙදෙනකුට බරපතළ තුවාල සිදුවී ඇතැයි අවිස්සාවේල්ල මූලස්ථාන පොලිසිය පවසයි.**

මෙම හදිසි අනතුර වී ඇත්තේ ඊයේ (6) සවස 6.00ට පමණය.

මියගිය අය පුවක්පිටිය ප්‍රගතිපුරයේ පදිංචි ආර්. මුගන් සුන්දර මූර්ති (52) නමැත්තෙකි.

ගෑස් සිල්න්ඩරයක ලාම්පුවේ ආධාරයෙන් පරණ යකඩ කපමින් සිටියදී මේ අනතුර සිදුවී ඇති බවත් එම පිපිරීමෙන් වෙළෙඳ සලේ සිටි දෙදෙනකු තුවාල ලබා ඇති බවත් මෙය පරණ යකඩ එකතු කරන හා අලෙවි කරන වෙළෙඳසලක් බවත් අවිස්සාවේල්ල පොලිසිය කියයි.



මියගිය අයගේ සිරුර අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තුවාලකරුවෝ අවිස්සාවේල්ල රෝහලේ ප්‍රතිකාර ලබති.

මරණ පරීක්ෂණය අවිස්සාවේල්ල රෝහලේ දී අවිස්සාවේල්ල නාගරික හදිසි මරණ පරීක්ෂක එච්.ජී.සී.ආර්. ජයවර්ධන මහතා ඉදිරියේ අද (3) පැවැත්වීමට නියමිතය.

අවිස්සාවේල්ල මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක විකුම් වීරසේකර මහතා ප්‍රධාන පොලිස් නිලධාරි පිරිස පරීක්ෂණ පවත්වති.

# ටයිල් අර්බුදය: කබ්රාල්ගෙන් 6 ද ප්‍රකාශයක්

(සුජිත් හේවාජුලිගේ)

**ටයිල් ආනයනය සීමා කිරීමෙන් මතුව ඇති අර්බුදය සම්බන්ධයෙන් මුදල් රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා පාර්ලිමේන්තුවේ දී ලබන 6 වැනිදා විශේෂ ප්‍රකාශයක් කිරීමට නියමිතය.**

ටයිල් ආනයනය සීමා කිරීමට රජය තීරණය කළේ කොරෝනා අර්බුදය හමුවේ රටේ ආර්ථික හා මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමේ අරමුණින් බවත් එම ප්‍රශ්නය විසඳීමට රජය ඉදිරියේ දී ගන්නා ක්‍රියාමාර්ග මෙම විශේෂ ප්‍රකාශය මගින් ජනතාව දැනුවත් කිරීමට බලාපොරොත්තු වන බවත් මුදල් රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා පැවැසීය.

රජය ඉහත තීරණය ගත්තේ පොදුවේ සමස්ත ජනතාවගේ සුබසිද්ධිය සඳහා මිස ජනතාව අපහසුතාවට පත් කිරීමට නොවන බව ද ඔහු ප්‍රකාශ කළේය.

ටයිල් ආනයනය සීමා කිරීමෙන් ටයිල් ආනයනකරුවන් මෙන්ම පොදුවේ ජනතාව දැඩි දුෂ්කරතාවට පත්ව ඇතැයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක් මතු කරමින් පාර්ලිමේන්තුවේ දී පසුගියද පැවැසීය.

අජිත් නිවාඩ් කබ්රාල් මහතා සීනි බදු සිද්ධිය ගැන ද පාර්ලිමේන්තුවේ දී පසුගියද විශේෂ ප්‍රකාශයක් කළේය.

## අවුරුද්දට ගමේ යන අයට අහඹු ඇන්ටිජන් පරීක්ෂණ 1 වැනි පිටුවෙන්

කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන බව ද ඔහු කීවේය.

අවුරුදු සමයේ දී එකවර විශාල පිරිසක් ගම්බිම්බලා පිටව යන බවත් ඒ පිරිස් අතර ආර්ථික ප්‍රවර්ධන කලාපවල සේවක සේවිකාවන් ද විශාල පිරිසක් සිටින හෙයින් ඔවුන් අතර කොවිඩ් ආසාදිතයන් සිටියහොත් බරපතළ කොරෝනා අවදානමක් මතුවිය හැකි බවත් සුදත් සමරවීර මහතා පැවැසීය.

ගමට රෝගීන් යෑම වැළැක්වීම මෙම වැඩපිළිවෙළේ ප්‍රධාන අරමුණ බව ඔහු වැඩිදුරටත් කීය.

## නැකැත් සීට්ටුව බෙදාහැරීම අද 1 වැනි පිටුවෙන්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ යන මහත්වරුන් ඇතුළු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකයන් ද මෙම කටයුත්ත සඳහා සහභාගී වන බව එම පක්ෂයේ ප්‍රකාශකයෙක් පැවසීය.

වව්නියාවේ දී අද (3) පැවැත්වෙන 'ගම සමඟ පිළිසඳර' වැඩසටහන අතරතුර දී ජනාධිපතිවරයා ජනතාව වෙත අවුරුදු නැකැත් සීට්ටුව ලබා දීමට නියමිත අතර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මහතා ද බත්තරමුල්ල නෙළුම් මාවතේ පැවැත්වෙන පක්ෂ මූලස්ථානයේ දී නැකැත් සීට්ටුව බෙදාදීමේ කාර්යයට එක්වීමට නියමිතය.

මෙම අවුරුදු නැකැත් සීට්ටුව සමඟ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජය බලයට පැමිණ ගත වූ කාලයේ දී රටේ සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩපිළිවෙළ ඇතුළත් පත්‍රිකාවක් ද බෙදාහරින බව ඔහු සඳහන් කළේය.

## පළමු මාත්‍රාව දීම නැවැත්වීමේ තීරණය වෙනස් කරයි 1 වැනි පිටුවෙන්

ඒ අනුව සාමාන්‍ය පරිදි වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින්ට එම එන්නත ලබාදීම අඛණ්ඩව සිදුකරන බව ද ඔහු කීවේය.

ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ පළමු මාත්‍රාව ලබාගත් පුද්ගලයන්ට දෙවැනි මාත්‍රාව ලබාදීමට ඉදිරියේ දී වැඩපිළිවෙළක් සකස්කරන බව ද සුදත් සමරවීර මහතා පැවසීය.

ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ පළමු මාත්‍රාව ලබාදීම තාවකාලිකව අත්හිටුවීමට සෞඛ්‍ය අමාත්‍යාංශය ඊයේ (2) පෙරවරුවේ තීන්දුවක් ගෙන තිබිණි.

## පුත්තලම පාඬිගල රජයේ ඉඩමක නීති විරෝධීව කැණීම් කරලා... 1 වැනි පිටුවෙන්

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ පුත්තලම අවට වැලි සේදීමේ ව්‍යාපාරයක් පත්වාගෙන යන ප්‍රධාන ව්‍යාපාරිකයකු හා එහි කැණීම් කළ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවකු බව පොලිසිය කියයි.



කැනීම කළ ස්ථානය... (ඡායාරූපය - පුත්තලම හිරාන් ප්‍රියංකර)

වැලි ව්‍යාපාරිකයා නිදන් ලබා ගැනීමේ අරමුණින් රජයේ ඉඩමේ කැණීම් සිදුකරන බවට චෝදනා කරමින් ප්‍රදේශවාසීන් පිරිසක් එම ඉඩමට කඩා වැදී ඇතැයි පොලිසිය සඳහන් කරයි.

පාඬිගල වැව් රක්ෂිතයට ආසන්නයේ පිහිටි ඉඩමේ වැලි ව්‍යාපාරිකයා අඩි 10කට වඩා ගැඹුරකින් හා අඩි පනහකට ආසන්න වපසරියකින් යුත් දැවැන්ත වළක් නීති විරෝධීව කපා එහි කළුගල් ද ඉවත් කර ඇති බවට ප්‍රදේශවාසීහු චෝදනා කරති.

ඉන්දියාවෙන් පැමිණ මෙම ප්‍රදේශයේ සිටි බවට සැක කරන පාඩි නමැති පාලකයකු මෙම ප්‍රදේශ තුළ තම බලය රඳවාගෙන සිටි බවට පුරා විද්‍යාත්මක සාධක රැසක් තිබෙන බවද ඔහු පවසති.

පිට පළාත් වලින් පැමිණෙන පිරිස් එම ප්‍රදේශය වනසා අක්‍රමික ලෙස ඉඩම් ලබා ගනිමින් සිටින බවට ඔවුහු චෝදනා කරති.

අදාළ ස්ථානයට පැමිණි පුත්තලම මූලස්ථාන පොලිසියේ පොලිස් කණ්ඩායමක් මෙම කැණීම සම්බන්ධව අදාළ ව්‍යාපාරිකයා හා කැණීම් කළ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු සමග බැකෝ යන්ත්‍රය ද අත්අඩංගුවට ගෙන ඇත.

පුත්තලම පුරා විද්‍යා කලාප භාර නිලධාරි තුෂාර ප්‍රදීප් මහතා එම ස්ථානයට පැමිණ විශේෂ පරීක්ෂණයක් ආරම්භ කරන බව කීවේය.

ඒ සමගම පුත්තලම පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් ද මෙම ස්ථානයට පැමිණ පරීක්ෂණ ආරම්භ කර තිබුණි.

සිද්ධිය සම්බන්ධයෙන් පුත්තලම නියෝජ්‍ය පොලිස්පති නිමල් පෙරේරා මහතාගෙන් කළ විමසීමේදී ඔහු පැවැසුවේ අදල කැණීම් සම්බන්ධව අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරු හා අනෙක් තැනැත්තා පොලිස් අත්අඩංගුවේ සිටින බවත්ය. ඔහු පිළිබඳව නිලධාරීන් කණ්ඩායමක් විශේෂ පරීක්ෂණයක් අරඹා ඇති බවද ඔහු කීවේය.

# කොරෝනා 93,037 ට නගී: 89701 කට සුවයි: අලුතෙන් 120 ක්

(රංජන් කස්තූරි)

**කොරෝනා ආසාදිත රෝගීන් තවත් 120 දෙනකු අලුතෙන් හමුවීමත් සමග මෙරටින් වාර්තාවන කොරෝනා රෝගීන්ගේ මුළු සංඛ්‍යාව 93,037 දක්වා ඊයේ (2) ඉහළ ගිය බව සෞඛ්‍ය අංශ වාර්තා පවසයි.**

මේ වන විට කොරෝනා රෝගීන් 2765ක් රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටින අතර සැක සහිත රෝග ලක්ෂණ ඇති 326 ක් රෝහල්වල වෛද්‍ය අධීක්ෂණය යටතේ පසුවෙති.

කොරෝනා ආසාදිතව ප්‍රතිකාර ලබමින් සිටි රෝගීන් තවත් 294 ක් සුවය ලබා රෝහල්වලින් ඊයේ (2) පිටව ගිය බව සෞඛ්‍ය අංශ පවසයි.

සුවය ලැබූ කොරෝනා රෝගීන්ගේ මුළු සංඛ්‍යාව ඊයේ වන විට 89,701ක් බව ද එම වාර්තා සඳහන් කරයි.


## අවමංගල්‍ය දැන්වීම්

**සුමිත්‍රා බක්මීවැව මහත්මිය** (විශ්‍රාමික - මහජන බැංකුව) - නැසීගිය ආනන්ද බණ්ඩාර බක්මීවැව (විශ්‍රාමික - මහජන බැංකුව) ගේ ආදරණීය බිරිඳ වූද. සුබෝධා හා කෝසල ගේ ආදරණීය මව වූද, දුලංජලී ගේ ආදරණීය මිත්තණිය වූද, මහින්ද, සුජාතා, සුසන්ත සහ මානෙල් ගේ ආදරණීය සහෝදරිය වූද සුමිත්‍රා බක්මීවැව මහත්මිය පරලොව සැපත් විය. **අවසන් කටයුතු 2021 අප්‍රේල් මස 03 වන දින සවස 5.00ට රාවතාවත්ත පොදු සුසාන භූමියේදී සිදුකරන බව කනගාටුවෙන් දැනුම් දෙනු ලැබේ. දුරකථන අංක 077-3420185, 078-1277204. ලිපිනය: නො. 27/3, කෝකිල පෙදෙස, තෙලවල පාර, රත්මලාන.** DLD 164588

# කුරගල මහා සෑයේ ඉදිකිරීම්වලට දස දෙසින් මහ සෙනඟක්





(බෙලිහුල්ඔය ප්‍රින්ස් රත්නායක)

ඓතිහාසික කුරගල අසදිසි සුගත මහා සෑය ඉදිකිරීමේ මංගල ශිලා ප්‍රතිස්ථාපනය ඉකුත් 28 වැනිදා සිදු කළ අතර මේ වන විට එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දස දෙසින් විශාල පිරිසක් පැමිණ ශ්‍රමදන කටයුතු සඳහා දයක වෙති.

පින්නවල, කනතිරියන්වල, පින්වත්ත උඩගම විහාරස්ථානයන්හි දයකකාරකාදීන් ඇතුළු බලංගොඩ බෞද්ධ කටයුතු සමායෝජක උඩවෙල ජිනරතන හිමියන්, මැදගම් නුවර ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී බොල්තුඹේ ගුණරතන හිමියන් ගේ මැදිහත්වීමෙන් තුන්සියයකට ආසන්න පිරිසක් දෙවැනි ද කුරගල අසදිසි සෑයේ ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රමදනමය කටයුත්තකට එක්ව සිටිති.

විහාරස්ථානයේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කරනු ලබන කොටපොල ධම්මරතන හිමියන්ගේ මැදිහත්වීමෙන් පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය හිමිවරු එකසිය පනස් නමක් ද මෙම අවස්ථාවට දයක වී සිටිති.

මෙම චෛත්‍යය ඉදිකිරීම සඳහා ගඩොල් දෙලක්ෂ හැත්තෑ දහක් අවශ්‍ය වන අතර මේ වන විට ශ්‍රම දයකත්වය සඳහා දිවයිනේ නන්දෙසින් තරුණ පිරිස් එක්ව සිටින බවත්, විවිධාකාරයේ දයකත්වය මෙම පුණ්‍ය කටයුත්තට ලැබෙන බවත් ඒ සඳහා සියලු දෙනාටම කෘතවේදිත්වයෙන් යුතුව පුණ්‍යානුමෝදනා කරනු ලබන බව කුරගල ප්‍රතිනිර්මාණය කිරීමේ පුරෝගාමී මෙහෙවරක යෙදෙන නෙල්ලිගල ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ විහාරාධිපති වතුරකුඹුරේ ධර්මරතන හිමියෝ පැවසූහ.

මෙම අවස්ථාවට බලන්ගොඩ සමාජ සංවර්ධන පදනමේ අධ්‍යක්ෂ ශ්‍රී සුදර්ශන මහා විහාරයේ විහාරාධිකාරී ඉඹුල්පේ විජිතවංශ හිමියෝ ද එක්ව සිටියහ.

## මෝටර් රියක යතුරුපැදි 2ක් ගැටී තරුණයෝ 2ක් මරුට

( බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ )

මහරගම පොලිස් වසමේ බොරැල්ල - කොට්ටාව මාර්ග අංක 174 ප්‍රධාන බස් මාර්ගයේ පොල්වත්ත මංසන්ධියේදී ඊයේ (02) දින අලුයම 1.30ට පමණ මෝටර් රථයක් සහ යතුරු පැදි දෙකක් එකිනෙක ගැටීමෙන් යතුරු පැදියක ගමන් ගත් තරුණයන් දෙදෙනකු මියගොස් අනෙක් යතුරුපැදියේ ගමන් ගත් තරුණයන් තුවාල ලබා ඇති බව මහරගම පොලීසියේ රථවාහන අංශය කියයි

පන්නිපිටිය දෙස සිට තලවතුගොඩ දෙසට ගමන් ගත් යතුරුපැදි තලවතුගොඩ දෙස සිට පන්නිපිටිය දෙසට ගමන්ගත් මෝටර් රිය පොල්වත්ත මංසන්ධියෙන් මහරගම දෙසට ගමන් කිරීමට හැරවීමේදී අධික වේගයෙන් පැමිණි යතුරු පැදි දෙක මෝටර් රියේ ගැටී මෙම අනතුර සිදුවී ඇති බවත් පොලිසිය කියයි.

තරුණයන් පැමිණි යතුරුපැදිවලින් ඉදිරියෙන් පැමිණි යතුරුපැදිය පළමුව මෝටර් රථයේ ගැටී ඇති බවත් අනතුරුව පිටුපසින් පැමිණි යතුරුපැදිය ඉදිරියෙන් ගමන්ගත් මෝටර් රථයේ ගැටී යතුරුපැදිවල ගමන් ගත් තරුණයන් විසිවී ගොස් තිබූ බව පොලිස් නිලධාරියා පැවැසීය.

අනතුරෙන් ජීවිතක්ෂයට පත් වූ එක් තරුණයකු මලල්පොල, යටියන්තොට ප්‍රදේශයේ පදිංචි 26 හැවිරිදි අයෙකු බවත් අනෙක් තරුණයා මුතුහේනවත්ත, මීගොඩ ප්‍රදේශයේ පදිංචි විසි පස් හැවිරිදි අයකු බවද පොලිසිය පැවසීය.

මෝටර් රථය පැදවූ රියැදුරු මහරගම, පමුණුව ප්‍රදේශයේ පදිංචිකරුවකි.

අනතුරෙන් මෝටර් රථයට හා යතුරුපැදිවලට බරපතළ අලාභහානි සිදුව ඇති බවද පොලීසිය පවසයි.

සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ මහරගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එච් ජනකාන්ත මහතාගේ අධීක්ෂණය මත රථවාහන අංශයේ වැඩ බලන ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක වික්‍රමසිංහ මහතාගේ උපදෙස් මත පොලිස් කොස්තාපල් 70832 ප්‍රදීප් යන නිලධාරීහු සිදුකරති.

## පාස්කු - අවුරුදු සමයේ පල්ලි-හොටල් ඇතුළු වැදගත් ස්ථානවලට දැඩි ආරක්ෂාව

## ජනපතිගෙන් උපදෙස්

(සුජිත් හේවාජුලිගේ)

පාස්කු සතියේ දී හා අවුරුදු සමයේ දී දේවස්ථාන හා හෝටල් ඇතුළු වැදගත් ස්ථානවලට උපරිම ආරක්ෂාව දෙන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ත්‍රිවිධ හමුදපතිවරුන්ට හා පොලිස්පතිවරයාට උපදෙස් දී ඇත.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන යුද හමුදපති ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසුවේ ජනාධිපතිවරයා හා අගමැතිවරයා මේ සම්බන්ධයෙන් ආරක්ෂක කවුන්සිලයේ දී විශේෂ උපදෙස් මාලාවක් ලබාදුන් බවයි.

ප්‍රධාන හෝටල්වලට පාස්කු සමයේ දී යුද හමුද ආරක්ෂාව දෙන්නැයි ඒවායේ ප්‍රධානීන් ඉල්ලීමක් කර ඇති බව ද යුද හමුදපතිවරයා කීය.

ජනතාවට අවශ්‍ය සුදුසුම ආරක්ෂාව ලබාදීම සඳහා ත්‍රිවිධ හමුදව සහ පොලිසිය විශේෂ ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇති බවත් එම වැඩපිළිවෙළ ඉදිරි දිනවල දී ක්‍රියාත්මක කරන බවත් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය.

වැදගත් ස්ථාන ඉලක්ක කර පොදුවේ ඒවා පිහිටි ප්‍රදේශ ආවරණය වන පරිදි ද ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව පැවැසූ යුද හමුදපතිවරයා දේවස්ථානවල දේව මෙහෙයන් සඳහා සෞඛ්‍ය රක්ෂිත ක්‍රම අනුගමනය කරමින් කිසිදු බියක් සැකක් නැතිව සහභාගී වන්නැයි ජනතාවගේ ඉල්ලීමක් කරන බව ද සඳහන් කළේය.

පාස්කු දින සැමරුම ඉලක්ක කර ජනතාවට උපරිම ආරක්ෂාව සපයා ඇතැයි ද ඔහු පැවැසුවේය.

## ජාතික අධ්‍යාපනය සකස් වියයුතු හැටි: අමාත්‍යාංශය අදහස් යෝජනා බාරගනී

(රංජන් කස්තුරි)

ජාතික අධ්‍යාපන පද්ධතිය සකස් විය යුතු ආකාරය සම්බන්ධයෙන් අදහස් හා යෝජනා බාර ගන්නා බව අධ්‍යාපන අමාත්‍යංශය පවසයි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.moe.gov.lk වෙත පිවිස හෝ https://egenuma.moe.gov.lk වෙබ් අඩවිය වෙත පිවිස මේ සම්බන්ධයෙන් ජනතාවට අදහස් හා යෝජනා ඉදිරිපත් කළ හැකි බව ද අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කරයි.

පූජ්‍ය හා පූජක පක්ෂයට, අධ්‍යාපනඥයන්ට විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට, මහජන නියෝජිතයන්ට දෙමාපියන්ට, ශිෂ්‍යයන්ට විවිධ වෘත්තිකයන්ට හෝ වෙනත් ඕනෑම පාර්ශ්වයකට හෝ මේ සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කළ හැකි බවත් එම අදහස් හා යෝජනා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි බවත් අධ්‍යාපන අමාත්‍යාංශය කියයි.

## පොල්තෙල් සාම්පල 55ක විෂ රසායන නෑ

(මුදිතා දයානන්ද)

රට පුරා වෙළෙඳ සල්වලින් ලබාගත් පොල්තෙල් සාම්පල පනස් පහක ඇෆ්ලටොක්සින් විෂ රසායනිකය අඩංගු නැතැයි සමුපකාර අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා ඊයේ (02) පැවසීය.

පරීක්ෂාවට ලක් කිරීමට යොමුකළ පොල්තෙල් සාම්පල 125න් මේ වන විට ලැබී තිබෙන්නේ සාම්පල 55ක වාර්තා පමණක් බව ද අලගියවන්න මහතා පැවසීය.

ඔහු මේ බව සඳහන් කළේ පාරිභෝගික සේවා අධිකාරියේ දී පැවති මාධ්‍ය හමුවක දීය.

පාරිභෝගික සේවා අධිකාරිය එක් දිස්ත්‍රික්කයකින් තෝරාගත් ස්ථාන පහකින් සාම්පල පහ බැගින් වන පරිදි රටෙන්ම සාම්පල් 125ක් විෂ රසායනික අඩංගුදැයි පරික්ෂා කිරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හා පොල් සංවර්ධන මණ්ඩලයට යොමුකර ඇති අතර දැනට ලැබී තිබෙන්නේ පොල් සංවර්ධන මණ්ඩලයට යොමුකළ සාම්පලවල වාර්තා පමණි.

දේශීය පොල්තෙල් පාරිභෝගික සේවා අධිකාරිය වරින් වර පරීක්ෂාවට ලක් කරන බව ද මෙතෙක් එම පොල්තෙල් සම්බන්ධයෙන් ගැටලුවක් මතුව නැති බව ද රාජ්‍ය අමාත්‍යවරයා සඳහන් කළේය.

## සංකල්ප විහාරයේ දස ලක්ෂයේ මල් පූජා පින්කම හෙට

පිළියන්දල, මාකන්දන සංකල්ප විහාරයේ වාර්ෂිකව පැවැත්වෙන දස ලක්ෂයේ මල් පූජාව මෙවර හෙට (4) සවස 6.00ට සංකල්ප විහාරයේදී පැවැත්වේ.

කොරෝනා වසංගතය ලොවෙන් තුරන් වේවායි ප්‍රාර්ථනා කරමින් මෙවර පින්කම පැවැත්වෙන අතර සංකල්ප විහාරාධිපති උග්ගොඩ ධම්මින්ද හිමි ප්‍රධාන සංකල්ප දයක සභාව, දහම් පාසල, කුලඟන සමිතිය , S20 සංවිධානය, ක්‍රීඩා සමාජය, යෞවන සමාජය, අන්‍යෝන්‍යාධාර සමිතිය, වැඩිහිටි සමිතිය, දිරිය අභිමානී කාන්තා සමිතිය, මාකන්දන බටහිර ස්වේච්ඡා සංවිධානය, මාකන්දන බටහිර ආරක්ෂක කමිටුව මෙම පින්කම සංවිධානය කරයි.

## පාදුක්ක ලේ දන්දීම හෙට

(පාදුක්ක විශේෂ නිහාල් වෙත්තසිංහ)

පාදුක්ක 'සඟ' සංසදය 07 වැනි වරටත් පවත්වනු ලබන ලේ දන්දීමේ පින්කම හෙට (04) පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා පාදුක්ක පුස්තකාල ප්‍රජාශාලා පරිශ්‍රයේදී පැවැත්වේ.

## මීගොඩ සුමනාරාමයේ දේව දානය අද-හෙට

(පාදුක්ක විශේෂ නිහාල් වෙත්තසිංහ)

මීගොඩ ශ්‍රී සුමනාරාම පුරාණ විහාරස්ථානයේ වාර්ෂිකව දේව දනය අද (3) සහ හෙට (4) යන දිනවලදි පැවැත්වේ.

අද (03) රාත්‍රී පහන් දල්වා, යහන් දැක්ම නැටීම හා කාල පන්දම ඔප්පු සිද්ධ කිරීම සිදුකෙරේ.

හෙට (04) අලුයම බුද්ධ පූජාව පවත්වා දේව දනය පිරිනැමීම සහ ගරායක් ශාන්ති කර්මය පැවැත්වේ.

## මහාචාර්ය ලක්ෂ්මන් වටවල බෞද්ධ මහා සම්මේලන නිලවරණයට



සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ නිලවරණය අද (03) පැවැත්වෙන අතර මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතා එහි සභාපති ධූරයට අංක 07 යටතේ තරග කරයි.

මහාචාර්ය ලක්ෂ්මන් මහතා සභාපති ධූරයට පත්වුවහොත් බෞද්ධයන්ගේ ප්‍රධාන අවශ්‍යතා කීපයක් වන පුරාවිද්‍යා නටබුන් පිළිබඳ ආරක්‍ෂණ සහ රක්‍ෂණ කටයුතු කිරීමට සහාය දීම, දුෂ්කර පළාත්වල විහාරස්ථාන සහ දහම් පාසල් නගා සිටුවීමට සහ අඩු ආදයම්ලාභී පවුල් වෙත අවශ්‍යතා සපුරාලීම, බෞද්ධ දරුවන්ගේ අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම, බෞද්ධ සංස්කෘතික මෙහෙවර, බෞද්ධ කළමනාකරණය සහ ආචාරධ ර්ම පද්ධතිය ශක්තිමත් කිරීම සහ වාර්ෂික ජාත්‍යන්තර බෞද්ධාගමික සමුළුවක් පැවැත්වීම යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

වැඩිහිටි ජනගහණය ශීඝ්‍රයෙන් වැඩිවීම නිසා ඔවුන්ට සතුටින් කල්ගත කිරීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම, බීමට ගන්නා ජල ව්‍යාපෘති ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීමට වෛද්‍ය සායන පැවැත්වීම සහ බෞද්ධයන්ගේ දුගී දුප්පත්භාවය තුරන් කිරීම සඳහා කටයුතු කිරීම යන සාමාජීය කාර්යයන් ද ඉටුකිරීමට මහාචාර්ය ලක්ෂ්මන් මහතා බලාපොරොත්තු වෙයි.

කර්නල් හෙන්ද්‍රි ස්ටිල් ඕල්කට්තුමා විසින් ආරම්භ කරන ලද බෞද්ධ අධ්‍යාපනය යළි නගා සිටුවීමට ද කටයුතු කරන බව මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතා පවසයි.

## බේරුවල යෞවන ක්‍රීඩා උළෙල අද-හෙට

(අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 33 වැනි අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ක්‍රීඩා උළෙල අද (3) සහ හෙට (4) යන දිනයන්හිදී අලුත්ගම මහජන ක්‍රීඩාංගණයේ දී පැවැත්වේ.

මලල ක්‍රීඩා ඉසව්, කරාතේ සංදර්ශන ඇතුළු විශේෂ අංග සඳහා යෞවන යෞවනියන් විශාල පිරිසක් එක්වන බව තරග සංවිධායකයෝ කියති.

## දහම් පාසල් පොත් 10 ක් එළිදැක්වීම ඉරිදා මාලිගාවත්තේදී

මාලිගාවත්තේ ශ්‍රී ධර්මරාජ දහම් පාසලේ දරුවන් විසින් ලියන ලද පොත් හතක් ද ප්‍රධානාචාර්ය හිමියන් විසින් ලියන ලද පොත් තුනක් ද මුද්‍රණය කර ඇත. ඒවා එළිදැක්වෙන උත්සවය විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම, පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අප්‍රේල් 04 වැනි ඉරිදා ප.ව. 3.00ට මාලිගාවත්තේ ශ්‍රී සුධර්මාරාමයේ දී පැවැත්වේ.

## පාදුක්ක කතරගම දේවාලයේ දේව මංගල්‍යය අද-හෙට

(පාදුක්ක විශේෂ නිහාල් වෙත්තසිංහ)

පාදුක්ක, මාවතගම ශ්‍රී වර්ධනාරාමස්ථ ශ්‍රී කතරගම දේවාලයේ මහා දේව මංගල්‍යය අද (03) සහ හෙට (04) යන දිනවලදී පැවැත්වේ.

අද රාත්‍රී 9.00ට මහා දේව පූජාවද පසුද (04) උදෑසන (05) මුරුතැන් පූජාව හා මහා දේව දනය පැවැත්වේ.


උකස් රත්තරං

උකසින් බේරා වැඩිම මිලට මිලදී ගනිමි. ඉතිරි මුදල් ඔබේ අතට, නැතහොත් නැවත වැඩිම මිලට උකස් තබා දෙමි

සංජීවනී. 071-2318328






# දිනය 2021.04.01 බ්‍රහස්පතින්දා නිල ප්‍රතිපල

www.nlb.lk

### මහජන සම්පත

දිනුම් වාරය : 4444

දිනා ඇති මුළු මුදල 14,424,280.00

ජයග්‍රාහී අක්ෂරය: V | ජයග්‍රාහී අංක: 8 5 3 9 9 1

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,328,813.00

### ගොවි සෙත

කොවිසෙත Govisetha

දිනුම් වාරය : 2739

දිනා ඇති මුළු මුදල රු. 8,129,000.00

ඉංග්‍රීසි අක්ෂරය: S | ජයග්‍රාහී අංක: 12 30 60 70

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 61,371,516.40

### මෙගා පවර්

ත්‍රිපල් ජෝඩුන් Mega POWER මෙගා පවර් මෙකා පවර් කෝටි 10

දිනුම් වාරය : 805

දිනා ඇති මුළු මුදල රු. 4,473,660.00

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 126,246,338.00

ඉංග්‍රීසි අකුර: M | සුපිරි අංකය: 13 | ජයග්‍රාහී අංක: 26 35 55 73

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 20,938,204.80

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

### ධන නිධානය

දිනුම් වාරය : 481

දිනා ඇති මුළු මුදල රු. 5,132,400.00

ඉංග්‍රීසි අක්ෂරය: P | ජයග්‍රාහී අංක: 12 17 55 70

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 91,158,495.20

### සෙවණ

ඔබට ගෙවල් - අතට මුදල්

දිනුම් වාරය : 327

දිනා ඇති මුළු මුදල රු. 3,500,580.00

ඉංග්‍රීසි අක්ෂරය: G | ජයග්‍රාහී අංක: 13 32 39 49

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 14,000,000.00

2021.04.01 ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකළ මුළු ත්‍යාගලාභීන් සංඛ්‍යාව 767,068

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල රු. 35,659,920.00

රු. 2,000,000.00 ත්‍යාග: 02 රු. 1,000,000.00 ත්‍යාග: 04 රු. 100,000.00 ත්‍යාග: 35

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් ඇදීම ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය / தேசிய லொத்தர் சபை / National Lotteries Board — අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දු.ක.: 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475

# එදා අලුත් සහල් මංගල්‍යය දෑ

**අලුත් සහල් මංගල්‍ය ජාතික උත්සවය හෙට 4 වැනිදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර ජය ශ්‍රී මහ බෝ සමිඳුන් අභියසදී පැවැත්වේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

1967 වර්ෂයේ පෙබරවාරි මාසයේ එක්තරා දිනයක එවකට ගොවිජන සේවා කොමසාරිස්වරයාව සිටි ඇස්.බී. සේනානායක මහතා කාර්යාලයට පැමිණි විගස මා කැඳවා පැරණි පොතක ලකුණු කරන ලද කොටසක් පෙන්වා එය කියවන ලෙස ඉල්ලා සිටියේය.

එහි අන්තර්ගතය වූයේ පෙර හෙළ රජ දවස අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ අභියසදී ගොවින් විසින් සිදුකරන ලද ආගමික චාරිත්‍රයකි. ඔවුන් ලබා ගත් පළමු අස්වැන්නෙන් මහා සංඝයා වහන්සේලාට දන් පිරිනැමීම, කිරිපිඬු පූජා පැවැත්වීම මෙන්ම මහා පාත්‍රය සහලින් පිරවීම ආදී කටයුතු සිදුකරන ලද බව එහි සඳහන් විය.

අභාවයට ගොස් තිබූ මෙම චාරිත්‍රය නැවතත් සිදු කළ යුතු බව සඳහන් කළ කොමසාරිස්තුමා, දැනටමත් තමා අටමස්ථානයේ අධිපති ස්වාමීන් වහන්සේවූ හල්මිල්ලෑවේ රේවත ස්වාමීන්වහන්සේට දන්වා ඇති බැවින් උන්වහන්සේ හමුවී අවශ්‍ය කටයුතු සලසන මෙන් දන්වන ලදී. එහි මූලික කටයුතු සංවිධානය කරන මෙන් එකල රාජ්‍ය හා පළාත් පාලන සේවා බෞද්ධ සංගමයේ ලේකම්වරයා වූ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කාර්යාල සහායක ඩී.එස්. කෝට්ටගේ මහතාට පවරනු ලැබිණි.

**ඩේවිඩ් අතුකෝරල**

එම වැඩසටහනට නියමිත දින රාත්‍රී පරිත්‍රාණ ධර්ම දේශනාව පැවැත්වීමෙන් පසුව පසුදින කිරිපිඬු පූජාව සිදු කිරීම මහා පාත්‍රය සහලින් පිරවීම සහ දහවල් මහා සංඝරත්නය වෙත සාංඝික දානය පිළිගැන්වීම ද ඇතුළත් විය.

මෙයට 54 වසරකට පෙර සිදුකරන ලද එම පුණ්‍යකර්මයට ප්‍රධාන වශයෙන් දායක වූ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ගොවිජනතාව සඳහා ඉටු කරන ලද සේවාව මෙන්ම එහි ආරම්භය පිළිබඳවද සටහනක් තැබීම උචිත යැයි කල්පනා කරමි.

බණ්ඩාරනායක අගමැතිතුමාගේ රජයේ කෘෂිකර්ම අමාත්‍යවරයාවූ පිලිප් ගුණවර්ධන මහතා විසින් 1958 දී ඉදිරිපත් කරන ලද කුඹුරු පනත අනුව දිවයින පුරාම ගොවිකාරක සභා බිහි විය. වී වගාව නගා සිටුවීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් වගාවට අවශ්‍යවන්නාවූ පොහොර, බිත්තර වී සහ වගාණය ආදිය සැපයීමත් දෙපාර්තමේන්තුව විසින්ම සිදුකරන ලදී. එසේම සහතික මිලක් යටතේ ගොවින්ගෙන් වී මිලදී ගැනීම මෙන්ම සුළු වාරිමාර්ග කටයුතු සහ සැල්වීනියා මර්දනයද දෙපාර්තමේන්තුවට අයත් වූ සෙසු කාර්යයන් විය. කුඹුරු පනත ක්‍රියාත්මක කරන ලද්දේ ද දෙපාර්තමේන්තුව විසිනි.

සැලසුම් කළ පරිදි සිංහල අලුත් අවුරුද්දට දින කීපයක් තිබියදී මෙම මහා පුණ්‍යකර්මය අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන්වන්සේ අභියසදී ආරම්භ විය.

1967 වන විට ගොවිකාරක සභාද ගොවිජනතාව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටුකළ අතර දෙපාර්තමේන්තුව සමග දැඩි සම්බන්ධතාවයක්ද පවත්වාගෙන යනු ලැබීය. ඕනෑම ගොවිජනසේවා ප්‍රශ්නයකදී මැදිහත්ව කටයුතු කිරීමට තරම් ශක්තිමත්ව තිබූ ගොවිකාරක සභා මෙම අලුත් සහල් මංගල්‍යය පැවැත්වීමේදී අතිවිශාල දායකත්වයක් ලබා දුන්නේය.

ගොවිජනසේවා ප්‍රාදේශීය නිලධාරී මහතුන්ද සමග දිවයිනේ සෑම පෙදෙසින්ම අලුත් සහල් මංගල්‍යය පැවැත්වීමට පෙර දිනයේදී පැමිණෙන පිරිස් විශාල උනන්දුවකින් මෙම ආගමික කටයුතුවලට සහභාගි වූහ.

මෙකල මෙන් කිසිදු ආරක්ෂක වැඩ පිළිවෙළක් එද ක්‍රියාත්මක නොවූ බැවින් තමන්ට රිසි පරිදි වැඳපුද ගැනීමට මෙන්ම මෙම කටයුතුවලට සහභාගිවීමට ද ජනතාවට හැකිවිය. මෙදින පෙරවරුවේ ජය ශ්‍රී මහාබෝධීන් වහන්සේ පාමුල කාසි අතුරන ලද්දේ පැරණි රජදවස මේ චාරිත්‍රය සිහිපත් කරවමිනි.

මේ අවස්ථාවේදී මහා සංඝරත්නය පිරිත් සජ්ඣායනා කළ අතර පැන් පූජාවක්ද සිදු කළහ.

මහා පාත්‍රය සහලින් පිරවීම සඳහා අවශ්‍ය වන සහල් ගොවිකාරක සභාවන් විසින් ගෙනවිත් තිබූ අතර එම කටයුත්තේදී නුවර කලාවිය ගොවිකාරක සභා සංවිධානය විසින් පුරෝගාමී මෙහෙවරක් ඉටුකරන ලදී. මල් පූජාව සහ පහන් පූජාව සඳහා අවශ්‍ය දේ සපයමින් එය සිදුකරන ලද්දේ ද ගොවිකාරක සභාව විසිනි. ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරීන්ද මෙම කටයුත්තේදී ඉතාම උද්-යෝගයෙන් කටයුතු කළ අතර එවකට අනුරාධපුර කොට්ඨාසය භාරව කටයුතු කළ වේලාරත්න මහතා විසින් සිය සම්බන්ධීකරණ සේවාව නියමාකාරයෙන් සිදුකරන ලදී.

එම යුගයේ අනුරාධපුර ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයා වූයේ පසුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ව සිට විශ්‍රාම ලැබූ ඩී.ඇම්. ආරියරත්න මහතායි.

එකල අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමීපයේ මෙකල මෙන් ගොඩනැගිලි සමූහයක් නොතිබුණි. මල්වතු ඔයෙන් එතෙරව බෝ සමිඳුන් වෙත ගමන් කිරීමේදී බෝධියේ ආරක්ෂක බැම්මට (පැරණි ගල්කුණු එකතුකොට සාදන ලද වට බැම්ම) පිටත වම් පසින් වූයේ නායක ස්වාමීන්වහන්සේ වැඩ සිටි කුඩා ආරාමයයි. කිසිදු ආරක්ෂක වැඩපිළිවෙළක් දක්නට නොතිබූ අතර ගස් සෙවනෙහි බැතිමත්හු රැඳී සිටියහ. ආහාර පානද එහිම සකස් කර ගත්හ.

මෙම පුණ්‍යකර්මය සිදුකිරීමේදී කිරි ආහාර පූජාව පෙරහරින් වැඩම කරවන විට එයට එකතු වූ පිරිස් සාධුකාර දෙමින් සිරිමා බෝසමිඳුන් වටා ගමන් කළහ.

එකල මහත්වූ ප්‍රීතියකින් සහ භක්තියකින් මෙම මහා පුණ්‍යකර්මය සිදු කළ ගොවිජනතාව, එමගින් කලට වැසි ලැබී මහාවැව් අමුණු පිරීයමින් සිය ගොවිතැනෙහි සශ්‍රිකභාවය අපේක්ෂා කළහ. මහා සංඝරත්නයේ ආශිර්වාදයෙන් කෘෂිකර්මාන්තයේදී සිදු කරනු ලබන චාරිත්‍රවලට මුල්තැන දෙමින් ඒවා ඉටුකළ ඔවුහු මහා පාත්‍රය සහලින් පිරියන්නාක් මෙන් තමන්ගේ අටු කොටු පිරී යහපත් අනාගතයක් මෙන්ම සෞභාග්‍යවත් රටක්ද අපේක්ෂා කළහ.

මේ වන විට දළදා මාලිගාව ඇතුළු දිවයිනේ සෙසු ප්‍රදේශවලද ආගමික ස්ථාන කේන්ද්‍ර කොට ගනිමින් අලුත් සහල් මංගල්‍ය පැවැත්වේ. මෙමගින් කෘෂිකාර්මික ප්‍රබෝධයක් ඇතිවනවා පමණක් නොව එය ගොවිජනතාවගේ සංස්කෘතික මංගල්‍යයක්ද වේ.

# ගුල්ලන් පණුවන් ගැසූ



# පරිප්පු කිලෝ 3150 ක් උසාවි නියෝගයෙන් විනාසයි

## විකුණන්න ගබඩා කර තිබිලා

**(කඹුරුගමුව තරංග ගුණරත්න)**

**මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු පරිප්පු කිලෝ තුන්දහස් එකසිය පනහක් (3150) අධිකරණ නියෝග මත විනාශ කිරීමට පියවර ගත් බව වැලිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.**

වැලිගම සමුපකාර සමිතියට අයත් වෙළෙඳ සලක අලෙවි කිරීමට තබා තිබූ පරිප්පු කිලෝ විසිපහේ උර 126 ක තිබූ මෙම පරිප්පු තොගය මෙලෙස විනාශ කර ඇති බව ද එම කාර්යාලය සඳහන් කරයි.

මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු පරිප්පු තොගයක් අලෙවි කිරීමට තබා ඇති බවට වැලිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ලැබුණු තොරතුරකට අනුව සිදු කළ වැටලීමක දී මෙම පරිප්පු තොගය අත්අඩංගුවට ගෙන ඇති බව ද එම කාර්යාලයේ නිලධාරියෙක් පැවැසීය.

මෙම වෙළෙඳසලෙන් මිලට ගත් යෝගට් සම්බන්ධයෙන් වැලිගම මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට පැමිණිල්ලක් ලැබුණු බවත් ඒ අනුව එය පරීක්ෂාවට ගිය නිලධාරීන්ට ලද නිර්නාමික ඇමතුමකට අනුව එහි කාමරයක ගබඩා කර තිබූ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු පරිප්පු තොගය හමුවී ඇතැයි ද එම නිලධාරියා කීය.

පුස් සහ පණුවන් මෙන්ම ගුල්ලන් සහිත මෙම පරිප්පු තොගය අත්අඩංගුවට ගත් සෞඛ්‍ය නිලධාරීන් සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කර ඇති අතර එහි දී පරිප්පු සාම්පල් රජයේ රස පරීක්ෂකවරයාට යොමු කිරීමට අධිකරණ නියෝග ලැබුණු බව ද හෙතෙම පැවසීය.

පසුව අධිකරණ නියෝග ප්‍රකාරව අදාළ පරිප්පු තොගය සමුපකාර සමිතියේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් වැලිගම සෞඛ්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන් අධීක්ෂණය යටතේ වැලිගම කප්පරතොට කොම්පෝස්ට් පොහොර අංගනයේ දී පෙරේදා (01) විනාශ කළ බව ද ඔහු සඳහන් කළේය.

මෙම වැටලීමට වැලිගම නගර සභාවේ නගර සභාපති රොහාන් ජයවික්‍රම මහතාගේ මගපෙන්වීම මත වැලිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදීප් ගමාච්චිගේ මහතාගේ අධීක්ෂණය යටතේ දකුණු පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සුරේෂ් ලියනගේ මහතා නියෝග පරිදි දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක පියුම් කලුආරච්චි මහතාගේ උපදෙස් මත වැලිගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්.එච්.එම්. නිහාල් මහතාගේ මෙහෙයවීමෙන් වැලිගම නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නාමල් නුවන් කුමාර ආනන්ද සේනාධීර අමරවංශ කෞශල්‍ය නානායක්කාර රුවන් කුමාර මහත්වරුන් ඇතුළු මහජන සෞඛ්‍ය නිලධාරීහු එක්ව සිටියහ.



ශ්‍රී කුරුස දේවස්ථානයේ මහ සිකුරාද සැමරූ අයුරු

# වතුකරයේ මහ සිකුරාදා සැමරුමේදී..

**(නෝර්වුඩ් රංජිත් රාජපක්ෂ)**

**ජේසුස් වහන්සේ කුරුසයක ඇණ ගැසීමේ සිද්ධිය සිහිපත් කරන මහ සිකුරාදා දිනය ඊයේ (2) ට යෙදී තිබුණි.**

වතුකරයේ ප්‍රධාන සැමරුම හැටන් ශ්‍රී කුරුස දේවස්ථානයේදී එහි ප්‍රධාන පියතුමන් වන නිව්මන් පෙරේරා පියතුමාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

හැටන් ශ්‍රී කුරුස දේවස්ථානයට සැමරුමට පැමිණි කිතුනු බැතිමතුන් දේවස්ථානයේ පාලක සභාව විසින් සහ හැටන් පොලිසියේ නිලධාරින්ගේ දැඩි ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව දේවස්ථානය වෙත ඇතුළත් කර ගැනිණ.

සෞඛ්‍යය උපදෙස්වලට අනුකූලව හැටන් ශ්‍රී කුරුස දේවස්ථානයේදී මහ සිකුරාදා සැමරුම පවත්වනු ලැබූහ.

# මානව හිමිකම් සුරැකීමට කැපවූ හිමිනමට සම්මානයක්

**(සුජිත් හේවාපුලිගේ)**

**''සියලු ජාතීන් සහෝදරත්වයෙන් එකමුතු වෙමු: එකම ජාතියක් ලෙස ඉදිරියට යමු'' යන මැයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානය විසින් සංවිධානය කෙරුණු විශේෂ වැඩමුළුවක් මාලිගාවත්ත සවුසා බ්ලැස්කට් උත්සව ශාලාවේදී පසුගිය 28 වැනිදා පැවැත්විණ.**

මානව හිමිකම් සුරැකීම සඳහා කැපවූ ආගමික පූජකවරු හා සමාජ ක්‍රියාකාරිකයෝ සියයකට අධික පිරිසක් මෙහිදී විශේෂ ඇගැයීමට ලක්වූහ. මානව හිමිකම් ක්ෂේත්‍රය වෙනුවෙන් සුවිශේෂ මෙහෙවරක් කළ පිළියන්දල සිළුමිණ පරිවේනාධිපති මතුරට ධම්මරතන හිමියන්ට එම සංවිධානයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ආචාර්ය ඉසුරු බණ්ඩාර මහතා විසින් සම්මාන සහතිකයක් පිරිනැමූ අවස්ථාව මෙහි දැක්වේ.

ශ්‍රී ලංකාවේ මාලදිවයින මහ කොමසාරිස් ඕමාර් අබ්දුල් රසාක්, සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ අධ්‍යක්ෂ ආචාර්ය ක්ලැරන්ස් කුමාරගේ, තිළිණි ප්‍රියමාලි බණ්ඩාර හා නිලුෂිකා කුමාරගේ යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක්ද මෙහි වෙති.



# සියලු රට වැසියන්ට අප සමානව සලකනවා නම් කිසිදු රටකින් අයදින්න ඕනෑ නෑ

## ජිනීවා යෝජනාව ගැන යෝජනාවක්

**අප සියලු පුරවැසියන්ට එකහා සමානව සලකන්නේ නම් කිසිදු රටකින් අයැදීමේ අවශ්‍යතාවක් නැතැයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව සම්බන්ධයෙන් විද්වතුන් සිවු දෙනකු ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කර ඇත.**

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ එම්.එම්. සුහයිර්, මාධ්‍යවේදී සහ කර්තෘ ලතීෆ් ෆාරුක්, නීතිඥ සහ උපදේශන තීරු ලිපි ලේඛක මාස්එල් යුසුෆ්, දේවධර්ම විශාරද මන්සූර් ඩහ්ලාන් එම සිවුදෙනා වෙති.

එජාප මානව හිමිකම් කවුන්සලයේ වාර්තාව සහ යෝජනා පිළිබඳ ශක්තිමත් සාකච්ඡාවක් හා ඊට පිළියම් යෙදීම අවශ්‍ය බව ද ශ්‍රී ලංකාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්සත් ජාතීන්ගේ ගිවිසුම් සම්මුති හා ඒකාබද්ධ ප්‍රකාශයන්ට ගරු කළ යුතු යැයි ද එම නිවේදනයේ දැක්වේ.

**එහි තවදුරටත් මෙසේ ද සඳහන්ය.**

2021 මාර්තු 23 දින සම්මත කරගත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) යෝජනාවේ ප්‍රතිඵල ගැන රටක් වශයෙන් අපට සතුටු විය නොහැක. සුළු ගැලවීමේ වගන්තිවලින් මුහුණ බේරා ගැනීමට උත්සාහ නොකර ඇත්ත වශයෙන්ම රජය විසින් ශ්‍රී ලංකා විරෝධී යෝජනාවේ බරපතළ ඇඟවුම් සියලු ශ්‍රී ලාංකිකයන්ට පැහැදිලි කළ යුතුය.

පූර්ව අනතුරු ඇඟවීම්වලට අවනත නොවන්නේ නම් රටේ සංවර්ධනය හා ආර්ථික පුනර්ජීවනයට අහිතකර ලෙස බලපාන්නේ කෙසේද සහ ඇයි ද යන්න අප පැහැදිලි කළ යුතුය. බෙදීමට හේතු වන කතා නතර කර, අත්‍යවශ්‍ය මූලික පියවරක් ලෙස එක්සත් ජාතියක් තුළ සියලු ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් එකට එක්වීමට දිරිගැන්වීම සඳහා රජය මූලිකත්වය ගත යුතුය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවේ අන්තර්ගතයට හෝ ඊට පෙර පැවති මහ කොමසාරිස්ගේ සවිස්තර වාර්තාවට, විශේෂයෙන් රටේ සිංහල මාධ්‍ය තුළ ලැබිය යුතු ආවරණය සහ අවධානය ලැබී නොමැත. අනෙක් අතට, 21/4 පාස්කු ඉරිදු ප්‍රහාරයන් පිළිබඳ විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාවට, වසර දෙකක අඛණ්ඩ කාලයක් තුළ රටේ ප්‍රධාන ධාරාවේ සමහර සිංහල මාධ්‍ය කොටස් තුළින් අධි 'මුස්ලිම් විරෝධී නැඹුරුව සහිත ආවරණයක්' ලැබී තිබේ. ඊට අමතරව මෙම විෂය පිළිබඳ සිංහල මාධ්‍ය ආවරණය බොහෝදුරට ඒකපාර්ශ්වික බවක් පෙනේ. මෙය 21/4 බේදවාචකය එකමුතුව ජය ගැනීම වෙනුවට අනවශ්‍ය ලෙස වෛරයේ හා බෙදීම්වලට නව මාවත් නිර්මාණය කර ඇත. මෙය කනගාටුවට කරුණකි. මේ වන විට සිංහල මාධ්‍ය සමහර කොටස් පමණක් මුස්ලිම් ප්‍රතිචාරවලට ආවරණයක් ලබා දෙන අතර, මුස්ලිම් ප්‍රතිචාරවලට සාධාරණ ආවරණයක් ලබා දෙන ලෙස අපි සියලු සිංහල මාධ්‍යයෙන් ඉල්ලා සිටිමු.

මූලික වශයෙන් 21/4 පාස්කු ඉරිදු ප්‍රහාරයන් පිළිබඳ විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව දෝෂ සහිතය, භූ-දේශපාලනික-උපායමාර්ගික ඇඟවුම් නොසලකා හැර ඇත. අද අවශ්‍ය වන්නේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ වාර්තාව සහ යෝජනාව පිළිබඳ සාධාරණ, සමබර හා ශක්තිමත් මහජන සාකච්ඡාවක් වන අතර, ඉන්පසුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් 23/3 දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයට පවරන ලද ගැටලුවලට පිළියම් යෙදීමට පියවර ගත යුතුය. එය ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවදුරටත් පහත වැටීම වළක්වා ගැනීමට උපකාරී වනු ඇත.

නොමග යවන විස්තර පිළිබඳව ද අපි කුඩා සඳහනක් කළ යුතුය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව නීති විරෝධී බව අපට පවසා තිබේ. 1976 මාර්තු 23 වන දින සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) ඇතුළු පසුගිය දශක කිහිපය තුළ අප එක්සත් ජාතීන්ගේ ගිවිසුම් හා සම්මුති අත්සන් කර නොමැතිද? එවකට එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන් කී මූන් සමග බොහෝ කාරණාවලට එකඟ වෙමින් 2009 ඒකාබද්ධ ප්‍රකාශයට අත්සන් නොකළේ ද? එක්සත් ජාතීන්ගේ ගිවිසුම් හා අප අත්සන් කළ ඒකාබද්ධ ප්‍රකාශවලින් අප බැඳී නොසිටින බව ශ්‍රී ලංකා රාජ්‍යයට දැන් තර්ක කළ හැකිද?

අප රටක් ලෙස අස්ථිර ලෙස හැසිරෙන්නේ නම්, යෝජනාවෙන් පැන නගින හෝ වෙනත් ආකාරයකින්, ශ්‍රී ලාංකිකයන්ට, ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, විමර්ශක, නීතිඥ, විනිසුරු වැනි ඕනෑම තනතුරක් දරන අයට, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීති, ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂීය නීති උල්ලංඝනය කිරීම හෝ ආධාර කිරීම, අනුබල දීම හෝ කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් චෝදනා කර අවම වශයෙන් තනි රට මට්ටමේ සංචාරක තහනමක් පැනවීමට යෝජනා කළහොත් අපට එයට යෝජනාවේ ප්‍රවර්ධකයන්ට දෙස් පැවරිය හැකිද? ඉතා වැරදි ලෙස සිදු කළ දෙයක් වුවත් වර්තමාන යුද හමුදපතිගේ පවුලට කළ ආකාරයටම උල්ලංඝනය කිරීම් කර ඇත යයි චෝදනා ලබන අයගේ පවුල්වලට ද එවැනි හානිකර සීමා පැනවීමට ඔවුන් තීරණය කළොත් අපට වළක්වා ගත හැකිද? යෝජනාව ආයුධයක් ලෙස භාවිත කරන රටවල් විසින් වාණිජ සීමාවන් ද පසුව ශ්‍රී ලංකාවට පැනවිය හැකිය.

2009 දී ශ්‍රී ලංකාවට පක්ෂව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය තුළ ඡන්ද 29 ක් ලබාගත් නමුත් 2012 දී 15 ක්, 2013 දී 13 ක්, 2014 දී 12 ක් සහ 2021 දී 11 ක් දක්වා පහත වැටී ඇති බව අපි මතක තබා ගත යුතුය. ප්‍රවණතාව ඉතා පැහැදිලිය. අපි ගියර් මාරු කළ යුතුය! පාකිස්තානය, බංග්ලාදේශය සහ මුස්ලිම් රටවල් 57 කින් සමන්විත ඉස්ලාමීය සහයෝගීතා සංවිධානයේ සහාය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අපි ඉල්ලා සිටියෙමු. මුස්ලිම්වරුන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කරමින් ආණ්ඩුවේ කොටස් විසින් ප්‍රකාශ කරනු ලැබුවද, එක් මුස්ලිම් රටක්වත් ශ්‍රී ලංකාවට එරෙහිව ඡන්දය ප්‍රකාශ කළේ නැත. තවද මුස්ලිම් රටවල් හතරක් ශ්‍රී ලංකාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළේය.

2012/14 දී, ශ්‍රී ලංකා මුස්ලිම් නියෝජිතයින් ජිනීවා නුවරට ගොස් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මුස්ලිම් සාමාජික රටවලින් ශ්‍රී ලංකාවට සහාය ලබා ගැනීම සඳහා සාර්ථක උත්සාහයක නිරත විය. පාස්කු ඉරිදු කොමිසමේ සාක්ෂිවලට අනුව, එම කාලයේ දීම ශ්‍රී ලංකා විරෝධී ක්‍රියාමාර්ග කිහිපයක ප්‍රධාන ආධාරකරුවෙකු නෝර්වේහි බොදුබල සේනා සංවිධානය සිටි අතර, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රහාර ආරම්භ කිරීමට ඔස්ලෝහි පුහුණුව ලැබීය.

මුස්ලිම්වරුන්ට පහර දීම නැවැත්විය යුතුය. තවද පාස්කු ප්‍රහාරකයින්ට දඬුවම් කිරීම හෝ පුනරුත්ථාපනය කිරීම අවශ්‍ය වේ. සරල සත්‍යය නම්, ශ්‍රී ලංකාව සිය ව්‍යවස්ථාමය බැඳීම්වලට ගරු කරන්නේ නම්, එහි සියලු පුරවැසියන් විශේෂයෙන් සුළු ජාතීන්ට සමාන පුරවැසියන් ලෙස සලකන්නේ නම් සුළුතරයට වෙනස්කම් කිරීමකින් තොරව සහ මුස්ලිම්වරුන් හෝ වෙනත් සුළුතරයක් කොන් කිරීම සඳහා 21/4 භාවිතා නොකර කටයුතු කරන්නේ නම් කිසිදු රටකින් අයැදීමේ අවශ්‍යතාවයක් නොතිබූ බවයි.

මෙතැන් සිට රජය මහජනතාවගේ විශ්වාසය දිනා ගැනීමටත්, පළමු පියවර ලෙස නිදහස් හා විනිවිද පෙනෙන සාකච්ඡාවක් දිරිමත් කිරීමටත් හදිසි අවශ්‍යතාවයක් පවතී.

## අනේද කියන්නෙ ! – තලන්

| | |
|---|---|
| පළමුව පඬු කරඳ දරළුවේ | ගහය |
| ටොන් ගණනක්ව ගිනිබත් කෙරුවේ | කහය |
| පොල්තෙල් වලත් පිළිකා කාරක | වහය |
| මේවා විපක්ෂෙට නම් මී පැණි | රහය |

# හඟුරන්කෙත කතක් කොරෝනාවෙන් මරුට

**(හඟුරන්කෙත ඒ.ජේ. කරදගොල්ල)**


**හඟුරන්කෙත පළමු කොරෝනා මරණය පෙරේදා (01) දින වාර්තා විය.**

මෙසේ කොරෝනා වයිරසය ආසාදනය වී මරණයට පත්වූයේ 86 හැවිරිදි කාන්තාවකි.

ශ්වසන ආබාධයක් හේතුවෙන් රිකිල්ලගස්කඩ මූලික රෝහලට නිවැසියන් විසින් මෙම කාන්තාව ඇතුළත් කර ඉන් පසුව ඇන්ටිජන් පරීක්ෂාවේ දී මෙම කාන්තාවට කොරෝනා වයිරසය ආසදනය වී ඇති බව තහවුරුවී තිබේ. පසුව මෙම කාන්තාව මහනුවර මහරෝහලට මාරුකර යවා දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කර ඇති අතර පෙරේදා ප.ව. 5 ට පමණ එහි දී ඇය මරණයට පත්ව ඇත.

ඇයගේ මරණයට හේතුව කොරෝනා රෝගී තත්ත්වය මත ඇති වූ නිව්මෝනියාව බව රෝහල් ආරංචි මාර්ග පවසයි.

මියගිය කාන්තාවගේ අවසන් කටයුතු ඊයේ (2) මහනුවර මහයියාව ආදහනාගාරයේ දී පවුලේ සමීප ඥාතීන් 4 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුකිරීමට නියමිතව තිබුණි.



# ඉන්දියාවෙන් භාණ්ඩ මිලදී ගැනීමේ

# පාකිස්තාන මුදල් ඇමැති තීරණයට කැබිනට් මණ්ඩලයේ විරෝධය


පාකිස්තාන අගමැති මුදල් ඇමැති සමඟ

**ඉස්ලාමාබාද්හිදීය (ඒ.එෆ්.පී.)**

**වසර දෙකක් තිස්සේ පැවැති තහනම ඉවත් කරමින්, ඉන්දියාවෙන් කපු සහ සීනි යළි ආනයනය කිරීමට පාකිස්තාන මුදල් ඇමැතිවරයා ඉදිරිපත් කළ යෝජනාව, පාකිස්තාන කැබිනට් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීය.**

මුදල් ඇමැති හමාද් අසාර් සහ එරට වෙළෙඳ සහයෝගීතා මණ්ඩලය පසුගිය 31 වැනිදා යෝජනා කළේ, වසර දෙකක් තිස්සේ පැවැති තහනම ඉවත් කර, ඉන්දියාවෙන් කපු සහ සීනි ආනයන කිරීම සඳහා පාකිස්තාන පෞද්ගලික අංශයට අවස්ථාවක් ලබා දිය යුතු බවය.

'පාකිස්තාන වෙළෙඳ සහයෝගීතා මණ්ඩලය' ඇත්තේ මුදල් ඇමැතිවරයා යටතේය.

ඉන්දියාවෙන් යළි සීනි සහ කපු ආනයනය කිරීමට යෝජනා කෙරුණේ, එරට සුදු සීනි මිල සහ කපු මිල ඉහළ යෑම පාලනය කිරීමේ අරමුණින් යැයි මුදල් ඇමැති පැහැදිලි කර තිබේ.

කෙසේ නමුත් කැබිනට් මණ්ඩලය, එම යෝජනාවට අනුමැතිය ලබා නොදුන් බැවින් එය තාවකාලිකව අත්හිටුවිණි.

ඉන්දියාව සමඟ යහපත් සබඳතා ඇති කර ගැනීමට උත්සාහ ගන්නා පාකිස්තාන අග්‍රාමාත්‍ය ඉම්රාන් මාධ්‍ය හමුවේ කියා සිටියේ, කැබිනට් මණ්ඩලය ගත් තීරණය කනගාටුවට කරුණක් බවය. 'මේ යෝජනාව බොහෝ දෙනාට වාසිසහගත වීමට ඉඩ තිබුණා. ඒත් පටු දේශපාලනය ඊට හරස් වුණා. ඒක කනගාටුවට කරුණක්' යැයි අග්‍රාමාත්‍ය ඉම්රාන් පවසා ඇත.

මේ වනවිට පාකිස්තානය සහ ඉන්දියාව අතර යහපත් සබඳතා ද නිර්මාණය වෙමින් පවතී. සාමකාමී මිත්‍රත්වයකට කැමැති බව පාකිස්තාන අග්‍රාමාත්‍ය ඉම්රාන් ඛාන් මෙන්ම ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි ද අවධාරණය කර ඇත. ඉන්දියාවත් පාකිස්තානයත් අතර මෙසේ යහපත් සබඳතා වර්ධනය වීම ආරම්භ වී ඇත්තේ එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ මැදිහත් වීමෙනි.

කෙසේ නමුත් ඉන්දියාවෙන් කපු සහ සීනි ආනයන කිරීමට මුදල් ඇමැතිවරයා කළ යෝජනාවට කැබිනට් මණ්ඩලයේ විරෝධය එල්ල වීමත් සමඟ වර්ධනය වීමට පටන් ගත් ඉන්දු පාකිස්තාන සබඳතා යළි අර්බුදයකට ලක්වනු ඇතැයි දේශපාලන විශ්ලේෂකයෝ බිය පළ කරති.



# තායිවාන දුම්රියක් පීලි පනී

## 36 ක් මරුට 76 ක් රෝහලේ



තායිපේහිදීය (රොයිටර්)

තායිවාන මගී දුම්රියක් උමං මාර්ගයක් තුළ පීලි පැනීමට ලක් වීමෙන් 36 දෙනෙක් ජීවිතක්ෂයට පත් වූහ. තුවාල ලැබූ ගණන 76 කි.

තුවාල ලැබූවන්ගෙන් බොහෝ දෙනකුගේ තත්ත්වය බරපතල බවත්, මරණ සංඛ්‍යාව තවත් ඉහළ යා හැකි බවත් රෝහල් ආරංචි මාර්ග සඳහන් කරයි.

පීලි පැනීමත් සමඟ දුම්රිය මැදිරි දුම්රිය මාර්ගයෙන් පිටතට විසිවී උමඟ තුළ සිරවිය. මැදිරි තුළ සිරවුණු පිරිස් මුදා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවුණු බව ද පැවැසෙයි.

දුම්රිය ටයිටුඅංග් නගරය බලා ධාවනය වෙමින් තිබියදී අනතුරට ලක් වී තිබේ. අනතුරට ලක් වෙද්දී දුම්රියේ ගමන් කරමින් සිටි මගීන් ගණන 350 කි.

දශක 4 කට පසු තායිවානයේ සිදුවුණු දරුණුතම දුම්රිය අනතුර මෙයයි. මීට පෙර තායිවානයේ මෙවැනි දුම්රිය අනතුරක් සිදුවූයේ 1981 වසරේදීය. එම අනතුරින් මියගිය ගණන 30 කි.

# රුසියාවෙන් සතුන්ටත් කොරෝනා එන්නතක්



**මොස්කව්හිදීය (රොයිටර්)**

**'කොවිඩ් 19' වයිරසයෙන් සුරතල් සතුන් ආරක්ෂා කර ගැනීමට රුසියාව එන්නතක් නිපදවා ඇත. 'කර්නිවැක් කොව්' යන නමින් නම් කළ එම එන්නත ඊයේ (2) ලියාපදිංචි කෙරුණි.**

මෙම ප්‍රතිශක්තිකරණ එන්නත නිපදවා ඇත්තේ, රුසියාවේ, සතුන් සඳහා ඖෂධ නිෂ්පාදනය කරන 'රෝසෝකාටිසෙන්ඩර්' නමැති සමාගමය. මෙය රුසියන් රජය යටතේ පවතින සමාගමකි. එන්නත නිපදවීම සිදුකර ඇත්තේ රුසියානු ජාතික පශු වෛද්‍යවරුන්ගේ සංගමය ද හවුල් වෙමිනි.

නිවෙස්වල බල්ලන් බළලුන් ආදී සුරතල් සතුන් සඳහාත්, ගොවිපොළ සතුන් සඳහාත්, සත්වෝද්‍යානවල සතුන් සඳහාත් මෙම ප්‍රතිශක්තිකරණ එන්නත නිපදවා ඇත. සතුන් වෙනුවෙන් නිපදවූ ලියාපදිංචි කළ පළමු කොරෝනා එන්නත වයිරසය මෙය යැයි පැවැසෙයි.

'කොවිඩ් 19' යනු කොරෝනා වයිරස පවුලේ නවතම සාමාජිකයාය. කොරෝනා යනු ක්ෂීරපායී සතුන් අතරේ පැතිරෙන වයිරස විශේෂයකි. 'කොවිඩ් 19' වවුලන් හරහා මිනිසුන්ට ආසාදනය වන්න ඇති බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසා තිබේ. ඒ, වයිරසයේ සුලමුල සොයා කළ විමර්ශනයකින් පසුවය.

මීට පෙර, වාර්තා වූ 'සර්ස්' සහ 'මර්ස්' යනු අඳුන් දිවියන්ගෙන් සහ ඔටුවන්ගෙන් මිනිසුන්ට ආසාදනය වී පසුව, මිනිසුන් අතරේ පැතිරෙන්න වූ කොරෝනා වයිරස වර්ග දෙකකි.

මිනිසුන් හරහා 'කොවිඩ් 19' වයිරසය යළි සතුන්ට ආසාදනය වන අතර සතුන්ගෙන් එය යළි මිනිසුන්ට ආසාදනය වීමේ අවදානමක් පවතී. එසේ වුවහොත් වයිරසය තව තවත් විකෘතිකරණයට ලක් වී බිහිසුණු වනු ඇතැයි බිය පළ කෙරේ. ඒ අනුව, සුරතල් සතුන් සහ ගොවිපොළ සතුන් ආරක්ෂා කර ගැනීමටත්, ඔවුන්ගෙන් වයිරසය යළි ආසාදනය වීම වළක්වා ගැනීමටත් 'කර්නිවැක් කොව්' එන්නත නිපදවූ බව රුසියන් විද්‍යාඥයෝ කියති.

'කොවිඩ් 19' හෙවත් නව කොරෝනා වයිරසයට එරෙහිව, (මිනිසුන් සඳහා) පළමුවෙන් එන්නතක් නිපදවූයේත්, එය ලියාපදිංචි කළේත් රුසියාවය. එම එන්නත 'ස්පුට්නික් 5' ය. අද ලොව රටවල් රැසක 'ස්පුට්නික් 5' එන්නත භාවිතයට ගැනෙයි. මෙය මාත්‍රා දෙකකින් සමන්විත එන්නතකි.

# ආලියාටත් කොරෝනා



**නවදිල්ලියේදීය (එන්.ඩී.ටීවී.)**

**බොලිවුඩ් සුරූපිනී ආලියා බාත් කොරෝනා ආසාදියකු බව තහවුරු වී තිබේ.**

'මා කොරෝනා ආසාදිතයකු බව තහවුරු වුණා. ඒ නිසා මා වෛද්‍ය උපදෙස් මත ස්වයං නිරෝධායනයට යොමු වෙනවා' යැයි 28 හැවිරිදි ආලියා ඉස්ටග්‍රෑම් හරහා ඒ බව දැනුම් දී තිබේ.

ආලියා පසුගිය දිනවල සංජේ ලීලා බන්සාලිගේ 'ගංජුබායි කතියාවාදී' චිත්‍රපටයේ රූගත කිරීම්වලට සහභාගී වූවාය.

අධ්‍යක්ෂ සංජේ ලීලා බන්සාලි ද පසුගිය මාර්තුවේ කොරෝනා ආසාදිතයකු බව තහවුරු විය. 'ගංජුබායි කතියාවාදී' චිත්‍රපටයේ රූගත කිරීම් ආරම්භ වූයේ ඔහු සුවය ලැබීමෙන් පසුවය.

ආලියාගේ පෙම්වතා මෙන්ම, ජනප්‍රිය බොලිවුඩ් නළුවකු ද වන රන්බීර් කපූර් ද පසුගිය මාර්තුවේ 'කොවිඩ් 19' ආසාදිතයකු විය. එම අවස්ථාවේදී ආලියා පීසීආර් පරීක්ෂණයකට යොමු කෙරුණු අතර එහිදී ඇය ආසාදිතයකු නොවන බව තහවුරු විය.

# මියන්මාර ආරක්ෂක අංශ අතින් දරුවන් 43 ක් මියගිහින්

**යැංගොන්හිදීය (රොයිටර්)**

**මියන්මාර ආරක්ෂක අංශ එල්ල කළ වෙඩි තැබීම්වලින් මියගිය මියන්මාර සිවිල් වැසියන් ගණන 536 ක් බවත්, ඒ අතර කුඩා දරුවන් 43 දෙනකු සිටින බවත් 'සේව් ද චිල්ඩ්‍රන්' සංවිධානය පෙන්වා දෙයි.**

මියගිය දරුවන් අතර සිටින ළාබාලම දරුවාගේ වයස අවුරුදු 7 ක් යැයි ද පැවැසෙයි. මියන්මිරයේ සිවිල් වැසියන් මියයෑම සම්බන්ධයෙන් ඇමෙරිකාව ඇතුළු රටවල් රැසක් දිගින් දිගටම මියන්මාර හමුදා ප්‍රධානීන්ට විරෝධය පළ කර ඇති අතර, හමුදා ප්‍රධානීන් සම්බන්ධයෙන් දැඩි පියවර ගැනීමට සූදානමින් වෙයි.

මේ අතර, බලයෙන් පහ කෙරුණු නායිකා අවුන් සාන් සූකී පෙරේදා (1) යළිත් අධිකරණය හමුවේ පෙනී සිටියාය. ඒ, රාජ්‍ය රහස් විදේශවලට හෙළි කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති බැවිනි. සූ කී මෙලෙස අධිකරණයට කැඳවන ලද්දේ, මියන්මාර හමුදා ජුන්ටාව සහ ප්‍රජාතන්ත්‍ර හිතවාදී විරෝධතාකරුවන් අතර ගැටුම් දිනෙන් දින උත්සන්න වෙද්දීය.

හමුදාව සහ විරෝධතාකරුවන් අතර ගැටුම් උත්සන්න වන ආකාරය අනුව, රට තුළ සිවිල් යුද්ධයක් හට ගැනීමේ අවදානමක් නිර්මාණය වී ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය අනතුරු ඇඟවීමක් කර තිබේ.

# පණු බෙහෙත් පෙත්තට කොරෝනා අඩපණ කරන්න බෑ

## ලෝක සෞඛ්‍ය සංවිධානය කියයි

**ජිනීවාහිදීය (රොයිටර්)**

**කොරෝනා ආසාදිතයන්ට ඉක්මණින් සුවය ලැබෙනවා යැයි පවසමින්, දකුණු අප්‍රිකානුවන් භාවිතයට ගන්නා, 'අයිවමැක්ටින්' නමැති පණු බෙහෙත, කොරෝනා මර්දනය කරන ඔසුවක් නොවන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි.**

ලෝක සෞඛ්‍ය සංවිධානය මෙසේ පැවැසුවේ, 'අයිවමැක්ටින්' සම්බන්ධයෙන් විශේෂ නිවේදනයක් නිකුත් කරමින්ය. 'අයිවමැක්ටින්' පණු බෙහෙත් පෙත්තට, කොරෝනා වයිරසය අඩපණ කළ හැකි බවත්, ආසාදිතයන් බොහෝ දෙනකු මෙම පණු බෙහෙත ලබා ගැනීමෙන් ඉක්මණින් සුවය ලබා ඇති බවත් දකුණු අප්‍රිකා මාධ්‍ය වාර්තා කළේ පසුගිය සති අන්තයේය.

'අයිවමැක්ටින්' පණු බෙහෙත කොරෝනා වයිරසයට එරෙහිව ක්‍රියා කරනවාදැයි මෙතෙක් කිසිදු සායනික පර්යේෂණයකින් හෙළි වී නොමැති බව ලෝක සෞඛ්‍ය සංවිධානය පැහැදිලි කර තිබේ.

'කොවිඩ් 19' හෙවත් නව කොරෝනා වයිරසය සුව කරනවා යැයි විශ්වාසයෙන් 'අයිවමැක්ටින්' ලබා ගැනීමෙන් වළකින ලෙසත් ලෝක සෞඛ්‍ය සංවිධානය නිකුත් කළ නිවේදනයේ පැහැදිලිව සඳහන් වෙයි.

දුරදක්න
1790/-
www.AsiriDesigners.lk
071-5689207
(9am-5pm)

මීයන් පලවා හරිනය
www.AsiriDesigners.lk
1790/-
071-5689207
(9am-5pm)
නිවාස සහ වාහන සඳහා...

සංවර්ධන වාසනාව
දිනය : 2021-04-01
දිනුම් වාරය : 423 | වර්ණය : නිල්
සුපිරි ජයමල්ල රු. 11,584,712/-
ඉංග්‍රීසි අක්ෂරය H
ජයග්‍රාහී අංක 29 33 44
දෛව අංකය 7
දිනා ඇති මුළු මුදල රු. 3,600,140/-
මීළඟ සුපිරි ජයමල්ල රු. 11,743,232/-
ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යූනියන් පෙදෙස, කොළඹ 2,
ක්ෂණික ඇමතුම් : 011 4 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම : 011 2 333 778
ස්වයංක්‍රිය තොරතුරු අංකය : 011 4 825 825
www.dlb.lk
ජයග්‍රාහී ටිකට්පත් මාස 6 ක් වලංගුවේ.

අද කෝටිපති අත කෝඩිපති ADA KOTIPATHI
බ්‍රහස්පතින්දා
දිනය : 2021.04.01
දිනුම් වාරය : 1240
වර්ණය : තද නිල්
දිනා ඇති මුළු මුදල රු. 5,546,780/-
ජයග්‍රාහී අංක 01 02 08 29
ඉංග්‍රීසි අක්ෂරය D
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824,
0112 333 778 හෝ 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රිය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

අද කෝටිපති අත කෝඩිපති ADA KOTIPATHI
බ්‍රහස්පතින්දා
දිනය : 2021.04.01
දිනුම් වාරය : 1240
වර්ණය : තද නිල්
දිනා ඇති මුළු මුදල රු. 5,546,780/-
ජයග්‍රාහී අංක 01 02 08 29
ඉංග්‍රීසි අක්ෂරය D
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824,
0112 333 778 හෝ 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රිය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

ශනිදා சனிதா-Shanida
පායන හිරු මෙන් විශ්වාසයි
බ්‍රහස්පතින්දා
දිනුම් වාරය: 3570
දිනය: 2021.04.01
වර්ණය: රතු
දිනා ඇති මුළු මුදල රු. 4,783,560/-
ජයග්‍රාහී අංක 11 28 44 69
ඉංග්‍රීසි අක්ෂරය V
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824,
0112 333 778 හෝ 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රිය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න
www.dlb.lk
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

SUPER BALL සුපර් බෝල් சுப்பர் போல்
දිනුම් වාරය 1414
වර්ණය කොළ
දිනය 2021.04.01
දවස බ්‍රහස්පතින්දා
ජයග්‍රාහී අක්ෂරය සහ අංක V 25 52 61 72
ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ.
දිනා ඇති මුළු මුදල රු. 3,880,800/-
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය: www.dlb.lk
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SB යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රිය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.
www.dlb.lk

1 වැනි පිටුවෙන්....

# අන්තවාදී කල්ලියක ප්‍රබලයෝ දෙදෙනෙක් කාතන්කුඩියේදී අත්අඩංගුවට

## කටාර් හිරෙන් පිටුවහල් කළ 6 දෙනාගේ කල්ලියේ

## වට්ස් ඇප් මගින් දේශන කරලා

(සුජිත් හේවාජුලිගේ)

''වන් උම්මා'' නමැති වට්ස්ඇප් ජාලයක් හරහා අන්තවාදි දේශන හා වීඩියෝ දර්ශන ප්‍රචාරය කළ ප්‍රධාන පෙළේ අන්තවාදී කල්ලියක ප්‍රබල නායකයෝ දෙදෙනෙක් ත්‍රස්ත ක්‍රියා විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් මඩකළපුව, කාතන්කුඩි ප්‍රදේශයේදී ඊයේ (2) උදේ අත්අඩංගුවට ගනු ලැබූහ.

මේ දෙදෙනා කටාර් රාජ්‍යයේ සිට අයිඑස්අයිඑස් මතවාද ප්‍රගුණ කර සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ගේ මතවාදයට පටහැනි ආකාරයේ මතවාදයක් මෙරටේ ඇති කිරීමට කාලයක් තිස්සේ කටයුතු කර ඇතැයි මූලික විමර්ශනවලදී තොරතුරු හෙළි වී තිබෙන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

මෙවැනි අන්තවාදි ක්‍රියාවලට සම්බන්ධ වූ බව කියන හය දෙනෙක් ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමක් අනුව එරටින් පසුගියද පිටුවහල් කරනු ලැබූහ. මෙසේ පිටුවහල් කෙරුණු හයදෙනාගෙන් සිවු දෙනකු ත්‍රිකුණාමලය ප්‍රදේශයෙන් මෙයට පෙර අත්අඩංගුවට ගන්නා ලද අතර ඊයේ අත්අඩංගුවට ගත් මෙම දෙදෙනා ඒ හය දෙනා අතර සිටි අනෙක් අය වෙති.

පාස්කු ඉරුදින ප්‍රහාරයට පෙර සහරාන් හෂීම් මුදහළ අවසන් වීඩියෝ පටය සහ හඬ පටය 'වන් උම්මා' වට්ස්ඇප් ජාලය හරහා සමාජ ගත කර ඇත්තේද ඊයේ අත්අඩංගුවට ගන්නා ලද අන්තවාදී නායකයන් දෙදෙනා බවට තොරතුරු හෙළිවී ඇතැයි පොලිස් මූලස්ථානය පවසයි.

මෙවැනි අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් මෙම හය දෙනා කාලයක් කටාර් රාජ්‍යයේ බන්ධනාගාරගතව සිට ඇතැයි ද වාර්තා වෙයි.

අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුවන් දෙදෙනා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන යටතේ රැඳවුම් නියෝග ලබාගෙන ත්‍රස්ත විමර්ශන ඒකකයේ රඳවාගෙන ප්‍රශ්න කරගෙන යන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කීය.

## මිනිස්කමේ විස්කමක්

# කොරෝනා රෝග බිය නොතකා ඥාති මල්ලිට උපස්ථාන කරන අයියා

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

කොරෝනා වයිරසය ආසාදනය වී අම්පාර විශේෂ කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබමින් පසුවන 11 හැවිරිදි දරුවකුට ඇප උපස්ථාන කිරීමට 18 හැවිරිදි ඔහුගේ ඥාති සොහොයුරෙකු වයිරසය ආසාදනය වීමේ අවදානම ද නොතකා ඉදිරිපත්වී සිටින බව එම මධ්‍යස්ථාන ප්‍රකාශකයෙක් පැවැසීය.

මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානයේ මේ වන විට කොරෝනා වයිරසය ආසාදනය වූ බවට තහවුරු වූ 17 දෙනෙකු ප්‍රතිකාර ලබමින් පසුවන බව එම ප්‍රකාශකයා 'ලංකාදීප'යට කීය.

මෙහි ප්‍රතිකාර ලබන රෝගීන් 16 දෙනකුට ඇප උපස්ථාන කිරීමට කිසිවකු ඔවුන් ළඟ නැවතී නැති අතර මෙම 11 හැවිරිදි ළමයාට පමණක් ඇප උපස්ථාන කිරීමට මෙම ඥාති සොහොයුරා ඉදිරිපත්වී ඇත්තේ රෝගය වැළඳීමේ අවදානම ද නොසලකා ස්වේච්ඡාවෙන්ම බවත් මෙය පැසසුම් සහගත කටයුත්තක් බවත් එම ප්‍රකාශකයා කීය.

මෙම 11 හැවිරිදි ළමයා සහ ඔහුගේ පියා ගමන් කළ යතුරුපැදිය අම්පාර උහන ප්‍රදේශයේ දී මගී බස් රථයක ගැටීමෙන් පියා බරපතළ තුවාල ලබා අම්පාර මහ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටිය දී මියගොස් ඇත.

මෙම මාරක අනතුරින් 11 හැවිරිදි දරුවාගේ එක් අතකට හානි සිදුවී තිබීම නිසා ඔහු ද අම්පාර මහ රෝහලට ගෙන ආ අවස්ථාවේ පී.සී.ආර්. පරීක්ෂණයකට ලක් කිරීමේ දී කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී තිබේ.

ළමයාගේ හානියට පත් අතට වෛද්‍ය ප්‍රතිකාර ලබාදී පසුව අම්පාර කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයට ඔහු යොමු කළ බව අම්පාර මහ රෝහලේ වෛද්‍යවරයෙක් පැවැසීය.

හදිසි අනතුරින් මියගිය මෙම දරුවාගේ පියාගේ අවසන් කටයුතු ඊයේ සිදුකෙරුණු අතර සිය පියා මියගිය බව දරුවා නොදන්නා බව ද කියති.

මියගිය පියා හිටපු හමුද සෙබළකු වන අතර ඔහුගේ දියණියගේ විවාහ මංගල්‍යය තව සති දෙකකින් සිදුකිරීමට සියල්ල සූදනම් කර තිබුණු බව ද දැන ගැනීමට ඇත.

# 'ගම සමඟ පිළිසඳර' උතුරේ පළමුවැන්න අද වවුනියාවේ

(සුජිත් හේවාජුලිගේ)

ගමේ ජනතා ප්‍රශ්න විසඳෙන ගම සමග පිළිසඳර වැඩසටහන් මාලාවේ උතුරු පළාතේ පළමු වැඩසටහන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් වවුනියාව වෙඩිවෛත්‍යකල්ලු ග්‍රාමයේ දී අද (3) පෙරවරු 10.00ට පැවැත්වේ.

මෙය ගම සමග පිළිසඳර වැඩසටහන් මාලාවේ දහත් වැන්නයි.

මෙම වැඩසටහනට දිස්ත්‍රික්කයේ මැති ඇමැතිවරු ප්‍රමුඛ මහජන නියෝජිතයෝ අමාත්‍යාංශ ලේකම්වරු විවිධ ආයතන ප්‍රධානීහු සහ නිලධාරීහු සහභාගි වෙති.

වව්නියාව නගරයේ සිට කිලෝමීටර් 38ක් පමණ දුරින් නැගෙනහිර හා දකුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවියට හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටත්, බටහිරින් නන්දිමිත්‍ර ගම්මානයටත් මායිම්ව වෙඩිවෛත්‍යකල්ලු ග්‍රාම නිලධාරි වසම පිහිටා තිබෙන අතර බෝගස්වැව 1, බෝගස්වැව 2, කම්බිලිවැව, වෙඩිවෛත්‍යකල්ලු, කෝවිල් පුලියන්කුලම සහ වෙහෙරතැන්න ගම්මාන ඊට අයත්ය. පවුල් 478 කින් සමන්විත වෙඩිවෛත්‍යකල්ලු ග්‍රාමයේ ජනගහණය 1520කි. වී සහ හේන් ගොවිතැන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වේ.

වෙඩිවෛත්‍යකල්ලු හා අවට ගම්මානවල ජනතාව දිගු කලක සිට පොදු ප්‍රශ්න රැසකින් පීඩා විඳිති. අධ්‍යාපන සහ සෞඛ්‍ය ගැටලු ප්‍රධාන තැනක් ගනී. 2010 වසරින් පසු සංවර්ධනය නොවූ අතුරු මාර්ග, නිවාස, විදුලිය ඇතුළු යටිතල පහසුකම් ඌනතාව, පානීය සහ වගා ජල හිඟය, කෘෂිකාර්මික ගැටලු මෙන්ම වන අලි තර්ජනය ඇතුළු ප්‍රශ්නවලට ද ජනතාව මුහුණ දී සිටිති. ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුවට විසඳුම් ලබා ගැනීම, වැව් සහ ඇළ වේලි සංවර්ධනය, බෝගස්වැව, රෝහල වැඩිදියුණු කිරීම පොහොර ගබඩාවක් ස්ථාපනය කිරීම එම ජනයා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් අතර වෙයි.

බදුල්ල දිස්ත්‍රික්කයෙන් 2020 සැප්තැම්බර් 25 වැනිදින ''ගම සමග පිළිසඳර'' වැඩසටහන ආරම්භ විය. මාතලේ රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, පොලොන්නරුව, කළුතර, මොනරාගල, කෑගල්ල, මහනුවර, පුත්තලම, ත්‍රිකුණාමලය, කුරුණෑගල ගාල්ල, නුවරඑළිය සහ මාතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ගම සමග පිළිසඳර වැඩ සටහන් මෙයට පෙර සංවිධාන කෙරිණි.

# දඹුල්ලෙන් ඇල්ලූ පොල් තෙල් කන්ටේනරයටත් ගබඩාවටත් සීල්

(දඹුල්ල කාංචන කුමාර ආරියදාස)

දඹුල්ලෙන් පෙරේද (01) අත්අඩංගුවට ගත් විදෙස් පොල්තෙල් කන්ටේනරයට සහ ඒවා බාමින් තිබූ පොල් තෙල් ගබඩාවකට දඹුල්ල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා සහ මාතලේ දිස්ත්‍රික් ආහාර හා ඖෂධ පරීක්ෂකවරයා 02 දින ඊයේ 02 මුද්‍රා තැබූහ.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය පිටුපස ගබඩාවකට පොල්තෙල් බාමින් තිබූ කන්ටේනර් රථයක් දඹුල්ල පොලිස් බාරයට පෙරේද 01 රාත්‍රියේ ගනු ලැබුවේ දඹුල්ල නගරාධිපති ජාලිය ඕපාත මහතාට ලැබුණ තොරතුරකට අනුවය.

දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක එස්.පී. ඉදිරි එදිරිසිංහ මහතා ගේ උපදෙස් පරිදි මෙහි තොරතුරු බී වාර්තාවක් මගින් දඹුල්ල වැඩ බලන මහේස්ත්‍රාත් නිලූකා විජේතිලක මහත්මියට ඊයේ දහවල් ඉදිරිපත් කරනු ලැබීය.

වැඩබලන මහේස්ත්‍රාත් නිලූකා විජේතිලක මහත්මිය දඹුල්ල මහජන සෞඛ්‍යය පරීක්ෂක වරයාට නියෝග කර ඇත්තේ මෙහි අඩංගු පොල්තෙල් කොටස් (සාම්පල්) ලබාගෙන ඒවා අයි.ටිඅයි (ITI) ආයතනය වෙත යවා වාර්තාවක් ලබාගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ය.

ඒ අනුව දඹුල්ල මහනගර සභාවේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක ප්‍රියන්ත ද සිල්වා මහතා මාතලේ දිස්ත්‍රික් ආහාර ඖෂධ පරීක්ෂක එම්.එල්. ජයවීර මහතා ඇතුළු කණ්ඩායමක් දඹුල්ල පොලිසියට පැමිණ පොලිස් භූමියේ නවතා තබා තිබූ පොල් තෙල් පිරවූ කන්ටේනර් රථයට මුද්‍රා තැබුවේය.

පසුව මෙම කණ්ඩායම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය පිටුපස මෙම පොල් තෙල් ගබඩාව පරීක්ෂා කර එහි ගබඩාවේ කරාම දෙකකට මුද්‍රා තැබීය.

මහජන සෞඛ්‍ය පරීක්ෂක ප්‍රියන්ත ද සිල්වා මහතා පැවසුවේ අධිකරණ නියෝගය පරිදි පොල්තෙල්වල කොටස් ලබාගෙන කොළඹට යැවීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බවය.

නිවාඩු දින දෙකක් ඇති නිසා සඳුද උදෑසන මෙහි පොල්තෙල්වල කොටස් නැවත ලබා ගන්නා බවද කීය. එතෙක් එම පොල් තෙල්වල ආරක්ෂාව සඳහා මුද්‍රා තැබූ බව ද හෙතෙම පැවසීය.

මෙහිදී මතලේ දිස්ත්‍රික් ආහාර හා ඖෂධ පාලන පරීක්ෂක එම්.එල් .ජයවීර මහතා පැවසුවේ මෙම පොල් තෙල් තොග ලංකාවට ගෙන්වා ඇත්තේ පිලිපීන රටෙන් බවය. කන්ටේනර් තුනක පොල්තෙල් කිලෝ දෙලක්ෂ එකොලොස් දහසක් පමණ ඇති බවද මෙම කන්ටේනර් රථයේ පොල්තෙල් කිලෝ පනස් දහසකට අධික ප්‍රමාණයක් තිබිය හැකි බවට අනුමාන කරන්නේ යැයිද ඒ මහතා පැවසීය .

පොල් තෙල් තොග වරායෙන් එළියට ගනිද්දී එහි තත්ව වාර්තාවක් තිබිය යුතු බවත් ගෙන්වූ සමාගම සතුව එම වාර්තාව පවතින බව ඔවුන් දැනුම් දී තිබුණද මෙතෙක් තමන් වෙත එම තත්ව වාර්තාව ලැබී නැති බවත් ඒ මහතා කීය.

# චීන එන්නත චීනුන්ට අනිද්දා සිට

(මුදිතා දයානන්ද)

කොවිඩ් මර්දනයට චීනෙන් සැපයූ සිනෝෆාම් එන්නත චීන ජාතිකයන්ට ලබාදීම අනිද්ද සිට ආරම්භ කරන බව කොළඹ නගර සභා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෛද්‍ය රුවන් විජේමුණි මහතා 'ලංකාදීප'යට පැවසීය.

චීන ජාතිකයන් හාරදහසකට එන්නත ලබාදීමට සැලසුම් කර ඇති බව ද විජේමුණි මහතා පැවසීය.

අස්ට්‍රාසෙනෙකා කොවිඩ් මර්දන එන්නත පළමු මාත්‍රාව ලබාගත් අයට දෙවැනි මාත්‍රාව ලබාදීම මෙම මස 19 වැනිද සිට ආරම්භ කරන බව ද ඔහු පැවසීය.

කොළඹ නගරසභා බල ප්‍රදේශය තුළ කොවිඩ් මර්දන එන්නත ලබාදිය යුතු ජනගහනය 350,000ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇති බව ද එයින් මේ දක්වා එන්නත ලබා දී තිබෙන්නේ 1,07,338කට බව ද එයින් 28,400ක් හැටට වැඩි පුරවැසියන් බව ද ඔහු පැවසීය.

කොළඹ අවුරුදු හැටට වැඩි පුරවැසියන් 95,000ත් 100,000ත් අතර ප්‍රමාණයක් ජීවත් වන බව ද එම ප්‍රමාණයට සම්පූර්ණයෙන්ම පළමු මාත්‍රාව ලබාදිය හැකි පරිදි එන්නත් තමන් සතුව ඇති බව ද සමස්ත කොළඹ ජනගහනය එන්නත් කරණයට ලක් කිරීම සඳහා පළමු මාත්‍රාව සඳහා පමණක් එන්නත් තවත් ලක්ෂ දෙහමාරක් පමණ අවශ්‍ය වන බව ද විජේමුණි මහතා පැවසීය.

එන්නත් කරණය ආරම්භ කළ මුල් කාලයේ දී දිනකට එක් මධ්‍යස්ථානයක දී දහසක පමණ පිරිසකට එන්නත් ලබාදුන්න ද මේ වන විට ජන සහභාගීත්වය අඩුවී ඇති බව ද එය දිනකට විසිපහක් තිහක් වැනි ප්‍රමාණයක් දක්වා පහත වැටී ඇති බව ද ඔහු පැවසීය. විශේෂයෙන්ම වතු ආශ්‍රිත හා දුප්පත් ජනතාවගේ සහභාගිත්වය ඉතාමත් අවම වී ඇති බව ද ඔහු පැවසීය.

# බසයක් එනතුරු පාරේ සිටින වයසක කතුන් යතුරුපැදියේ නංවාගෙන මාල කඩයි

## එසේ මාල 3ක් කැඩූ සැකකරු කොටුවෙයි

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

බස් රථයක් බලාපොරොත්තුවෙන් මාර්ගයේ රැඳී සිටින වයස්ගත හා මැදිවියේ කාන්තාවන් සිය යතුරුපැදියේ නංවාගෙන ගොස් අතරමගදී එම කාන්තාවන්ගේ ගෙල බැඳි රන් මාල කඩාගෙන පලා යන බව කියන 27 හැවිරිදි තරුණයෙකු පෙරේද (01) අත්අඩංගුවට ගත් බව මාදම්පේ පොලිසිය කියයි.

මෙසේ සැකපිට අත්අඩංගුවට ගනු ලැබ ඇත්තේ හලාවත පොලිස් වසමට අයත් මුගුණුවටවන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෙම පුද්ගලයා හලාවත පොදු වෙළෙඳපොළ ඇතුළු ප්‍රදේශ ගණනාවක සති පොළවල බඩු මුට්ටු විකුණන අතරවාරයේ මේ ආකාරයට මාල කැඩීමද කර ඇති බව මාදම්පේ පොලිසියේ නිලධාරියෙක් 'ලංකාදීප'යට පැවැසීය.

මාදම්පේ පොලිස් වසමේ පදිංචි 85, 65 සහ 52 හැවිරිදි කාන්තාවන් තිදෙනෙකු ගෙල පැළඳ සිටි රුපියල් 1,39,000 ක් පමණ වටිනා රන් මාල 03 ක් කඩාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු සැකකරුගෙන් මෙතෙක් කරන ලද ප්‍රශ්න කිරීම්වල දී අනාවරණය කර ගැනීමට හැකිවිණි යැයි පොලිසිය කියයි.

එම රන් මාල 3 හලාවත බසාර් වීදියේ ස්වර්ණාභරණ වෙළෙඳ සැලකට විකුණා තිබිය දී පොලිසිය සොයාගෙන ඇත.

මාදම්පේ නගරයේ වෙළෙඳ සැලක සවිකර තිබූ සීසීටීවී කැමරාවක රූප රාමු පෙළක් පරීක්ෂා කර බැලීමේ දී පුද්ගලයකු 65 හැවිරිදි කාන්තාවක සිය යතුරුපැදියේ නංවාගෙන යන අයුරු දැක ඒ ඔස්සේ පරීක්ෂණ පවත්වා ඔහු අත්අඩංගුවට ගත් බව පොලිසිය කියයි.

වයස්ගත කාන්තාවක් අසලට පැමිණ මටත් ඔය වයසේ අම්මා කෙනෙක් තමා ඉන්නේ කියා ඔහු කාන්තාවන් සිය යතුරුපැදියේ නංවාගෙන ඇති බව ද කියති.

මාදම්පේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.පී.ආර්. අබේනායක මහතා විශේෂ උපදෙස් මත පරීක්ෂණ පවත්වා සැකකරු අත්අඩංගුවට ගනු ලැබුවේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක එම්.ආර්.ටී.ආර්. මධුරංග උපපොලිස් පරීක්ෂක චමිල, පොලිස් සැරයන්වරුන් වන විජේසිරි 31596, චමින්ද 33493, පොලිස් කොස්තාපල්වරුන් වන තිලකරත්න 44024, චානක 67286 සහ කාන්තා පොලිස් කොස්තාපල් චතුරංගනි 7217 යන මහත්ම මහත්මීන් විසිනි.

# රිය අනතුරුවලින් එක දිනකදී 12ක් මරුට

## වැඩිදෙනෙක් පදිකයෝ

(සුජිත් හේවාජුලිගේ)

පුද්ගලයන් 12 දෙනකු දිවයින පුරා පෙරේද (1) දිනයේ සිදුවූ රිය අනතුරුවලින් මියගොස් ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

මියගොස් ඇති පිරිසෙන් වැඩි දෙනකු පදිකයන් බව ද ඔහු කීය.

එම අනතුරුවලින් මියගොස් ඇති පදිකයින් ගණන පහකි.

මෙයට අමතරව ත්‍රිරෝද රථවල ගමන් ගත් සිවු දෙනෙකු, යතුරුපැදිකරුවන් දෙදෙනකු හා ලොරියක ගමන් කළ පුද්ගලයකු ද රිය අනතුරුවලින් මියගොස් ඇතැයි පොලිස් මූලස්ථානය පවසයි.

තල්දූව අමිතිරිගල මාර්ගයේ තල්දූව සතිපොළ අසල දී සිදූව රිය අනතුරකින් 20 හැවිරිදි තරුණියක මියගොස් ඇත. ටිපර් රථයක ගැටීමෙන් ඇය මෙසේ මියගොස් ඇතැයි පොලිසිය පවසයි.

මියගිය තරුණිය අවිස්සාවේල්ලේ පදිංචිකාරියකි.

සිද්ධිය සම්බන්ධයෙන් එම ටිපර් රථයේ රියදුරු පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ සිටී.

# අලුත් අවුරුදු නෑගම් යෑමත් සීමාකරයි

## පවුලේ උත්සවයක් ලෙස සමරන්න සෞඛ්‍ය උපදෙස්

(සුජිත් හේවාජුලිගේ)

අලුත් අවුරුදු සමයේ නෑගම් යෑමත් සීමා කළ යුතු බව එම උත්සව සමය වෙනුවෙන් නිකුත් කරනු ලැබ ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ මාලාවේ සඳහන් වෙයි.

එසේම එළඹෙන සිංහල - හින්දු අලුත් අවුරුද්ද පවුලේ උත්සවයක් ලෙස සමරන ලෙසත් එම මාර්ගෝපදේශ මාලාව මගින් දැනුම් දී ඇත.

මේ අතර අවුරුදු සමයේදී සාප්පුවලට යෑමේදී ජනතාව අනුගමනය කළ යුතු සෞඛ්‍ය නීති පිළිබඳවත් ඒ සාප්පු හිමිකරුවන් හා කළමනාකරුවන් ක්‍රියාත්මක කළ යුතු සෞඛ්‍ය වැඩපිළිවෙළ පිළිබඳවත් මේ මාර්ගෝපදේශ මාලාව මගින් දැනුවත් කර ඇතැයි කෝවිඩ් 19 පැතිරීම පාලනය කිරීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී යුද හමුදපති ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය.

අවුරුදු උත්සව තහනම් නැතත් සමහර තරග ඉසව් සුදුසු නොවන බවටද එම මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් වන්නේ යැයි යුද හමුදපතිවරයා කීය.

මුහුණ ආවරණ පැළඳ නිසි දුරස්ථභාවය රැක ගනිමින් ඒ උත්සව පවත්වන්නැයිද යුද හමුදපතිවරයා ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

# හිඟමනේ යන අම්මව බාරගන්න පොලිසියට නොආ පුතාට නඩු

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

මාදම්පේ නගරයේ සිඟමනේ යෙදෙන කාන්තාවක ඇයගේ පුතාට බාරදීමට මාදම්පේ පොලිසියට පැමිණෙන ලෙස දැනුම්දී තිබියදී මව බාරගැනීමට නොපැමිණි නිසා ඔහුට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව පොලිසිය කියයි.

හලාවත, බංගදෙණිය ප්‍රදේශයේ පදිංචි 45 වන වියේ පසුවන මෙම කාන්තාව මාදම්පේ නගරයට පැමිණීමට පෙර වසර ගණනාවක් නාත්තන්ඩිය නගරයේ සහ නාත්තන්ඩිය දුම්රිය ස්ථානය අසල සිඟමනේ යෙදී ඇති බව ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් ලංකාදීපයට පැවසීය.

මාදම්පේ නගරයේ සිඟමනේ යෙදෙන මෙම කාන්තාවගෙන් පොලිස් නිලධාරින් තොරතුරු විමසීමේදී තම පුතා ගැන තොරතුරු හෙළි කර තිබෙන බව කියති.

එම තොරතුරු අනුව ඇයගේ පුතාට මව බාර ගැනීමට පැමිණෙන ලෙස දැනුම් දුන්නත් ඔහු මව බාර ගැනීමට නොපැමිණි නිසා මේ සම්බන්ධයෙන් හලාවත අධිකරණයට කරුණු වාර්තා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පොලිසිය කටයුතු යොදගෙන යයි.

සිඟමනේ යෙදෙන කාන්තාවක සම්බන්ධයෙන් මානුෂිකව සිතා පොලිසියේ නිලධාරින් මෙම සිද්ධියට මැදිහත් වී ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.

මාදම්පේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.පී.ආර්. අබේනායක මහතාගේ විශේෂ උපදෙස් මත ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂිකා සඳමාලි මහත්මිය ප්‍රධාන පොලිස් කණ්ඩායමක් මේ සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කර ඇත.

හලාවත කොට්ඨාසය බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් රෝහණ ගමගේ සහ සහකාර පොලිස් අධිකාරි පර්සි මයිකල් යන මහත්වරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකරගෙන යයි.












# අලි-මිනිස් ගැටුමට පහසු විසඳුම්

**මීට වසර සියයකට පෙර ශ්‍රී ලංකාවේ වන අලි 20,000 කට වැඩි ගණනක් වාසය කර ඇති බවට දත්ත සොයා ගැනීමට තොරතුරු මුලාශ්‍ර පවතී. එම වන අලි ගහණය අද වන විට 6,000 කට පමණ අඩු වී ඇත.**

ග්‍රාමීය ප්‍රදේශවල ජනගහනය අඛණ්ඩව වර්ධනය වන අතර මේ නිසාම වනජීවී වාසස්ථාන තවදුරටත් ආක්‍රමණය වෙමින් පවතියි. ඒ හේතුවෙන් වන සතුන් සහ මිනිසුන් අතර ඇතිවන ගැටුම්කාරී තත්ත්වය ද වැඩිවෙමින් නොනවතින අරගලයක් බවට පත් වී ඇත.

කෘෂිකර්මාන්තය, සංවර්ධන කටයුතු සහ වෙනත් මානව සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩක් ලබා ගැනීමට වන අලි සමග සටන් කිරීමට මිනිස්සු පෙළඹී සිටිති. ඒ නිසාම අලි ඇතුන්ටද මාරාන්තික සටනක යෙදෙන්නට සිදු වී තිබේ.

මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ මේ වන විට වාර්ෂිකව මිනිසුන් 80 ක් පමණ ද අලි ඇතුන් 250 ක් පමණ ද සිය ජීවිතයෙන් සමුගැනීමයි. 2019 වර්ෂයේදී අලි ඇතුන් 361 ක් ද මිනිසුන් 100 ට ආසන්න ගණනක්ද අලි මිනිස් ගැටුම හේතුවෙන් මියගොස් ඇති බව සඳහන් වෙයි. මිනිසා සිය අභිමතාර්ථ ඉෂ්ටසිද්ධ කරගැනීම සඳහා ඉතා වේගයෙන් වනාන්තර එළිපෙහෙළි කිරීමත් වගා කටයුතු සඳහා භූමිය ආක්‍රමණය කිරීමත් හේතුවෙන් වන අලින්ට නිදහසේ ජීවත්වීමට ඇති අවකාශය ටිකෙන් ටික අඩු වෙමින් පවතී.

ඕනෑම රටක පාරිසරික සමතුලිතභාවය පවත්වාගෙන යාම සඳහා සියයට35 ක අවම වන වැස්මක් තිබිය යුතු වුවත් අවාසනාවකට ශ්‍රී ලංකාවේ වර්තමානය වන විට එය සියයට 18ත් සියයට 20 ත් අතර ප්‍රමාණයකට අඩුවී ඇත. 1800 මුල්භාගයේ දී ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රතිශතය සියයට 70 පමණ වූ අතර 2015 වන විට එය සියයට 29 ක් දක්වා ප්‍රමාණයකට අඩු වී ඇති බව සඳහන් වෙයි.

මේ හේතුව මත වන අලි සිය වාසස්ථාන අහිමිවීමේ දැඩි තර්ජනයකට මුහුණපා සිටිති. ඒ නිසාම ඔවුහු සිය නිජබිමේ අයිතිය තහවුරු කර ගැනීමට නිරන්තර අරගලයක යෙදෙති. එහි ප්‍රතිඵලය වන්නේ නිරපරාදයේ මිනිස්සුන්ගේ ජීවිත මෙන්ම අලි ඇතුන් ගේ ජීවිත ද විනාශ වීමයි.

**මිනිස් ක්‍රියාකාරකම්**

- ඉවක් බවක් නැතිව කරන වන විනාශය
- වගා කටයුතු මුවාවෙන් භූමිය එළිපෙහෙළි කිරීම
- අනවසර හේන් ගොවිතැන (මහා පරිමාණයෙන් සිදුකරන)
- වගා කටයුතු සඳහා අලිමංකඩවල් යොදා ගැනීම
- අධ්‍යනයකින් තොරව වගා කටයුතු කිරීම - අලි ප්‍රහාරවලට ලක්වන පරිදි නිසි අධ්‍යනයකින් තොරව වගා කටයුතු කිරීම.

**උදා :** කොමඩු, බඩඉරිඟු, උක් වැනි බෝග අලි ඇත්තු ඉතාමත් ප්‍රිය කරති. ඒ නිසා ඔවුහු ඉක්මනින් ඒ භෝග අනුභව කිරීමට පැමිණෙති. ඒවා වගා කර තිබෙන්නේ අලි ඇතුන්ට විනාශ කිරීමට හැකිවන පරිදිය. නිසි ක්‍රමවේදයකට අනුව නොවේ.

- වගා කටයුතු ආරක්ෂා කර ගැනීම සඳහා හිංසාකාරී ලෙස අලි ඇතුන්ට උගුල් ඇටවීම

උදා: හක්කපටස් යොදාගෙන අලි විනාශ කිරීම, විදුලිය යොදාගෙන අලි මරණයට පත්කිරීම, තුවක්කු බැඳීම, අලින්ට වෙඩි තැබීම ඇතුළු නොයෙකුත් හිංසාකාරී ක්‍රම යොදාගෙන අලි පළවා හැරීම හෝ මරණයට පත්කිරීම. මේ නිසා වන අලි ඉතා දරුණු ලෙස කෝපයටත් හිංසාකාරී ලෙස හැසිරීමටත් පෙළඹී සිටිති.

**අලි ඇතුන් සහ මිනිසා**

අතීතයේ සිටම මිනිසුන් සහ අලි ඇතුන් අතර ඉතා සුහදශීලී අන්‍යොන්‍ය සම්බන්ධයක් තිබූ බව අපි දනිමු. විශේෂයෙන්ම පෙරහැරවලට අලි ඇතුන් විශාල ලෙස යොදාගෙන තිබේ. සංස්කෘතිකමය පැත්තෙන් බැලුවත් යම් යම් ආගමික සංකල්ප අනුව බැලුවත් අලි ඇතුන්ට ඉතා පූජනීයත්වයෙන් සැලකූ බව දැකගන්නට හැකිය. ඒ වගේම විවිධ සංවර්ධන කටයුතු සඳහා මෙන්ම ඉදිකිරීම් කටයුතු සඳහාද අතීතයේ අලින්ගෙන් වැඩ ගෙන තිබේ.

අලි-මිනිස් ගැටුම ආරම්භ වන්නේ මිනිසුන්ගේම යම් යම් ආත්මාර්ථකාමී කටයුතු නිසා බව මිනිසා විසින්ම අවබෝධ කරගත යුතු කාලය දැන් එළඹී ඇත. කවදාවත් අලි ඇතුන් මිනිසුන්ගේ භූමි ආක්‍රමණය කිරීමට පැමිණියේ නැත. මිනිස්සු අලි ඇතුන්ගේ භූමි ආක්‍රමණය කර ඔවුන්ට තිබෙන භූමි ප්‍රමාණය ටිකෙන් ටික අල්ලා ගත්හ. සංවර්ධනය මුවාවෙන් ගස්වැල් කපාදමා වනාන්තර විනාශ කිරීමෙන් නොනැවතුණු මිනිසුන් වනජීවීන් ද අමු අමුවේ විනාශ කරන තත්ත්වයකට පත්වෙමින් තිබේ.

ඒ නිසා මිනිසා ඇති කරගන්නා ලද මේ මහ ප්‍රශ්නකාරී තත්ත්වයට විසඳුම් මිනිසා විසින්ම හිතකර ආකාරයෙන් සොයා ගත යුතුව ඇත. එම විසඳුම් දෙපාර්ශවයටම සාධාරණ විසඳුම් විය යුතුය.

**විසඳුම් සහ මඟපෙන්වීම්**

අලි ඇතුන් ඉතා බුද්ධිමත් ජීවීන් කොට්ඨාසයක් වන බැවින්, මෙම සමහර ක්‍රමෝපය තමන්ට හානියක් නොවන බව ඔවුන්ට ඉක්මනින් ඉගෙන ගත හැකිය. එබැවින් ගොවීන් මෙම උපක්‍රම, විසඳුම් ක්‍රම වරින් වර වෙනස් කරමින් භාවිත කිරීම ඉතා වැදගත්ය. මෙවැනි විවිධ ක්‍රමෝපාය භාවිත කිරීමෙන් අලි ඇතුන් ගම් වැදීම පාලනය කර ඔවුන් කැලෑව තුළම රඳවා තබා ගැනීම කළ හැකිය. එහිදී අලි ඇතුන්ට ප්‍රමාණවත් තරම් කෑම බීම කැලෑ තුළ තිබීම ඉතා වැදගත්ය. තිබෙන වන ගහණය අප ආරක්ෂා කරගැනීම වැදගත් වන්නේ ඒ නිසාය. මීට අමතරව අලුතින් ගස් වැවීමද වැඩි වශයෙන් කළ යුතුව ඇත.

**ප්‍රජා සහභාගිත්ව / ප්‍රජා මූලික සංරක්ෂණ ක්‍රම**

මෙමගින් වඩා ඉහළ ගැටුම් සහිත ප්‍රදේශවල ග්‍රාමීය ගොවීන්ට අලි ඇතුන් සමග සුහදව, එකඟව ජීවත් විය හැකි පරිසරයක් ක්‍රමයෙන් ගොඩනගා ගත හැකිය.







**මී මැසි වැට (Beehive Fences)**

අලි ඇතුන් ගම්මානවලට කඩා වැදීම හෝ බවභෝග විනාශ කිරීම පාලනය කරගැනීම/ පැමිණීම සීමා කර ගැනීම සඳහා මී මැසි වැට යොදා ගත හැකිය. මෙය අලියාටත් හානි නොවන ගමේ ගොවියාටත් අමතර වාසි සලසන පරිසර හිතකාමී තිරසාර ආදායමක් ලබාගත හැකි ක්‍රමයකි.






ජායාරූපය 1

අලි ඇතුන් මී මැස්සන්ගේ පැමිණීමට හා ශබ්දයට බියක් දක්වන බැවින් මෙම මී මැසි වැට අලි ඇතුන් ගම් වැදීම පාලනය කිරීමට සහ ඔවුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට යොදා ගත හැකි ස්වාභාවික ක්‍රමවේදයකි.

**මී මැසි වැට සාදගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය**




- මී මැසි පෙට්ටි
- ලී කණු
- අවශ්‍ය ප්‍රමාණයට කම්බි
- අවශ්‍යතාව අනුව පිදුරු සහිත වහලයක්

අක්කරයක වගා භූමියක් වට කිරීම සඳහා අවශ්‍ය වන්නේ මී මැසි පෙට්ටි ජනපද 12 ක් හා බොරු මී මැසි පෙට්ටි (Dummies) 12 ක් පමණය.

**මී මැසි පෙට්ටි සවිකරන ආකාරය.**

අලි ඇතුන්ගේ පැමිණීම වැළැක්වීමට වැටක් ලෙස මී මැසි පෙට්ටි කම්බියක් ආධාරයෙන් එකිනෙකට සම්බන්ධ කරමින් ගොඩනැගීම ඡායාරූපය 1 න් දැක්වෙන ආකාරයට කළ හැකිය.

**2. බුද්ධිමය ගොවිපොළ සංකල්පය (Intelligent Farms)** මෙහිදී තමන් වගාවට යොදාගන්නා භූමිය නිසි පරිදි තෝරා ගැනීම කළ යුතුය. තමුන් වගා කරන්නේ කුමක්ද යන්න පළමුවෙන්ම තීරණය කළ යුතුය. එහි දී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න.

- අලිමංකඩවල සහ ඒ ආශ්‍රිතව වගා කටයුතු , ඉදිකිරීම් කටයුතු කිරීමට යාමෙන් වළකින්න. ඒ වගේම අලි ඇතුන් ජලය පානය කිරීමට යන මාර්ගයේ වගා කටයුතු නොකළ යුතුයි.
- අලි ඇතුන් වගාබිම්වලට හානි කරන්නට පෙළඹෙන්නේ ඔවුන්ට ජීවත්වීමට පැවැත්මට අවශ්‍ය තරම් භූමිය, ආහාර වගේම ඔවුනට හිමි පාරිසරික තත්ත්වය අහිමිවීම නිසාය.
- ගොවිබිම් ආරක්ෂාව සඳහා අලි හානි අවමකර ගැනීම/වැළැක්වීමේ ක්‍රම ඒකාබද්ධ කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය.

ස්වාභාවික වෘක්ෂලතා කලාප පවත්වාගෙන යාම ඉතාමත් ප්‍රතිඵලදයකය. ප්‍රදේශයට ගැළපෙන මල් වර්ග, ගස් වර්ග වැවීම මඟින් පරාගනය නිසා බෝග අස්වැන්න ඉහළ නැංවීමට උපකාරී වේ.

සූරියකාන්ත මල්, ඉඟුරු, මිරිස්, දෙහි දෙඩම් වැනි බෝග වලට අලි ඇතුන් එතරම් කැමැත්තක් දක්වන්නෙ නැත. ඔවුන් බලන්නේ හැකි තරම් ඒවා මඟ හැරීමටය. ඒ නිසා ඔබ වගා කිරීමට තෝරා ගන්නා භූමිය මායිමේ මෙම ශාක වැවීමෙන් අලි ඇතුන්ගෙන් වගා භූමියට සිදුවීමට හැකි හානිය අවම කර ගැනීමටත් අලි ඇතුන් පැමිණීම වළක්වා ගැනීමටත් හැකිවේ.

අලි ඇත්තු බඩඉරිඟු, මඤ්ඤොක්කා, බෝංචි, මුං ඇට, කොමඩු, උක් වැනි බෝග අනුභව කිරීමට වඩා ප්‍රියතාවක් දක්වති. ඔබ මෙවැනි බෝග වගා කිරීමට බලාපොරොත්තු වෙනවා නම් ඔබ තෝරා ගන්නා භූමියේ හෝ ඔබ නිවස ආශ්‍රිතව වගා කරනවා නම් ඒවා හැකි තරම් ඔබ නිවස ආසන්නයේ හෝ ඔබ තෝරාගන්නා වගා භූමියේ මධ්‍යයට වන්නට වගා කිරීම සුදුසුය.

ඒ නිසා පෙරකී දෙඩම්, දෙහි, ඉඟුරු, මිරිස් වැනි බෝග ඔබ තෝරාගන්නා භූමියේ මායිම වටේට වගා කිරීමට වග බලා ගත යුතුය. එවිට අලි ඇතුන් ගේ පැමිණීම සීමා වන අතර ඔබගේ වගාවට සිදුවිය හැකි හානිය ද වළක්වා ගත හැකිය. මෙවැනි බහුවිධ බෝග වර්ග වගා කිරීම හේතුවෙන් ඔබට අතිරේක ආදයමක් ද මෙමගින් ලබා ගත හැකි අතර අස්වැන්නද වැඩිකර ගැනීමට පුළුවන.මෙම ක්‍රමය ගොවීන්ට මෙන්ම අලි ඇතුන්ගේ පැවැත්මට ද වඩා හිතකරය.

**3 ජෛව වැට ( Bio-Fences)**

අලි ඇතුන්ගෙන් තම වගාව ආරක්ෂා කර ගැනීමට ජෛව වැටක් නිර්මාණය කිරීම දිගුකාලීන විසඳුම් ලැබෙන පිරිවැය අඩු විකල්ප ක්‍රමයකි. මෙම ජෛව වැට ඉදිකිරීමෙන් අලි ඇතුන් ගේ ආක්‍රමණවලින් මිනිස් ජීවිත බේරාගැනීමට මෙන්ම ඔවුන්ගේ වගා භූමි ද ආරක්ෂා කර ගැනීමට අවස්ථාව සැලසේ.

ජෛව වැට සඳහා යොදා ගැනීමට,

- තල් ගස්
- දෙහි පඳුරු
- දෙඩම් ගස් යොදා ගත හැකිය.

ජෛව වැට ඉදිකර නිසි ප්‍රතිඵලයක් ගැනීමට අවුරුදු කිහිපයක් ගත වේ. නිසි පරිදි ස්ථාපිත ජෛව වැටකින් අලින්ගෙන් සිදුවන හානිය වළක්වා ගැනීමට හැකිය. ඒ වගේම මෙවැනි ජෛව වැටක් නඩත්තු කිරීමට විශාල ප්‍රයත්නයක් දැරීමට අවශ්‍ය නොවේ. මෙම ජෛව වැට අතරින් පතර තවත් අවශේෂ බෝග අවශ්‍ය නම් වගා කළ හැකිය. නිසි පරිදි ස්ථාපිත වූ ජෛව වැටක් අලි ඇතුන්ට ලෙහෙසියෙන් කඩා බිඳ දැමීමට නොහැකි නිසා මෙය දිගුකාලීන තිරසාර විසඳුමක් ලෙස යොදගත හැකිය.

**තල් වැට වැවීම - (Palmyra Palm Tree Fence)**


තල් වැටක් ඉදිකිරීම අලි ඇතුන්ගෙන් තම වගා ආරක්ෂා කර ගැනීමට පමණක් නොව අමතර ආදයමක් ලැබීමට ද ගොවියන්ට ලැබෙන හොඳ අවස්ථාවකි. මෙහිදී ගොවියාත් දිනන අතර අලි ඇතුන් ද ආරක්ෂා වෙයි. මෙය දෙපාර්ශවයටම වාසිදයක ක්‍රමයකි.


**තල් වැට වැවිමෙන් (ඉදිකිරීමෙන්) ලැබෙන ප්‍රතිලාභ**

- පරිසර හිතකාමී වීම
- කිලෝමීටර් එකක තල් වැටකින් තල්ගෙඩි ටොන් 270 ලබාගැනීමේ හැකියාව ලැබේ.
- තල් ගස ආශ්‍රිත විවිධ නිශ්පාදන රාශියක් කළ හැකි වීම (තල් හකුරු, පැණි, තල් රා, විවිධ අත්කම් නිෂ්පාදන)
- ගොවියන්ට අමතර ආදායමක් ලබාගත හැකිවීම.
- සුළං මුවාවක් විදියට භාවිත කළ හැකිවීම
- පාංශු ඛාදනය වළක්වා ගත හැකිවීම
- තල්වැට වඩා ඉහළ උෂ්ණත්වයකට ඔරොත්තු දෙන නිසා දිගුකාලීනව භාවිත කිරීම වඩා සුදුසු ක්‍රමයකි.

**අලි ඇතුන් පලවා හැරීමට හා වගාභූමි හානි වළක්වා ගැනීමට භාවිත කළ හැකි වෙනත් සම්ප්‍රදයික හා නවීන ක්‍රමවේද - අලි ඇතුන්ට හානිකර නොවන.**







**සම්ප්‍රදායික උගුල්**

- වගා භූමිය ආසන්නයට පැමිණීමට පෙර පලවා හැරීම

බොරු මදු
අලි පහන්
අලි පහන් පෙට්ටි
දිය වෙඩිල්ල / දිය හොල්මන

- වගා භූමිය ආසන්නයට පැමිණි පසු පලවා හැරීම

අලි උගුල / ගෝනි උගුල
මිණිගෙඩි බැඳීම
වගා භූමියට ඇතුළු වූ පසු
තහඩු උගුල
චීනපටස් උගුල

**ටයර් අලි වැට**

මහව, වතුපලගම තිස්ස බණ්ඩාර මහතා නිර්මාණය කරන ලද ටයර් අලි වැට අලීන්ගෙන් තම වගාභූමි ආරක්ෂා කර ගැනීම සඳහා යොදගත හැකි තවත් හිතකර විසඳුමකි. ඉවතලන ද්‍රව්‍ය යොදගෙන පරිසරයටත් හානි නොවන පරිදි අඩු වියදමකින් මෙම වැට නිර්මාණය කළ හැකිය.

**අවශ්‍ය ද්‍රව්‍ය:**

- පරණ ටයර් (අක්කරයක ප්‍රමාණයකට ටයර් වැටක් ඉදිකිරීම සඳහා පරණ ටයර් 105 ක් පමණ අවශ්‍ය වේ)
- හිස් වීදුරු බෝතල්
- අවශ්‍ය ප්‍රමාණයට කම්බි
- අවශ්‍යතාව අනුව විදුලි බුබුලු / විදුලිය ( රථවාහන බැටරියක්).

**අරුණ ඉන්ද්‍රජිත් කුඩලිගම**
**උතුරු වේල්ස්, මහා බ්‍රිතාන්‍යය**

තොරතුරු මූලාශ්‍ර :

1-https//elephantsandbees.com/research-projects
2.https//elephantsandbees.com/sri-lanka
3.https//www.slwcs.org/elephaants-and-bees
අලින්ගෙන් සිදුවන වගා හානි අවම කර ගැනීමට සාම්ප්‍රදායික උගුල් භාවිතය - මහාචාර්ය ගාමිණී රණසිංහ
ටයර් අලි වැට - තිස්ස බණ්ඩාර අබේසිංහ ගොවි මහතා (වතුපලගම, මහව)

ඡායාරූපවල කතෘ හිමිකම මුල් අයිතිකරුවන් සතුයි.

**සිතුවම් - සනුක කුඩලිගම**



අධිබල විදුලිය යොදගෙන වන අලියකු මරණයට පත්කර තිබූ අයුරු





ටයර් අලි වැට

# දක්ෂිණ අධිවේගියේ සැප බසයක් ලොරියක ගැටී විසි දෙනකුට තුවාල

(බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ)

**දක්ෂිණ අධිවේගී මාර්ගයේ මිල්ලනිය ප්‍රදේශයේ දී සුඛෝපභෝගී බසයක් හා ලොරියක් ගැටීමෙන් පුද්ගලයන් 20 දෙනකු පමණ තුවාල ලබා රෝහල්ගත කොට ඇතැයි දක්ෂිණ අධිවේගී රථවාහන පොලිසිය පවසයි.**

කොට්ටාව මාකුඹුර සිට මාතර බලා ධාවනය වූ සුඛෝපභෝගී බසයක් මාතර දෙසටම ධාවනය වූ ලොරියක ගැටීමෙන් 17.4 කිලෝමීටරය ආසන්න ප්‍රදේශයේ දී මෙම අනතුර සිදුවී ඇත. තුවාල ලැබූවන් අතර කාන්තාවන් ද සිටින බව දක්ෂිණ අධිවේගී රථවාහන පොලිසිය සඳහන් කරයි.

අනතුර සිදුවන අවස්ථාවේ දී සුඛෝපභෝගී බසයේ මාතර බලා ගමන් කරමින් සිටි මගීන් 40ක් පමණ ගමන් කොට ඇති බව මූලික විමර්ශනවල දී අනාවරණය වී ඇත.

මාතර දෙසට ධාවනය වූ සුඛෝපභෝගී බස් රථය 17.4 කිලෝමීටරය ආසන්න මිල්ලනිය ප්‍රදේශයේ දී අධිවේගී මාර්ගය මැද පිහිටා ඇති ආරක්ෂිත වැටේ ගැටී ඇති බවත් යළි මාර්ගය දෙසට විසී වූ බසය ඒ වන විට මාතර දෙසටම ධාවනය වූ ලොරියක පිටුපස ප්‍රදේශයේ ගැටී ඇති බවත් අනතුරුව මාර්ගයේ වම් පස ආරක්ෂිත වැටේ ගැටී එය ද කඩාගෙන බෑවුමට පෙරළී ඇතැයි පොලිසිය සඳහන් කරයි.

ලොරි රථය උත්සව සමය වෙනුවෙන් අල, ලූනු ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොගයක් රැගෙන මැදමුලන ප්‍රදේශය බලා ධාවනය වෙමින් තිබූ බව ද පොලිසිය සඳහන් කරයි.

අනතුරින් තුවාල ලැබූවන්ට එහි පැමිණි පොලිස් විශේෂ කාර්ය බළකායේ සෙබළුන් විසින් ඒ ස්ථානයේදීම ප්‍රතිකාර කළ බවත් ඉන් අනතුරුව ඔවුන් රෝහල් කරා යොමු කිරීමට පියවර ගත් බවත් සඳහන් කළ පොලිසිය අනතුරින් සුඛෝපභෝගී බස් රථයට ද ලොරි රථයට ද දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආරක්ෂිත වැටට ද දැඩි හානි සිදුවී ඇති බව ද සඳහන් කළේය.

දක්ෂිණ අධිවේගී රථවාහන පොලිසියේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජයන්ත පුෂ්පකුමාර මහතාගේ උපදෙස් මත ස්ථානාධිපති අනුරුද්ධ චන්ද්‍රසේකර, ගැලනිගම පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ගාමිණි ඇතුළු නිලධාරීහු සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වති.

# කුරුසියේ පණිවුඩය තමන් අමතක කර අනුන්ට ආදරය කිරීමයි

## කිසිදු වරදකට කිසිවකුට වෛර කිරීම හොඳ නෑ

## අගරදගුරුතුමෝ මහ සිකුරාදා දේව මෙහෙයේදී කියති

(ඩයනා උදයංගනී)

**කුරුසියේ පණිවුඩය වන්නේ තමා අමතක කර අනුන්ට ආදරය කිරීම බැවින් කිසිදු වරදකට කිසිවකුට වෛර කිරීම හොඳ දෙයක් නොවේ යැයි මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරුතුමෝ පැවසූහ.**



මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරුතුමෝ මහ සිකුරාදා දින දේව මෙහෙය පැවැත්වූ අයුරු.



දේව මෙහෙයට එක්ව සිටි පිරිසෙන් කොටසක්.
ඡායාරූප - ළහිරු හර්ෂණ

ආත්මාර්ථකාමී ලෙස වේදනාවෙන් පලායන අයට අනෙක් මිනිස්සුන්ගේ දුක වේදනාව තේරෙන්නේ නැතැයි කී කාදිනල්තුමෝ දුක වේදනාව ඉදිරියේ පැන නොයන උතුම් අයකුගේ තත්ත්වයට පත්විය යුතු යැයි ද සඳහන් කළහ.

මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරුතුමන් මේ බව පැවසුවේ කොටහේන ශාන්ත ලුසියා ආසන දෙව්මැදුරේ දී ඊයේ (2) පැවැති මහ සිකුරාද දින දේව මෙහෙයට සහභාගි වෙමිනි.

මහ සිකුරාද දිනය යෙදී තිබූ ඊයේ (02) දිනයේ දී දිවයිනේ සියලු දේවස්ථානවලට විශේෂ ආරක්ෂාවක් ද යොදවා තිබිණි. ඒ අනුව කොටහේන ශාන්ත ලුසියා ආසන දෙව්මැදුර අවට ද ආරක්ෂාව තර කර තිබිණි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ කාදිනල්තුමෝ මෙසේ ද පැවසූහ.

"ක්‍රිස්තුන් වහන්සේට කුරුසියේ ඇණ ගහලා දුන් වධහිංසා අපමණයි. ශාරීරික, මානසික වේදනාවට අමතරව තමන්ගේ ආදරණීයයන් විසින් උන්වහන්සේ ප්‍රතික්ෂේප කළා. එක්කෙනෙක් උන්වහන්සේ පාවා දුන්නා. ඒ වේදනාව කෙතරම් දරුණු වෙන්න ඇති ද? එය ඉතා භයානක මරණයක්. ඒ දුන්න වද ගායනාවල ඉවරයක් නැහැ. දෙවියන් වහන්සේත් උන්වහන්සේ අත්හැරියාදැයි උන්වහන්සේට සැකයක් ඇතිවුණා.

උන්වහන්සේ කුරුසියේ මියගියේ ආදරය කළ යුත්තේ කෙසේදැයි අපට පෙන්වන්නටයි. කුරුසියේ පණිවුඩය වන්නේ තමා අමතක කර තමකම නසා අනුන්ට ආදරය කිරීමයි. කුරුසිය වැළඳගැනීම ක්‍රිස්තු ධර්මයේ ප්‍රධානම කරුණයි. තමා සම්පූර්ණයෙන් නැතිකරගෙන උන්වහන්සේ අන් අයට ප්‍රේම කළා. අපි වේදනාවට දුකට බයයි. අපි අපේ අවශ්‍යතා විතරක් බලාගන්න කැමැතියි. තමා අමතක නොකර අනුන්ට ආදරය කරන්න බෑ.

අපි කාටවත් මොන වරදකටවත් වෛර කරන්න හොඳ නැහැ. අපි ආදරය කළ යුතුයි. කුරුසියේ මාර්ගයේ නොයා අපට සතුට ලබාගන්න බැහැ. ආත්මාර්ථකාමී වෙන තරමට අපි මායා ලෝකයක තනිවී නොලැබෙන දේ ගැන සිතමින් දුක් විඳිනවා. උන්වහන්සේ කිසි වරදක් නොකර කුරුසියේ එල්ලී සිටියා.

වේදනාවෙන් පැනලා යන අයට අනෙක් මිනිස්සුන්ගේ දුක වේදනාව තේරෙන්නේ නැහැ. දුක වේදනාව ඉදිරියේ පැනල නොයන උතුම් කෙනෙකුගේ තත්ත්වයට අප පත්විය යුතුයි. මම මේ මහ සිකුරාද දිනයේ ඔබට කියන්නේ ආත්මාර්ථකාමී වෙන්න එපා. පරාර්ථකාමී වෙන්න. කුරුසිය මත ජීවත්වීමෙන් ලැබෙන ප්‍රීතිය උත්ථානයයි." යැයි ද කාදිනල්තුමෝ පැවසූහ.

# ආනයනික භාණ්ඩ 6000 න් පරීක්ෂාවට ලක්වන්නේ 1300 යි

## රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න

(මුදිතා දයානන්ද)

**ආනයනික භාණ්ඩ වර්ග 6000 න් රේගුව තුළ දී පරීක්ෂාවට ලක්වන්නේ 1300ක පමණ භාණ්ඩ ප්‍රමාණයක් බව සමුපකාර අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා ඊයේ (02) පැවසීය.**

ආනයනික පොල්තෙල් හා වියළි මිරිස්වල ප්‍රමිති වාර්තා ලැබෙන තෙක් රේගුවෙන් නිදහස් නොකිරීමට රේගුව සමග එකඟතාවකට පැමිණි බව ද මේ තත්ත්වය ක්‍රමයෙන් අනෙකුත් භාණ්ඩ සම්බන්ධයෙන් ද අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ද රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

මෙම කාර්යය වඩාත් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පස්වැනිදා සිට පැය විසිහතර පුරා විවෘතව තබන බව ද අලගියවන්න මහතා පැවසීය.

ඔහු මේ බව සඳහන් කළේ පාරිභෝගික සේවා අධිකාරියේ දී පැවති මාධ්‍ය හමුවක දීය.

රේගුවේ දී පරීක්ෂාවට ලක් කරන භාණ්ඩ ද ප්‍රමිති වාර්තා ලැබෙන්නට පෙර එම භාණ්ඩ රේගුවෙන් නිදහස් කරන බව ද එය මෙතෙක් සිදුව ඇති සාමාන්‍ය ක්‍රමවේදය බවට පත්ව තිබෙන බව ද අලගියවන්න මහතා පැවසීය.

ආනයනික භාණ්ඩ රේගුවෙන් නිදහස් කිරීමේ ක්‍රියාවලියේ ගැටලු රැසක් පවතින බව ද රේගුව තුළ පවත්වාගෙන යනු ලබන විවිධ ආයතනවලට අයත් කාර්යාලවල පහසුකම් අවම මට්ටමේ පවතින බැවින් ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සම්බන්ධයෙන් ද ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ද රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

# කුරුඳු- ගංජා ප්‍රවර්ධනය එකම කාසියේ දෙපැත්ත

## අන්තර් විශ්වවිද්‍යාල කමිටුවෙන් නිවේදනයක්

**කුරුඳු දුම්වැටි ප්‍රවර්ධනය හා ගංජා ප්‍රවර්ධන සඳහා දරන ප්‍රයත්න එකම කාසියේ දෙපැත්තක් බවත්, කුරුඳු දුම්වැටි ප්‍රවර්ධනයට හා අලෙවියට ඉඩ නොදිය යුතු බවත් ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය හා එම අන්තර් විද්‍යාලයීය කමිටුව ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.**

එම නිවේදනයේ මෙසේ ද දැක්වේ.

කුරුඳු අඩංගු බව පවසෙන දුම්වැටි වර්ගයක් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම පිළිබඳ යෝජනාවට මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. එම දුම්වැටි වර්ගය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ මාධ්‍ය හමුවක කැබිනට් අමාත්‍යවරයකු ද පෙනී සිටීම සම්බන්ධයෙන් සමාජයේ පුළුල් අවධානයක් යොමු වී තිබේ.

දුම්බීම සෞඛ්‍යයට හානිකරය. එමෙන්ම දැව ඉන්ධන දහනයෙන් නිකුත් වන දුම් ආශ්‍රාහණය කිරීමෙන් පවා ලොව මරණ විශාල සංඛ්‍යාවක් සිදු වන අතර, තවත් විශාල පිරිසක් රෝහල් ගත කෙරෙති. දහනය කෙරෙන හෝ දුම් ලෙස ආශ්‍රාහණය කෙරෙන ද්‍රව්‍යවල අඩංගු සංඝටක දහනය වීමේ ප්‍රතිඵලයක් ලෙස උත්පාදනය වන සිය ගණනක් රසායනික ද්‍රව්‍ය ඊට හේතුවිය. එබැවින් ශාකමය හෝ වෙනත් වර්ගයක දුම්වැටි නිෂ්පාදනයක් නිති පතා භාවිත කරන විට එම පුද්ගලයන්ගේ පෙණහළුවලට සැලකිය යුතු හානියක් සිදුවේ. ඇතැම් ද්‍රව්‍ය ආහාරයක් ලෙස පරිභෝජනය කරනවිට (කුරුඳු වැනි දෑ) ප්‍රතිලාභදායක විය හැකි වුවත්, දුම්වැටියක් ලෙස භාවිත කිරීමේ දී හානිදායක විය හැකිය.

එබැවින් ''මෙම කුරුඳු දුම්වැටිය දුම්කොළ දුම් පානයට හානි රහිත විකල්පයකි.'' යන තර්කය සාවද්‍ය එකකි. මෙය තවත් තහවුරු කරමින් රස කාරක ද්‍රව්‍යයක් ලෙස කුරුඳු භාවිත කරන ඉලෙක්ට්‍රොනික දුම්වැටි පිළිබඳව මෑතක දී කළ පරේයෂණයක දී හෙළි වූයේ එහි අඩංගු කුරුඳු දහනයෙන් පෙණහළුවල සියුම් පටකවලට සැලකිය යුතු හානියක් සිදුවන බවයි.

මෙම නිෂ්පාදන අලෙවි කිරීමට ඉඩ ලබාදීම තුළින් දුම්පානය ශරීර සෞඛ්‍යයට හානි කරන නොවන දෙයක් ලෙස සමාජය තුළ පෙනී යා හැකිය. එය දුම්කොළ අඩංගු දුම්වැටි නිෂ්පාදනවලට වඩා අඩු මිලකට අලෙවි කිරීමට ද හැකියාව තිබේ. මෙම කරුණු දෙක නිසාම මෙම නිෂ්පාදනය තරුණ ප්‍රජාව ආකර්ශනය කර ගන්නා දුම්පානයට උනන්දු කරවන, එමෙන්ම දුම් කොළ හා වෙනත් ඇබ්බැහිකාරි මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු කරවන දෙයක් බවට පත් වේ.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාව අතර අලෙවි කිරීමට අපේක්ෂිත මෙවැනි නිෂ්පාදනයක් එය අනුමත කිරීමට පෙර දැඩි පරීක්ෂාවට සහ අත්හද බැලීම්වලට ලක් කළ යුතු බව පෙන්වා දීමට අපි කැමැත්තෙමු. අප දන්නා තරමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුව මෙම නිෂ්පාදනයට පිළිගැනීමක් හෝ ඊට කිසිදු අනුමැතියක් හෝ ලබා දී නොමැත.

ගංජා භාවිතය සහ ශ්‍රී ලංකාවේ එය වගා කිරීම ප්‍රවර්ධනය කිරීමට යම් පාර්ශ්ව මෑත දී ප්‍රචාරයක් ලබාදීම ද මෙම සන්දර්භය තුළ සිටම විමසා බැලිය යුතු කරුණකි. මීට වසර කිහිපයකට පෙර චීනයේ නිෂ්පාදිත නව දුම්වැටි වර්ගයක් (සිගරැට්ටුවක්) මෙරටට හඳුන්වාදීමට ද මෙවැනිම උත්සාහයක් තිබුණු අතර, එවක රජයට එම යෝජනාව ඉවත් කර ගැනීමට සිදුවිය. මේ සියලුම ප්‍රයත්න සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ දුම්පානය ක්‍රමයෙන් අඩුවන කාලවකවානුවකදීය.

කුරුඳු දුම්වැටි ප්‍රවර්ධනය හා ගංජා ප්‍රවර්ධනය සඳහා දරන ප්‍රයත්න ද එකම දෙපැත්ත ලෙස සැලකිය හැකිය. විවිධ ආයතන හා සංවිධාන මගින් දුම් පානය කිරීමේ පුරුද්ද පවත්වා ගැනීම සහ ඒවාට ඇබ්බැහි කරවීම යන අරමුණු සහිතව මෙවැනි ප්‍රචාරණ සිදුකරන්නේ අන් කවරක් හෝ නොව ලාභ ඉපැයීමේ පරමාර්ථයෙනි. ලාභ ඉපැයීම සඳහා ප්‍රවර්ධනය කළ යුත්තේ නිෂ්පාදනය නොව දුම් බීමේ පුරුද්දයි. දුම්බීම සඳහා අවශ්‍ය මානසික ගැතිභාවය සමාජයක් තුළ පවත්වාගෙන යන විට ඕනෑම දුම්වැටි නිෂ්පාදනයක් අලෙවි කිරීමට හැකියාව පවතී.

දුම්කොළ නිසා දැනටමත් සෑම වසරකම ශ්‍රී ලංකාවේ 20,000ක පමණ පිරිසක් මරණයට පත් වෙති. දුම්කොළ භාවිතය නිසා රටට වන ආර්ථික පාඩුව වසරකට රුපියල් කෝටි විසිදහසක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ඇස්තමේන්තු කර ඇත. එම නිසා වගකිවයුතු රජයක් ලෙස මෙම සංඛ්‍යාවන් අවම කර ගැනීමට පියවර ගැනීම මිස කුරුඳු හෝ ගංජා ලෙසින් දුම්පානය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියා කළ යුතු නැත.

ශ්‍රී ලංකාවේ දුම් කොළ හා වෙනත් ඇබ්බැහිකාරක ද්‍රව්‍ය භාවිතය වර්තමානයේ සාපේක්ෂ වශයෙන් අවම මට්ටමක පවතින්නේ දීර්ඝ කාලයක් තිස්සේ වෘත්තිකයන් හා වෙනත් පාර්ශ්වකරුවන් දැඩි කැපවීමෙන් දැරූ ප්‍රයත්න හේතුවෙනි. ජාතික දුම්කොළ හා මධ්‍යසාර අධිකාරි පනත සැලසුම්කොට බලගැන්වීම හා එය ක්‍රියාත්මක කිරීමට සහය දැක්වීම හා ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය මගින් සිදුවන හානි වැළැක්වීමේ ක්‍රියාමාර්ග ඉහළ නැංවීමට වසර ගණනාවක් තිස්සේ පියවර ගැනීම එම ප්‍රයත්නවලින් සමහරකි. ලබාගත් මෙම ජයග්‍රහණ ආපසු හැරවීමට ඉඩදිය යුතු නැත.

එබැවින් කුරුඳු දුම්වැටි (සිගරට්) ප්‍රවර්ධනය සහ අලෙවි කිරීමට ඉඩ නොදෙන ලෙස ශ්‍රී ලංකා රජයෙන් අපි ඉල්ලා සිටිමු.

# සරසවි අරින්න ආණ්ඩුවට සැලසුමක් නෑ

## පේරාදෙණිය මහ ශිෂ්‍ය සංගමය

(රංජන් කස්තුරි)

**විශ්වවිද්‍යාල වසාදමා වසරකට අධික කාලයක් ගත වුවද ඒවා නැවත විවෘත කිරීමට ආණ්ඩුවට කිසිදු සැලසුමක් නැතැයි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ගයාන් අකිල ජයතිලක මහතා පැවැසීය.**

විශ්වවිද්‍යාල නැවත විවෘත කිරීමටත් මහපොළ ශිෂ්‍යාධාර සම්බන්ධ ගැටලු විසඳීමටවත් ආණ්ඩුවට කිසිදු අවශ්‍යතාවක් නැතැයිද ඔහු සඳහන් කළේය.

රාජ්‍ය ආයතන, කර්මාන්තශාලා සහ වෙනත් ආයතනවල වැඩ යළි ආරම්භ කර මාස කීපයක් ගත වී ඇතත් ආණ්ඩුවට විශ්වවිද්‍යාල විවෘත කිරීමට අවශ්‍යතාවක් නැතැයි ද මහ ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා පැවසීය.

විශ්වවිද්‍යාල වසාතැබීම නිසා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය බිඳවැටීම, ශිෂ්‍ය ව්‍යාපාරය දුර්වල කිරීම ආණ්ඩුවේ අරමුණ වී ඇතැයිද මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා කීවේය.

මහපොළ ශිෂ්‍යාධාරය ඉහළ නංවන බවට රජය දුන් පොරොන්දුව තවමත් ඉටු වී නැතැයිද ඔහු සඳහන් කළේය.

# බිම්ස්ටෙක් 17 වැනි සැසිවාරයේ සභාපති පුටුව දිනේෂ්ට

(තිළිණි ද සිල්වා)

**බිම්ස්ටෙක් රටවල අමාත්‍ය රැස්වීමේ 17 වැනි සැසිවාරයේ සභාපතිත්වය විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාට හිමි වී ඇත. කොළඹදී පෙරේද (01) අන්තර්ජාලය ඔස්සේ පැවැති මෙම සමුළුවේ මුලසුන හොබවමින් විදේශ අමාත්‍යවරයා සඳහන් කෙළේ බිම්ස්ටෙක් සාමාජික රටවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමයේ ප්‍රඥප්තිය කල් ඇතිව අවසන් කළ යුතු බවය.**

එම ප්‍රඥප්තියේ කටයුතු අවසන් වීමෙන් පසු ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම කෙරෙහි මන්ත්‍රීවරුන්ට කැපවීමට වැඩි ඉඩක් ලැබෙන බවද පාර්ලිමේන්තු භාවිතය පිළිබඳව අදහස් හා තොරතුරු හුවමාරුකර ගැනීමටත් අවස්ථාව ලැබෙන බවද අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

මෙම බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීමට එහි සාමාජිකත්වය දරන බංගලිදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය හා තායිලන්තයද ශ්‍රී ලංකාව සමඟ අන්තර්ජාලය හරහා එක්විය.

ආසියා සංවර්ධන බැංකුව සකස් කරන ලද බිම්ස්ටෙක් ප්‍රවාහන සබඳතා ප්‍රධාන සැලැස්ම කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බවද අමාත්‍යවරයා මෙහිදී අවධාරණය කළේය.

කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ සියවස් ගණනාවක් තිස්සේ භාවිතා කළ වෙරළබඩ නාවික ගමනාගමනය, ජල මාර්ග, තොටුපල හා වරාය ඇතුළු ප්‍රවාහන සබඳතා අද වන විට මුහුණ දී ඇති බාධාවන් අධ්‍යයනය කොට අනාගතයේදී ගුවන් භාණ්ඩ සැපයීම, මහජන සබඳතා හා කලාපීය සංවර්ධනයට ගැළපෙන අයුරින් සැලසුම් සකස් කළ යුතු බවද අමාත්‍යවරයා එහි මුලසුන දේශනය පවත්වමින් සඳහන් කෙළේය.

මෙම සමුළුවේ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය උසුලනු ලැබුවේ කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා විසිනි.

# පොල්තෙල් බවුසර් දෙකේ ගබඩා විගණනය කරයි

(යොහාන් භාසුර)

**'ඇෆ්ලටොක්සීන්' නමැති පිළිකාකාරකය අඩංගු යැයි සැක කෙරෙන පොල්තෙල් බවුසර් දෙක හිමි පෞද්ගලික සමාගමේ පොල්තෙල් ගබඩා විගණනය කිරීමට තීරණය කළ බව රේගු දෙපාර්තමේන්තුව පවසයි.**

රාජ්‍ය කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව මගින් මෙම විගණනය පැවැත්වීමට රේගු දෙපාර්තමේන්තුව තීරණය කර තිබේ.

අදාළ පොල්තෙල් ආනයනික සමාගමේ රාගම හීන්කෙන්ද ප්‍රදේශයේ පිහිටි පොල්තෙල් ගබඩා සහ සැක පොල්තෙල් බවුසර දෙක මෙහිදී විගණනය කරන බවත් එම ප්‍රමාණය සහ එම සමාගමට රේගුවෙන් නිකුත් කළ පොල්තෙල් ප්‍රමාණය අතර වෙනසක් ඇතිවුවහොත් ඉදිරි නීතිමය පියවර ගන්නා බවත් රේගු නිවාරණ අංශයේ ප්‍රධානී රේගු අධිකාරි, සේනක ඇරැව්පොල මහතා ඊයේ (02) පැවසීය.

රේගු බාරයේ තියෙන පොල්තෙල් බවුසර් දෙකෙන් ලබාගත් පොල්තෙල් සාම්පල රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යංශයේ ආහාර ආරක්ෂණ ඒකකයට සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට තත්ත්ව පරීක්ෂාව සඳහා යොමු කළ බවත් එහි ප්‍රතිඵල ඉදිරි දින කීපයේදී ලැබෙනු ඇති බවත් රේගු නිවාරණ අංශයේ ප්‍රධානියා පැවසීය.

# උල් පිහි දෙකක් අරන් ශාන්ත අන්තෝනි දෙව් මැඳුරට රිංගන්න හදලා

(බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ සහ කොච්චිකඩේ වාර්තාකරු)

**දුන්ගල්පිටිය, කැපුන්ගොඩ ශාන්ත අන්තෝනි දේවස්ථානයට උල් පිහි දෙකක් රැගෙන ඇතුළුවීමට තැත් කළ පුද්ගලයකු පෙරේද (1 )අත්අඩංගුවට ගත් බව දුන්ගල්පිටිය පොලිසිය කියයි.**

එම පුද්ගලයා සන්තකයේ තිබී අඟල් 6 ක් පමණ දිග උල් පිහියක් හා දෙකට නැවිය හැකි අඟල් 5ක් පමණ දිග උල් පිහියක් පොලිස් නිලධාරීන් විසින් සොයාගනු ලැබීය.

කැපුන්ගොඩ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ පාස්කු උත්සවයට සමගාමීව පවත්වන ලද දේව මෙහෙය අතරතුර සැකකාර පුද්ගලයා ගමන් මල්ලක් රැගෙන දේවස්ථානයට ඇතුළුවීමට උත්සාහ කිරීමේදී එහි ආරක්ෂාවට යොදවා සිටි පොලිස් නිලධාරීන් එම පුද්ගලයා අත්අඩංගුවට ගෙන ගමන් බෑගය පරික්ෂා කිරීමේදී එම උල් පිහි දෙක සොයා ගැනීමට හැකි වූ බව පොලිස් නිලධාරියෙක් පැවසීය .

අත්අඩංගුවට ගත් සැකකරු කිරුළපන නව මාවතේ පදිංචි වයස අවුරුදු 61පුද්ගලයෙකි

දුන්ගල්පිටිය පොලිසිය පරීක්ෂණ පවත්වයි.

# ප්‍රේමයෙන් දයාවෙන් යුත් මානව හිතවාදී සමාජයක් හදමු

## ජනාධිපති

**ප්‍රේමයෙන් දයාවෙන් යුත් මානව හිතවාදී සමාජයක් ගොඩනගා ගැනීමට පාස්කු සමය ආශිර්වාදයක් කරගත යුතු යැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පාස්කු දින පණිවුඩයක් නිකුත් කරමින් කියා සිටී.**

එහි මෙසේද ද දැක්වේ.

පාස්කු ලෝකවාසි කිතුනු ජනතාවගේ උතුම්ම මංගල්‍යයයි. පාස්කු මංගල්‍යයේ අර්ථය පාපයෙන් ගැලවීමයි. ජන්ම පාපයෙන් නිදහස්ව කළ වැරැදි ගැන පසුතැවිලි වෙමින් නව දිවියක් ආරම්භ කිරීම ඉන් තවදුරටත් අරුත් ගැන්වෙයි.

ලොව පුරා විසිර පැතිර සිටින කිතුනුවෝ අළු බදාදා ආරම්භ වන දින 40ක කාලපරිච්ඡේදයක් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සහ මරණය සිහිකරමින් ආධ්‍යාත්මික ව්‍රතාවත්හි නිරත වෙති. පාස්කු ඉරු දින ඔවුහු උන්වහන්සේ උත්ථාන වීමේ විජයග්‍රාහී මොහොත මහත් ප්‍රීතියෙන් සමරති.

කිතුනු ජනතාව මේ කාලය තුළ ක්‍රිස්තුන් වහන්සේ මානව සංහතිය පාපයෙන් මුදාගැනීමේ චේතනාවෙන් කුරුසයේ දුක්විඳ ඉතා වේදනාකාරී මරණය පරාජය කර නැවත නැගිට විමුක්තිය අත්කර දීම මෙනෙහි කරති.

ශ්‍රී ලාංකේය කිතුනු ජනතාව අසීමිත ගෞරවයෙන් හා භක්තිවන්තව සමරන පාස්කු සමය අන්තවාදී ම්ලේච්ඡ ප්‍රහාරයකට වරෙක ගොදුරු විය. ඉන් බිඳුණු හදවත්වල වේදනාව අදටත් මැකී ගොස් නැත. ඒ පාපී ක්‍රියාවට වැරැදිකරුවන් වන පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට නීතියෙන් ගැලවීමට අප කිසිදු ඉඩක් තබන්නේ නැත. එසේම නැවත එවන් ඛේදන්තයන්ට කවර හෝ අවසරයක් නොලැබෙන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට රජය වග වී සිටී.

ජේසුස් වහන්සේ එදා දේශනා කළ මානව විමුක්ති සමාජයට ශක්තියකි. අද ලෝකය හමුවේ මුහුණ පෑමට සිදුවන බහුවිධ තාඩන පීඩන පරාජය කර නැගී සිටීමටත් ප්‍රේමයෙන් දයාවෙන් යුතු මානව හිතවාදී සමාජයක් තුළ ජීවත් වීමටත් මේ පාස්කු සමය ආශිර්වාදයක් කරගනිමු.

සැමට සාමකාමී පාස්කු මංගල්‍යයක් වේවා.

# පරිත්‍යාගශීලී ජීවිතයක වටිනාකම මෙනෙහි කෙරෙන මේ දිනය සැමට එකසේ වැදගත්

## අගමැති

**පරිත්‍යාගශීලී ජීවිතයක වටිනාකම මෙනෙහි කෙරෙන පාස්කු දිනය සියලු දෙනාට එකසේ වැදගත් යැයි අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පාස්කු දින පණිවුඩයක් නිකුත් කරමින් කියා සිටී.**

එහි මෙසේ ද සඳහන්ය.

විමුක්තිදායක ප්‍රීතියේ සැමරුම් දිනය පාස්කුවයි. මෙදින ලොව පුරා කිතුනු බැතිමතුන් සමග ශ්‍රී ලාංකේය කිතුනු ජනතාව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණය පරාජය කර උත්ථානවීම මහත් හරසරින් සමරනු ලබති.

පාස්කු මංගල්‍යයට පෙර කිතුනු බැතිමත්හු ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසිය මත දිවි පිදීමේ යාගය මහ සිකුරාද දිනයේ සිහිපත් කරති.

ඒ සඳහා ඔවුන් දින හතළිහක කාලයක් යාඥාවෙන් භාවනාවෙන් උපවාස ශීලයෙන් හා විවිධ පුණ්‍ය ක්‍රියා ඔස්සේ අධ්‍යාත්මික සහනය ප්‍රාර්ථනා කරයි.

පාස්කු ඉටි පහනේ ආලෝකය සහෝදර ජනතාවට සහනාලෝකය අත්විඳින්නට ඉඩ සලස්වන මහඟු අවස්ථාවකි. පාස්කු අර්ථයෙන් ගත්විට සියලු දෙනා එතෙර වීම මුළු මහත් සමාජයම බලාපොරොත්තු වන්නකි.

පරිත්‍යාගශීලි ජීවිතයක වටිනාකම මෙන්ම ධෛර්යය හා ශක්තිය ජීවිතයට ළඟා කර ගත හැකි අධ්‍යාත්මික මාර්ගය මෙනෙහි කිරීමට අද වැනි දිනයක් සියලු දෙනාට එක සේ වැදගත්ය.

ජීවිත ආදර්ශය තුළ සැබෑ ජීවන වෙනසක් අත්දකිමින් සමාජය තුළ මුහුණ දීමට සිදුවන විවිධ අභියෝග හමුවේ මානව දයාවෙන් සහජීවනයෙන් හා අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් යුතුව දිවි ගෙවීමට කිතුනු ජනතාවට හැකිවේවා! යැයි මම ප්‍රාර්ථනා කරමි.

ශ්‍රී ලාංකේය කිතුනු බැතිමතුන් සැමට සුබ පාස්කු මංගල්‍යයක් වේවා.

# හොර වීසා බලපතකින් කටාර් ඔස්සේ කැනඩාවට පනින්න හැදූ තරුණයෙක් මාට්ටු

**(කටුනායක ටී.කේ.ජී. කපිල)**

ව්‍යාජ තොරතුරු ඇතුළත් කර කූඨ ලෙස සකස් කළ කැනේඩියානු වීසා බලපත්‍රයක් උපයෝගී කරගනිමින් කටාර් රාජ්‍ය ඔස්සේ කැනඩාවට පැන යාමට උත්සාහ කළ ශ්‍රී ලාංකික තරුණයෙක් පෙරේදා (01) අලුයම ආගමන විගමන දෙපාර්තමේන්තු දේශසීමා ආවේක්ෂණ ඒකකයේ නිලධාරීන් පිරිසක් විසින් අත්අඩංගුවට ගනු ලැබීය.

ඔහු යාපනය පලෙයි ප්‍රදේශයේ පදිංචි 31 හැවිරිදි තරුණයෙකි.

කටාර් රාජ්‍යයේ දෝහා වෙත පෙරේදා අලුයම 3.45 ට පමණ පිටත්ව යැමට නියමිතව තිබූ කටාර් ගුවන් සේවයේ කිව්.ආර්.-669 දරන ගුවන් යානයෙන් පිටත්ව යැමට ඔහු කටුනායක ගුවන්තොටුපොළට පැමිණ ඇත.

එහිදී ගුවන් ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමේ කවුළුව වෙත පැමිණ ඔහු ඉදිරිපත් කළ මෙම කැනේඩියානු ජාතික වීසා බලපත්‍රය සම්බන්ධයෙන් මතු වූ ගැටලු මත, කටාර් ගුවන් සේවා නිලධාරීන් මෙම වීසා බලපත්‍රයෙන් ඇතුළු ඔහු ඉදිරිපත් කළ අනෙකුත් ලියකියවිලි ද සමඟ මෙම ගුවන් මගියා කටුනායක ගුවන්තොටුපළ ආගමන විගමන දෙපාර්තමේන්තු දේශසීමා ආවේක්ෂණ ඒකකයේ නිලධාරීන් වෙත යොමු කර තිබුණි.

එහිදී එම නිලධාරීන් මෙම ලියකියවිලි පිළිබඳව සිදුකළ තාක්ෂණික පරීක්ෂාවලින් පසුව මෙම කැනේඩියානු ජාතික වීසා බලපත්‍රය ව්‍යාජ තොරතුරු ඇතුළත් කර කූඨ ලෙස සකස් කර ඇති බව තහවුරු විය.

මෙසේ කූඨ ලෙස සකස් කළ මෙම කැනේඩියානු ජාතික වීසා බලපත්‍රය, සකස් කර ගැනීම සඳහා තමන් විසින් රුපියල් ලක්ෂ 20 ක මුදලක් තැරැව්කරුවකු ට දුන් බවද මෙම තරුණයා ආගමන විගමන දෙපාර්තමේන්තු නිලධාරීන් සිදු කළ මූලික විමර්ශන වල දී අනාවරණය කර තිබේ.

ඒ අනුව ආගමන විගමන දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම තරුණයා අත්අඩංගුවට ගෙන, මේ පිළිබඳව වැඩිදුර විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා කටුනායක ගුවන්තොටුපළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ඒකකයේ නිලධාරීන් වෙත භාරදීමට පියවර ගෙන ඇත.

# නෙදර්ලන්තයෙන් ඇවිත් ටෙලි නාට්‍යවලත් රඟපාලා

# මතට තිත තියන්න ගාල්ලේ ලිස්ටා වැඩ පෙන්වයි

**(උණවටුන ඩී.ජී. සුගතපාල)**

**මත්ද්‍රව්‍ය සොයා ගැනීමේ විශේෂ දක්ෂතා දැක්වූ ගාල්ල පොලිසියේ නිල සුනඛ අංශයේ ලිස්ටා ටෙලි නාට්‍යය කිහිපයකට දායක වී ඇති බව ලිස්ටා බාරව සිටින පොලිස් පරීක්ෂක නිමල් රාජපක්ෂ මහතා පැවසීය.**

මෙයට වසර තුනකට පෙර නෙදර්ලන්තයේ උපත ලබා ඇති ලිස්ටා ගාල්ල පොලිසියට පැමිණෙන්නේ 2019 අගෝස්තු 20 වැනිදය.

එද මෙද තුර ලිස්ටා සහභාගී වී ඇති වැටලීම් සිය ගණනකි. පසුගිය වසරේ පමණක් ලිස්ටා සහභාගී වී ඇති වැටලීම් සංඛ්‍යාව 122 කි.

ගාල්ල පොලිසියේ නිල සුනඛ අංශය බාරව සිටින්නේ පොලිස් පරීක්ෂක නිමල් රාජපක්ෂ මහතා වන අතර ලිස්ටාගේ බාරකරු වන්නේ කොස්තාපල් චමිල (78840) මහතාය. ලිස්ටාගේ හපන්කම් ගැන පොලිස් පරීක්ෂක නිමල් රාජපක්ෂ මහතා මෙසේ විස්තර කෙළේය. දැන් ලිස්ටාගේ වයස අවුරුදු තුනයි. වටිනාකම ලක්ෂ දහ තුනයි. ලිස්ටා පුහුණු කරල තියෙන්නේ විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා පමණයි. හෙරොයින් ගංජා හෝ වෙනත් කුමන මත්ද්‍රව්‍යයක් දවටා තිබූ කොළයක වෙන යමක් දවටා තිබුණත් එය ලිස්ටාට දැනෙනවා. ඒ ඔස්සේ ද අපි සැකකරුවන් සමග මත්ද්‍රව්‍ය සොයාගෙන තිබෙනවා.

පොලිස් නිල සුනඛයන් බඳවා ගැනීමේදීත් දක්ෂතා පිළිබඳ පරීක්ෂණයක් සිදු කරනවා. මිනිසුන්ට වඩා සුනඛයන්ට සුවඳ (ඉව) දැනීමේ ශක්තිය ඉතා විශාලයි. **වැටලීම සඳහා ලිස්ටා රැගෙන යන කොස්තාපල් චමිල මහතා මෙසේ කීවේය.**

පසුගිය දවසක ගාල්ල, දඩල්ල ප්‍රදේශයේ ගංජා ජාවාරම්කරුවකුගේ නිවෙසක් පරීක්ෂාවට ගියා. එම නිවසේ පොළොව යට තැනින් තැන වළ දමා තිබූ ගංජා ලිස්ටා සොයාගත්තා. එයට අමතරව මල් පෝච්චියක් යට සඟවා තිබූ සල්ලි පාර්සලයක් ද ලිස්ටා සොයාගත්තා. විශේෂත්වය වුණේ ගංජා ගෙනෙන ලද බෑගයකට තමයි සල්ලි දාලා තිබුණේ. ඒ බෑගයේ ඉවටයි සල්ලි පාර්සලය සොයා ගැනීමට පුළුවන් වුණේ.

ඒ වගේම කළුවැල්ල ප්‍රදේශයේ නිවසක කාමරයේ ඇඳේ සඟවා තිබූ හෙරොයින් තොගයක් ලිස්ටා සොයාගත්තා. පසුගිය වසරේ මත්ද්‍රව්‍ය වැටලීම් එකසිය විසි දෙකකට ලිස්ටා සහභාගී කර ගත්තා. මේ අවුරුද්දේ ගත වූ මාස තුන ඇතුළත පමණක් වැටලීම් විසි හතරකට





සහභාගී වී තිබෙනවා. මත්ද්‍රව්‍ය පුද්ගලයකුගේ සිරුරේ වේවා නිවසක වේවා වාහනයක වේවා වෙනත් ස්ථානයක වේවා කොතැනක සඟවා තිබුණත් ලිස්ටා එය සොයා ගන්නවා.

ලිස්ටා මත්ද්‍රව්‍ය සොයා ගන්න වගේම ටෙලි නාට්‍යවලත් රඟපාලා තියෙනවා. පසුගිය කාලයේ හතේ කල්ලිය කියලා රූපවාහිනී නාළිකාවක විකාශය වූ ටෙලි නාට්‍යයේ සිටියේ ලිස්ටා තමයි.

# අද දවස ඔබට

## රාහු කාලය 9.08-10.38

### • මේෂ — බාධක දුරුවෙයි

සතුරු බාධක මැඩ කටයුතු කිරීමට හැකියාව ලැබේ. විවාහ යෝජනා ආදිය සාර්ථක වේ. ගෙවතු ආශ්‍රිත කටයුතුවල කාර්ය බහුල වේ. සන්ධ්‍යා කාලයේ කෙටි ගමන් බිමන් යෙදේ.

### • වෘෂභ — පර්යේෂණ සාර්ථකයි

පර්යේෂණ කටයුතුවලින් බලාපොරොත්තු ඉටුවේ. ජලය ආශ්‍රිත කටයුතුවලට විවිධ බාධක මතුවේ. සතුරු බල පරදු කටයුතු කරගැනීමට හැකිවේ. සන්ධ්‍යා කාලය විවේකයෙන් ගෙවේ.

### • මිථුන — දේපළ ලාබ

බලාපොරොත්තු දේපළ ලාබ ආදිය හිමිවේ. රැකියා කටයුතු සඳහා වැඩි කාලයක් යෙදවීමට සිදුවේ. දැනට බලපාන නිවාස ප්‍රශ්නයකට විසඳුම් ලැබේ. දවස කාර්ය බහුල වේ.

### • කටක — වියදම් ඉහළට

දවසේ වැඩ කටයුතු පහසුකර ගැනීමට හැකියාව ලැබේ. නිවාස අලුත්වැඩියා කටයුතු සඳහා වියදම් ඉහළ යයි. ස්වයං රැකියා කටයුතු සාර්ථක වේ. සන්ධ්‍යා කාලය නිවසින් බැහැරව ගෙවේ.

### • සිංහ — ප්‍රීති උත්සව

බලාපොරොත්තු ආහාර පාන වැඩියෙන් ලැබෙන දිනයකි. ප්‍රීති උත්සව ආදියට ඇරියුම් ලැබේ. සහජ හැකියාවන්ගෙන් නිසිඵල ලබා ගැනීමට හැකිවේ. උත්සාහයේ තරමට ඵල ලැබිය හැකිවේ.

### • කන්‍යා — ප්‍රභූ ඇසුරට

කය වෙහෙසා වැඩ කරන්නන්ට සුබදායක දිනයකි. මිලට ගැනීම් විකිණීම් ආදියෙන් වැඩිලාබ හිමිවේ. උසස් අය ඇසුරට ලැබේ. නව මිතුරු සබඳතා ඇතිවේ.

### • තුලා — ස්ථාන වෙනසක්

ව්‍යාපාර කටයුතුවල ස්ථාන වෙනසක් සිදුවේ. සේවක ප්‍රශ්න ආදිය සඳහා වෙහෙසීමට සිදුවන දිනයකි. රැකියා කටයුතුවලින් නිවාඩු ලබාගැනීමට සිදුවේ. සන්ධ්‍යා කාලයේ ප්‍රියසාද ආදිය යෙදේ.

### • වෘශ්චික — සතුරු බාධක

රහස් සතුරු බාධක ආදිය බලපාන දිනයකි. කාර්මික අංශයේ කටයුතුවල කාර්ය බහුල වේ. රැකියා විරහිත වූවන්ට තාවකාලික ආදායම් මාර්ග සැලසේ. යොදගත් කටයුතු අතර මග නතර කිරීමට සිදුවේ.

### • ධනු — කටයුතු වෙනසක්

කලා අංශයේ කටයුතුවලින් ප්‍රසිද්ධිය හිමිවේ. කලක් කරගෙන ගිය කටයුතුවල වෙනසක් සිදුවීමට ඉඩ ඇත. නිවාස අලුත්වැඩියා කටයුතු යෙදේ. වියදම් ඉහළ යයි.

### • මකර — අධ්‍යාපන වියදම්

උසස් අධ්‍යාපන කටයුතුවල නිරතවූවන්ට වියදම් ඉහළ යයි. ශාස්ත්‍රීය කටයුතුවල නිරතවූවන්ට කාර්ය බහුල වේ. වංචනික පුද්ගලයන්ට නීති ප්‍රශ්න මතුවේ. ගෙවතු අලංකාර කටයුතු ආදිය යෙදේ.

### • කුම්භ — නුසුදුසු ඇසුරක්

නුසුදුසු ඇසුරක් නිසාම ගැටලු තත්ත්වයක් ලැබේ. ඉවත දමන දෙයින් විවිධ දේ නිපදවීමට හැකියාව ලැබේ. විශ්‍රාමික අය සඳහා සුදුසු රැකියා ලාබ සැලසේ. බලාපොරොත්තුවල ප්‍රමාද වීම් සිදුවේ.

### • මීන — නව ආදායමක්

පාලක පක්ෂයේ ප්‍රසාදයට හේතු යෙදේ. පවුලේ සමගියට බාධක මතු වීමට ඉඩ ඇති දිනයකි. නව ආදායම් මාර්ග සැලසේ. සන්ධ්‍යා කාලයේ කෙටි ගමන් බිමන් යෙදේ.

**ගම්පහ - අබේසේන හේරත්**

**මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය - කළමනාකරණ**
**භාරය තොග වෙළඳපොළ දෛනික මසුන් මිල ගණන්**

2021.04.02 දින මසුන් මිල ගණන්

| මසුන් වර්ගය | ඒකක මිල (කි.ග්‍රෑම් 1) |
|---|---|
| තෝරා - බිලි | 1100.00 |
| පරව් - ලොකු | 500.00 |
| පරව් - මධ්‍යම-ඇටනගුල | 700.00 |
| කබර පරව් | 600.00 |
| ඇටනගුල් පරව් L | 600.00 |
| අංජිලා නයිලෝන් B | 1000.00 |
| බලයා - ලොකු D/T | 380.00-300.00 |
| බලයා - කුඩා (H)D | 480.00 |
| කෙලවල්ලා -ලොකු | - |
| කෙලවල්ලා - කුඩා | 680.00 |
| කෙන්ද - බොකු සහිත | 650.00 |
| තලපත් - ලොකු T | 680.00 |
| ඇටිස්සා - ලොකු | 550.00 |
| ඇටිස්සා - කුඩා | - |
| හබරලි (රවුම්) | 430.00 |
| හබරලි පටි | - |
| ජීලා - ලොකු | 550.00 |
| ජීලා - මධ්‍යම | 570.00 |
| ඇටවල්ලා - ලොකු | 520.00 |
| ඇටවල්ලා - කුඩා | - |
| පියාමැස්සා - M/S | - |
| හුරුල්ලා - කොර | 450.00 |
| ගල් හුරුල්ලා | - |
| සාලයා (යක්) | 220.00 |
| සාලයා (මට්ට) | 240.00 |
| හාල්මැස්සා | 300.00 |
| සප්පරා (ශුද්ධ) | - |
| වන්නා | - |
| දැල්ලා - පිලී (N) | 650.00 |
| දැල්ලා - ගෙඹි | - |
| දැල්ලා - කුඩා | 700.00 |
| දැල්ලා - (ශුද්ධ) | - |
| ඉස්සා - ලොකු - සුදු | 1150.00 |
| ඉස්සා - මධ්‍යම - සුදු | 1050.00 |
| ඉස්සා - කුඩා | 430.00 |
| සවරා | 800.00 |
| මොරැල්ලා (සුදු) | - |
| ලින්නා - ලොකු | 420.00-430.00 |
| ලින්නා - කුඩා | - |
| සුද්දා L | 530.00 |
| මුහුදු කකුළුවා - ලොකු (රතු) | 600.00-630.00 |
| ලෝමැස්සා M | 400.00 |
| ගින්නටි පරව් L | 580.00 |
| කටුවල්ලා L | 350.00 |
| සූඩයා (මාදැල්) | 180.00 |
| සිලින්ද | - |
| කාරල්ලා S | 120.00 |
| මාළු බිත්තර | - |
| තිලාපියා M | 400.00 |
| වෙල්ලසූඩයා | - |
| තොණ්ඩයා | - |
| පොතු බරි | 180.00 |
| මෝද | - |
| කීරලාවා | 350.00 |
| මඩුවා | - |
| පානතඹුවා | - |
| ශුද්ධ කොයි | - |
| කුම්බලාවා H | 530.00 |
| බෝල්ලා M | 430.00 |
| කුම්බලාවා/බෝල්ලා (කුඩා) | - |
| හැඩැල්ලා | 900.00 |
| සුරාපරව් M | 400.00 |

# ඉඩි අමීන්ට අමතක නොවන පාඩමක් ඉගැන්වූ ජෝන් කොතලාවල



**(ජෝන් කොතලාවල මහතාගේ ජන්ම දින සැමරුම හෙට 4 වැනිදාට යෙදේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.)**

ශ්‍රී ලංකාවේ තෙවැනි අගමැතිවරයා වූ ජෝන් ලයනල් කොතලාවල මහතා ප්‍රසිද්ධියට පත්වූයේ ශ්‍රීමත් ජෝන් කොතලාවල නමිනි. ඔහු උපත ලද්දේ මීට වසර 124 කට පෙර එනම් 1897 අප්‍රේල් 04 වැනිදා මොහුට වසර දහය සපිරෙන විට සිය පියා මිය යන්නේ ඔවුන්ගේ පවුලට දුක, ශෝකය, දරිද්‍රතාව ඉතිරි කරමිනි.

විටෙක 'මිහිර' පුවත්පතට තම කුඩා කාලය පිළිබඳව කරුණු පවසන ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා තමා පාසල් ගියේ පා ගමනින් බවත්, මෙසේ පාසල් යනවිට වෙනත් දරුවන් බක්කි කරත්තවල නැගී පාසල් යෑම සිරිත කරගෙන තිබුණු බවත් කියයි. එසේ පාසල් යනවිට තමා ළමයින් නංවාගෙන යන බක්කි කරත්තයක පිටුපස පා පුවරුවේ නැඟ යන්නට පුරුදු වුණ නිසා බොහෝවිට කරත්තකරුවාගේ කෝටු පහර වැදී පා පුවරුවෙන් බිමට බැස වේදනාවෙන් පාසල් ගිය අයුරු සිහිපත් කරයි. මෙසේ ශෝචනීය ලෙස කල් ගෙවන මෙම පවුලේ පිහිටට පැමිණියේ ඩී. එස්. සේනානායක මහතාගේ වැඩිමහල් සොහොයුරු දේශබන්ධු ඇෆ්.ආර්. සේනානායක මහතාය. ඔහු කොතලාවල මහතාගේ මවගේ නැගණියගේ ස්වාමි පුරුෂයා විය. ඇෆ්.ආර්. සේනානායක මහතා ජෝන් කොතලාවල කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් කර අධ්‍යාපනය ලබා දෙන්නට විය. එකල රාජකීය විද්‍යාලයේ ඉගෙනුම ලැබූ සර්. ජෝන්ගේ එම පාසලේ සමකාලීන මිතුරන් වූයේ කීර්තිමත් වෛද්‍යවරයකු වූ ශ්‍රීමත් නිකලස් ආටිගල, සෙනෙට් සභාවේ හිටපු සභාපති ශ්‍රීමත් සිරිල් ද සොයිසා යන අයයි.

රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය නිමවා එංගලන්තයට ගොස් ක්‍රේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයට ඇතුළත් වන සර්. ජෝන් කොතලාවල මහතා එහි අධ්‍යාපනය ලබා දෙවනුව එකතු වන්නේ ලංකාවේ යුද හමුදාවේ දෙවෙනි පාබල සේනාංකයේ දෙවන ලුතිනන් වරයෙකු වශයෙනි. ක්‍රීඩා අංශයෙන්ද දක්ෂකම් දැක්වූ කොතලාවල මහතා ක්‍රිකට් සහ පෝලෝ ක්‍රීඩාවන් පිළිබඳවද ශූරයෙකු විය.

ජෝන් කොතලාවල මහතා දේශපාලනයට යොමු වන්නටත් පෙර සමාජ සේවයට යොමුවූයේ ඇෆ්.ආර්. සේනානායක මහතාගේ ආභාෂයෙනි. ඔහු යුරෝපියකු ලෙස පෙනී සිටියත්, උපතින් ලද සිංහලකම හා බෞද්ධකම අත්නොහැර රැකගත්තේ සිය එඩිතර බව ප්‍රදර්ශනය කරමිනි. වරක් රත්මලාන ප්‍රදේශයේ පැවති ඉඩම් වෙන්දේසියක් නැරඹීමට ඔහු ගියේ යොවුන් තරුණයකු ලෙසිනි. මෙම ඉඩම් වෙන්දේසියේ දී අසිංහල ව්‍යාපාරිකයන් සුළු ගණන්වලට විශාල ඉඩම් ප්‍රමාණයක් තමන් සතුකර ගන්නා අයුරු දුටු කොතලාවල තරුණයාට ඇතිවූයේ මහත් සංවේගයකි. සිංහල මිනිසුන්ට හැකිවූයේ වෙන්දේසිය දෙස බලා සිටීම පමණි. බිම් අඟලක්වත් ගැනීමට මුදල් ඔවුන් සතු නොවීය. කොතලාවල තරුණයා අත ද මුදල් නොමැත. අසිංහල ව්‍යාපාරිකයන්ට හොඳ පාඩමක් උගන්විය යුතු යැයි සිතූ කොතලාවල ඊළඟට වෙන්දේසියට ඉදිරිපත් කළ අක්කර ගණනාවක ඉඩමට ඔහු ලන්සුවක් තැබුවේය. ඊට වඩා වැඩි ගණනක් වෙනත් ජාතිකයකුගේ ලන්සුවක් විය. එවිට කොතලාවල මහතා ඊට වඩා වැඩි ගණනකට ඉඩමේ මිල ඉහළ නැංවීය. මෙම දෙදෙනා අතර තිබුණ වෙන්දේසිය අවසන් වූයේ කොතලාවල තරුණයාට වෙන්දේසියෙන් ඉඩම හිමිවීමෙනි. ඔහුට ඉඩමක් ගැනීමට සතයක්වත් තිබුණේ නැත. ඔහුට වෙන්දේසියේ ඉඩම තීන්දු වීමත් සමඟ අවට සිටි අයත් පෙරළාගෙන ඔහු දුවන්නට වූයේය. වෙන්දේසිකරුවෝ ඔහු පසුපස එලවාගෙන අවුත් අල්ලා ගත. ඔහුට හිමිවූ ඉඩම මුදල් ගෙවා ලබා ගන්නා ලෙස තරවටු කළහ. නමුත් අතේ සතයක් නොමැති ඔහුට මේසා විශාල මුදලක් සිහිනයක්ම පමණි.

සිදුවූ පුවත ඇෆ්.ආර්. සේනානායක මහතාට ආරංචි විය. ඔහු පැමිණ නියමිත වෙන්දේසි මුදල ගෙවා එම ඉඩම කොතලාවල මහතාට රැගෙන දුන්නේය. එදා අසිංහල ව්‍යාපාරිකයකු සමඟ ජාති වාත්සල්‍යය නිසා තරඟ වැදී ලබාගත් ඉඩම අද හිමි අප රටේ සමස්ත ජාතියටමය. එය කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය පිහිටි රත්මලානේ, කඳවල වලව්වයි.

1931 දී පැවති රාජ්‍ය මන්ත්‍රණ සභා ඡන්දයට කොතලාවල මහතා ඉදිරිපත් වූයේ ඩී.එස්. සේනානායක මහතාගේ ඉල්ලීමටය. ඔහු කුරුණෑගල ඡන්ද කොට්ඨාසයට ඉදිරිපත් විය. නාම යෝජනා භාර ගන්නා දිනයේ සුදු දිසාපතිවරයා සියලු ඡන්ද අපේක්ෂකයන්ගෙන් තම තමන් ඡන්දය ඉල්ලන හේතු විමසීය. සියල්ලෝම කීවේ ඉංග්‍රීසි ආණ්ඩුවට උදව් වීමටත්, ඔවුන්ට සේවය කිරීමටත් ඡන්දය ඉල්ලන බවය. කොතලාවල මහතාගෙන් ද කරුණු විමසීය.

ඔහු පැවසුවේ "උඹලා සිංහලුන් ද, ඉංග්‍රීසි ආණ්ඩුවට උදව් වෙන්න ඡන්දයක් ඉල්ලන්න ඕන ද?, සුද්දන්ට ඒක කරගෙන යන්න පුළුවන්. මම ඡන්දය ඉල්ලන්නේ සුද්දෝ මේ රටේ තියාගන්න නෙවෙයි. ලංකාවේ ඉන්න අන්තිම සුද්දත් එළවන්න." යැයි කොතලාවල මහතා පැවසුවෙන් කෝප වූ සුද්දා ''කට වහගනිං'' කියා හඬ තැලුවේ හී පාරවල් වැනි කොතලාවල මහතාගේ වචන වලින් බේරීමටය.

1931 වසරේ ජුනි 13 වැනිදා දින පැවති රාජ්‍ය මන්ත්‍රණ සභා ඡන්දයෙන් කුරුණෑගල අසුන ජයගත් කොතලාවල මැති සබයට පැමිණියේය. ඔහු කුරුණෑගල ප්‍රදේශයේ දියුණුව ආරම්භ කළේ සැබෑ මානව හිතවාදියකු ලෙසය. 1936 වසරේ පැවති රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයේදීද කුරුණෑගලට තරඟ කළ කොතලාවල මහතා එම ඡන්දයෙන් ද පහසු ජයක් ලැබුවේය. ඒ අනුව එම පාලන යුගයේදී මං මාවත් හා කර්මාන්ත ඇමති ධූරයට පත්වූ කොතලාවල මහතා ඩී.එස්. සේනානායක මහතාගේ ගොවි ජනපද ව්‍යාපාරයට සිය සවිය ලබා දුන්නේ ගොවි ජනපදවලට නව මං මාවත් නිර්මාණය කර දීමෙනි. මින්නේරිය ගොවි ජනපදය ගොඩනගන්නට මූලික සවිය, දිරිය ලබා දෙමින් එහි ආරම්භය සනිටුහන් කළේ ජෝන් කොතලාවල මහතාය.

1946 දී එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමේ දී කොතලාවල මහතාද?, බණ්ඩාරනායක මහතාද එහි උප සභාපතිවරු වූහ. 1947 දී පිහිට වූ එක්සත් ජාතික පක්ෂ රජයේ ප්‍රවාහන සහ රජයේ වැඩ ඇමතිවරයා වශයෙන් දිවුරුම් දුන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩම්ගස්ලන්ද මන්ත්‍රීවරයා වශයෙන් පත්වීමෙනි. ඩී.එස්. සේනානායක රජයේ ද කොතලාවල හා බණ්ඩාරනායක යන ඇමතිවරුන් අතර තරඟයක් වූයේ පක්ෂයේ දෙවැන්නා වීමටය. ඔවුන්ගේ සීතල අරගලය උණුසුම් වීමත් සමඟම බණ්ඩාරනායක මහතා එක්සත් ජාතික පක්ෂ රජයෙන් ඉවත් වී ගියේය. ඒ සමඟම පාර්ලිමේන්තුවේ බණ්ඩාරනායක මහතා දැරූ සභානායක පදවිය හිමිවූයේ කොතලාවල මහතාටය.

1952 දී සිදුවූ ඩී.එස්. සේනානායක මහතාගේ හදිසි අභාවයත් සමඟම කොතලාවල මහතා අගමැති පදවිය අපේක්ෂා කළත්, අගමැති පදවිය හිමිවූයේ ඩඩ්ලි සේනානායක මහතාටය. එවකට අගමැති ධූරයට එක්සත් ජාතික පක්ෂයේ සුදුස්සා කොතලාවල මහතා වුවත් මියගිය අගමැති සේනානායක මහතා සොල්බරි සාමිවරයාට පවසා තිබුණේ තමා හදිස්සියේ මියගිය හොත් අගමැති පදවිය තම පුත් ඩඩ්ලි සේනානායක මහතාට පවරන ලෙසය. එය එසේම විය. මෙයින් කොතලාවල මහතා වේදනාවටත්, කනස්සල්ලටත් පත්වුවත් පක්ෂය අතහැර ගියේ නැත. පක්ෂය විනාශ කිරීමට සැලසුම් කළේ ද නැත.

1952 වසරේ පැවති මහ මැතිවරණයට ද එක්සත් ජාතික පක්ෂයෙන් දෙඩම්ගස්ලන්ද අසුනට තරඟ කළ කොතලාවල මහතා එම මැතිවරණයෙන්ද ජය ලබා මැති සබයට පිවිස ඩඩ්ලි සේනානායක මහතාගේ රජයේ පෙර දැරූ ඇමති පදවියට ලැබ කටයුතු කළේ ඩඩ්ලිගේ නායකත්වය පිළිගනිමිනි.

**එක්සත් ජාතික පක්ෂ සභාපති, හිටපු අමාත්‍ය**
**වජිර අබේවර්ධන**

1953 වසරේ ඇතිවූ සහල් අර්බුදයත් සමඟ ඇතිවූ හර්තාලය නිසා ඩඩ්ලි සේනානායක මහතා අගමැති පදවියෙන් ඉල්ලා අස්වූ හෙයින් නව අගමැතිවරයා වූයේ සර්. ජෝන් කොතලාවල මහතාය. ඔහු 1953 ඔක්තෝම්බර් මස 13 වැනිදා දින ලංකාවේ නව අගමැතිවරයා වශයෙන් දිවුරුම් දී වැඩ භාර ගත්තේය. ඒ අනුව ලංකාවේ තෙවැනි වරට පත්වූ අගමැති වරයා වූයේ සර්. ජෝන් කොතලාවල මහතාය.

ලංකාව නොබැඳි ජාතීන්ගේ සංගමයට මුල් බීජය වැටුණු කොළඹ බලවතුන්ගේ සංගමය පැවැත්වූයේ ඔහුගේ කැපවීමෙනි. නොබැඳි සමුළුවේ බැංඩුං සම්මේලනයේදී ඔහුගේ ක්‍රියා කලාපය නිසා ඔහු "බැංඩුං වීරයා" ලෙසද හැඳින්වීමට ලක්විය. කොළඹ නව කැලණි පාලම ඔහුගේ මෙහෙවරක ප්‍රතිඵලයකි. ඔහු හමුදාවේ සිටි සමයේ ලංකාවට පැමිණි විදේශීය හමුදා බණ්ඩයක සේවය කළ හිතුවක්කාර නිලධාරියකු වූ පසුව උගන්ඩාවේ ජනාධිපති වූ "ඉඩී අමීන්ට" අමතක නොවන පාඩමක් ඉගැන්වීමට කොතලාවල මහතාට හැකිවිය. ලංකාවේ සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූ සෝල්බරි සාමි ලංකාවෙන් ඉවත්කර ඒ වෙනුවට සිංහල ආණ්ඩුකාරවරයකු පත්කර ගැනීමට කටයුතු කළේ කොතලාවල මහතා විසිනි. ලංකාවේ නිදහස් සමරුවේදී අප රටේ ජාතික කොඩියට සමගාමීව ඉංග්‍රීසි කතිර කොඩිය එසවීමද සිදුවිය. කොතලාවල මහතා අගමැති වූ පසු ඒ පිළිවෙත ඉවත් කළේ තමාගේම තීරණයක් අනුවය.

කොතලාවල යනු වංචා, දූෂණ නොමැති කාටවත් බිය නොමැති පුද්ගලයකු විය. ඔහු සතුන්ට ඉතා ආදරය කළේය. තමාගේ ගෙවත්ත වූ රත්මලානේ, කඳවල වත්ත අභය භූමියක් බඳුවිය. ගස්වැල් පිරී ඉතිරී ගිය වන උයනක සිරිය ගත්තේය. සර්. ජෝන් කොතලාවල මහතා එක්සත් ජාතික පක්ෂයේ තුන්වන වරට පත්වූ නායකයා විය. 1956 මහ මැතිවරණයේදී ජෝන් කොතලාවල මහතා පරාජයට පත්වූයේය. ඔහු තම ආසනය වූ දෙඩම්ගස්ලන්ද දිනා මැති සබයට පිවිස ටික කාලයක් සිට දේශපාලනයෙන් සදහටම සමුගත්තේය.

ඔහුගේ සේවය අගය කළ ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ඔහුට සේනාධිනායක පදවියක් පිරිනැමුවේය. 1980 ඔක්තෝම්බර් මස 01 වැනි දින මෙම අභීත නායකයා සදහටම දෙනෙත් පියාගත්තේ ලක් ඉතිහාසයට අමරණීය නාමයක් ඉතිරි කරමිනි.

# මෝටර් රථ යතුරුපැදි ගැටී දෙදෙනෙක් මරුට

**(මත්තේගොඩ ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න)**

**පන්නිපිටිය - බොරැල්ල මාර්ගයේ පොල්වත්ත මංසන්දියේදී ඊයේ (02) අලුයම සිදුවූ මෝටර් රථ - යතුරුපැදි අනතුරින් යතුරුපැදියේ ගමන්ගත් දෙදෙනකු ජීවිතක්ෂයට පත්ව ඇතැයි මහරගම පොලිසිය පවසයි.**

මෙසේ මියගොස් ඇත්තේ යටියන්තොට, මලල්පොල පදිංචි කසුන් බණ්ඩාර (26) සහ මීගොඩ පදිංචි ප්‍රබෝධ මධුශංක (25) දෙදෙනකු බව පොලීසිය කියයි.

මෙම දෙදෙනා යතුරුපැදියක පන්නිපිටිය දෙස සිට බොරැල්ල දෙසට ගමන් කරමින් සිටියදී බොරැල්ල දෙස සිට පැමිණි මෝටර් රථයක් මුහුණට මුහුණ ගැටී මෙම අනතුර සිදුව ඇතැයි පොලිසිය කියයි.

අනතුරින් යතුරුපැදියේ ගමන් ගත් එක් පුද්ගලයකු එම ස්ථානයේදීම මියගොස් ඇති අතර අනෙක් පුද්ගලයා ප්‍රතිකාර සඳහා කළුබෝවිල ශික්ෂණ රෝහලට රැගෙන යමින් සිටියදී මියගොස් ඇති බව පැවසේ .

අනතුර සිදු කළ බව කියන මෝටර් රථය සහ එහි රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු නුගේගොඩ අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව සිටියේය.

# අලුත්ගම කුඩා තෙල්මෝල්වලට සරු කලක්

**(අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)**

**පැතිර යන ආන්දෝලනාත්මක පිළිකාකාරක පොල්තෙල් කතාබහට බියෙන් මේ දිනවල සහ එළඹෙන සිංහල අලුත් අවුරුද්දට රසකැවිලි ඇතුළු ආහාර සකසා ගැනීමට අවශ්‍ය පිරිසුදු පොල් තෙල් ලබා ගැනීමට අලුත්ගම, බේරුවල, පයාගල සහ බෙන්තොට ප්‍රදේශවල ග්‍රාමීය මට්ටමින් තෙල් සිඳින කුඩා පොල් තෙල් මෝල්වලට ගොස් ඇනවුම් ලබාදීමට කටයුතු කරන බව ජනතාව කියති.**

ග්‍රාමීය මට්ටමෙන් පොල්තෙල් සිඳින කුඩා තෙල් මෝල්වලට ද සැලකිය යුතු නිෂ්පාදනයක් සිදු කිරීමට නොහැකිව ඇත්තේ පවතින පොල් මිල ඉහළ යාම බව ඔවුහු සඳහන් කරති.

කුඩා පොල් තෙල් මෝල්වලින් පොල් තෙල් ලබාගැනීමට ඇතැම් පිරිස් අත්තිකාරම් මුදල් පවා ගෙවීමට යෝජනා කරන බවත් එම මෝල් හිමියන්ගෙන් කළ විමසීමේදී දැනගත හැකිවිය.

අවුරුදු චාරිත්‍ර සමරන්න බොහෝ වැඩිහිටි කාන්තාවන් කැවිලිපෙවිලි ආහාර ද්‍රව්‍ය සැකසීමට යොදගනු ලබන්නේ ඉතා පිරිසුදු පොල් තෙල් බවත්, එලෙස සකසා ගන්නා කැවුම් කොකිස් අතිරස ආස්මී ඇතුළු කැවිලි වර්ග පිරිසුදු පොල්තෙල්වලින් සැකසුවහොත් දින 7කට පසු කාලයකින් වුවද එම කැවිලි වර්ග ආහාරයට ගත හැකි බව වැඩිහිටියන් විශ්වාස කරන බව ඔවුහු සඳහන් කරති.

# තුන්මංසල

| | |
|---|---|
| **විපක්ෂයෙ එදා වියතකු පරිදි** | **සිටි** |
| **රුපියල රැකගන්න වැගිරුව කඳුළු** | **කැටි** |
| **ඒ රුපියල පණ අදිමින් බිමට** | **වැටි** |
| **අද බන්දුල කෝකියමින් අඬන** | **හැටි** |

**තිලක**


# හොයාගෙන ගිහින් පිළිකාව නසන අලුත් ප්‍රතිකාර ක්‍රමයක්

## කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයෝ හඳුන්වාදෙති

**මිනිස් සිරුරේ පවතින පිළිකා සෛල හඹා ගොස් එහි ඇති පිළිකා පියවි සෛල (Cancer Stem Cells) පමණක් මරා දැමිය හැකි නැනෝ තාක්ෂණික ප්‍රතිකාර ක්‍රමයක් කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයන් පිරිසක් හඳුන්වාදී තිබේ.**



ආචාර්ය සමීර ආර්. සමරකෝන් | මහාචාර්ය නේද්‍රා කරුණාරත්න | මහාචාර්ය කමනි තෙන්නකෝන් | අමල් හුලංගමුව | උමා රාජගෝපාලන්





ගොරකා, මැංගුස් වැනි ශාකවල බහුලව දක්නට ලැබෙන ගාසිනෝල් සංයෝගය තවත් රසායනික සංයෝග දෙකක් සමඟ නැනෝ තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සුසංයෝග කර සිරුරට ඇතුළත් කිරීමෙන් පිළිකා පියවි සෛල විනාශයට පත්කිරීම සිදුකෙරේ.

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායනික අණුක ජීවවේද සහ ජෛව තාක්ෂණික ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සමීර ආර්. සමරකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් මහාචාර්ය නේද්‍රා කරුණාරත්න, මහාචාර්ය කමනි තෙන්නකෝන්, අමල් හුලංගමුව සහ උමා රාජගෝපාලන් යන විද්‍යාඥයෝ මෙම පර් යේෂණය සිදුකළහ. ගොරකා සහ මැංගුස් යන ශාකවල ඇති ගාසිනෝල් සංයෝගය ප්‍රති පිළිකාකාරක ඖෂධයක් ලෙස ක්‍රියාකරන අතර එහි ඇති විශේෂත්වය වනුයේ සිරුරේ ඇති අනෙකුත් සාමාන්‍ය සෛලවලට කිසිදු බලපෑමක් ඇති නොකිරීමය. මෙම නව ඖෂධ ක්‍රමයේ ඇති තවත් විශේෂත්වයක් වනුයේ පිළිකා පියවි සෛල ඒකරාශී වී වර්ධනයවීමට වැඩි ඉඩකඩක් ඇති අඩු ඔක්සිජන් සාන්ද්‍රණයකදී පවා පිළිකා පියවි සෛල මරණයට පත්කිරීමය. විද්‍යාඥයන් විසින් සොයාගත් නව ප්‍රතිකාර ක්‍රමය Journal of Food Quality ජාත්‍යන්තර විද්‍යාත්මක ජර්නලයේ පළකර තිබේ.

**ඒ පිළිබඳව 'විදුසෙවණ'ට අදහස් දැක්වූ ආචාර්ය සමීර ආර්. සමරකෝන් මහතා:**

"මිනිසාට වැළඳෙන බෝ නොවන රෝග අතරින් ලෝකයේ දෙවන ස්ථානය හිමිකරගෙන තිබෙන්නේ පිළිකා රෝගයයි. පිළිකාව නිසා ලෝකයේ මිලියන 10 ක් පමණ පසුගිය වසරේ මිය යන්නට ඇතැයි ගණන් බලා තියෙනවා. පිළිකාවට ප්‍රතිකාර ක්‍රම බොහෝ තිබුණද වැඩිවන නව පිළිකා රෝගීන් සංඛ්‍යාව අඩුකර ගැනීම සඳහා සෑහීමකට පත්විය හැකි පරිදි ප්‍රතිකාර ක්‍රමයක් සොයාගැනීමට පර් යේෂකයන් සමත්වී නෑ.

මෙම ප්‍රතිකාර ක්‍රමයෙන් මිනිස් සිරුරේ පවතින පිළිකා පියවි සෛල හඹා ගොස් මරණයට පත්කිරීමට හැකියාව තියෙනවා. මෙම නව ප්‍රතිකාර ක්‍රමය ඉදිරියේදී තවත් වැඩිදියුණු කර සායනික පර් යේෂණ සඳහා යොදාගැනීමට බලාපොරොත්තු වෙනවා. එමෙන්ම මෙවැනි ජනතා ප්‍රතිලාභී පර්යේෂණ ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ලොවපුරා විසිරී සිටින පරිත්‍යාගශීලීන්ට මුදල් ආධාර ලබාදිය හැකි ක්‍රමයක් නුදුරේදී හඳුන්වා දෙනවා' යැයි ආචාර්ය සමරකෝන් මහතා කීය.

**- ගයාන් සූරියආරච්චි**

# හෝන් එක ලෙඩ වෙලාද?



**"තාත්තා, වාහනේ හෝන් එක (HORn-නළාව) වැඩ කරන්නේ නෑ. බැටරිය බැහැලද දන්නෙත් නෑ. හෝන් එකේ දෝෂයක්ද දන්නෙත් නෑ." පුතා කිව්වා.**

''පුතා, වාහනේ සිග්නල් ලයිට් (Signal LIGHT- සංඥ විදුලි පහන්) හොඳට වැඩ කරනවා නේද? වාහනේ ස්ටාර්ට් කරන්නත් (Start- පණගන්වන්නත්) පුළුවන් නේද? බැටරියේ වැරැද්දක්ම කියන්නත් බෑ. වාහනේ හෝන් එක පරීක්ෂා කරන්නත් ඕන. එහෙම නැත්නම් හෝන් එකට විදුලිය ලැබෙන්නේ නැද්ද දන්නෙත් නෑ''තාත්තා කිව්වා

''ෆියුස් එකක් (FUSE-විලායකයක්) පිළිස්සුනො හෝන් එකට විදුලිය ලැබෙන්නේ නෑ නේද?'' දුව මතක් කර දුන්නා.

ඔව් ඒක ඇත්ත. අපි මුලින්ම හෝන් එකට සම්බන්ධ ෆියුස් එක පරීක්ෂා කර බලමු. මෙතන විලායක පුවරුවේ (FUSE BOARD) තියෙන්නේ වාහනයේ එක් එක් විදුලි උපකරණවලට විදුලිය සපයන විලායක. එවායේ ඇම්පියර් 10 (10A), ඇම්පියර් 15(15A), ඇම්පියර් 20 (20A) යනාදී වශයෙන් විලායක තිබෙනවා. එක් එක් විදුලි උපකරණ ලබාගන්නා විදුලි ධාරාව වෙනස් නිසා එසේ විවිධ ධාරාවන්ට ගැලපෙන විලායක තිබෙනවා.

හෝන් එකට සම්බන්ධ ෆියුස් එකක් මෙතන තියෙනවා. අපි ඒක ගලවලා පරීක්ෂා කරලා බලමු.

''තාත්තා මේ ෆියුස් එක ඇතුළේ තරමක් සිහින් කම්බියක් තිබෙනවා. ඒක මැදින් කැඩිලා වගේ. මේ ෆියුස් එක පිච්චිලා'' දුව ඇහුවා. දුව වාහනේ විදුලි පරිපථයට සම්බන්ධව විවිධ විදුලි උපකරණ වාහනේ බැටරියට සම්බන්ධ කර තිබෙනවා. වාහන බැටරියේ සෘණ අග්‍රය වාහනේ චැසියට සම්බන්ධ කර ඇති අතර ධන අග්‍රය ස්විචයක්, විලායකයක් හරහා විදුලි උපකරණයට සම්බන්ධ කර තිබෙනවා. විදුලි උපකරණයේ ඇති ප්‍රතිරෝධය (බාධාව) මගින් ගලන ධාරාව පාලනය වෙනවා. විදුලි උපකරණයක් නොමැතිව කෙළින්ම ධන අග්‍රය සෘණ අග්‍රය හා සම්බන්ධ වුවහොත් පාලනයක් නාමැතිව බැටරියෙන් උපරිම ධාරාවක් ගලා යන නිසා විදුලි පරිපථයේ වයර් අධික ලෙස රත්වී විනාශවීමට හෝ ගිනි ගැනීමට පවා ඉඩ තිබෙනවා. විලායක යොදා ඇති විට එවැනි අවස්ථාවකදී විලායක ක්‍රියාත්මක වී විදුලිය නතර වෙනවා.

''මේ ෆියුස් එක වෙනුවට මීට සමාන ෆියුස් එකක් සවි කළා. දැන් හරි හෝන් එක වැඩ කරනවා. ඊට වඩා වැඩි අගයක් ඇති ෆියුස් එකක් තාවකාලිකව වත් සවි කිරීම සුදුසු නැහැ.'' තාත්තා කිව්වා.

**- සරත් ආනන්ද අල්විස්**

# ලංකාදීප විදු සෙවණ

## නව ලොව සාර සංග්‍රහය

# නියැන්ඩතාල් මානවයාගේ දත් ගල් ගුහාවක

**ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටි නියැන්ඩතාල් මානවයාට අයත් දත් කිහිපයක් පෝලන්තයේ ගල් ගුහාවක තිබී සොයා ගැනීමට මානව විද්‍යාඥයෝ පිරිසක් සමත් වූහ.**



ඒ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂණවලදී හෙළි වී ඇත්තේ එම දත් දැනට අවුරුදු 46,000 කට වඩා පැරැණි බවය. ප්‍රාග් ඓතිහාසික යුගයේ වෛද්‍ය විද්‍යාව සිත් ඇදගන්නාසුළු නොවූ නමුත් නියැන්ඩතාල්වරුන් දන්ත සනීපාරක්ෂක ක්‍රම අනුගමනය කර ඇති බවට පරීක්ෂණවලදී සාධක හමුවී තිබේ.

එම දත් ප්‍රථමවරට සොයාගෙන ඇත්තේ වර්ෂ 2010 දී වන අතර දතේ මයිටොකොන්ඩ්‍රියම ඩීඑන්ඒ පරීක්ෂණ වාර්තාවකින් පසුව නියැන්ඩතාල් මානවයාගේ බවට සනාථ කර තිබේ. නියැන්ඩතාල්වරුන්ගේ දත්වල කැබිලි යුරෝපයෙන් සොයාගෙන ඇති නමුත්, මෙම සොයා ගැනීම්වලින් පෙනීයන්නේ ඒ සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් කිරීමට ඇති බවයි.

පෝලන්තයේ මානව විද්‍යාඥයන් පවසන පරිදි නියැන්ඩතාල්වරුන් ඔවුන්ගේ දන්ත සුරක්ෂිතාවය සඳහා දන්තාලේපයක් භාවිතා කර ඇති බවත් නමුත් එය කුමක්ද යන්න නිශ්චිතවම කිව නොහැකි බවය. ඇතැම් විට එය කිසියම් ගස් වර්ගයක අතු හෝ අස්ථි කැබැල්ලක් විය හැකි බව විද්‍යාඥයෝ අනුමාන කරති. මෙලෙස සොයා ගත් එක් දතක් වයස අවුරුදු 30 ට වැඩි පුද්ගලයකුගේ මුඛයේ ඉදිරිපස ඇති දතක් ද අනෙක් දත වයස අවුරුදු 20 ක පිරිමි පුද්ගලයකුගේ බව ද සිදුකළ පරීක්ෂණවලදී සොයාගෙන තිබේ. හොමෝ සේපියන්ලාගේ ෆොසිල සහ ඊට සමකාලීන මානවයන්ගේ දත්වල එනමලයේ ඝනකම, ව්‍යුහය සහ වෙනත් අංග සමඟ සංසන්දය කර එම දත් නියැන්ඩතාල්වරුන්ගේ බවට පරීක්ෂකයෝ සනාථ කළහ.

**මලීෂා ගුණවර්ධන**

(ඩේලිමේල් ඇසුරෙනි)

# ඊජිප්තුවෙන් මතු වූ කුරුළු සිතුවම්

**වසර 4600ක් පමණ පැරැණි සිතුවම් කිහිපයක් ඊජිප්තුවෙන් හමුවී තිබේ. ඊජිප්තුවේ 4වැනි රාජවංශයෙන් පැවත එන නෙෆර්මාට් කුමරුගේ ස්ථම්භය අසල ඉපැරැණි දේවස්ථානයක උතුරු කොටසේ බිත්තියක ස්වභාවික ලෙස මෙම සිතුවම් ඇඳ ඇත.**



මෙම සිතුවම්වල ඇඳ ඇත්තේ කිසියම් වූ කුරුළු විශේෂයකි. එය පාත්තයින් විශේෂයකගේ සිතුවම් බව පර්යේෂකයෝ අනුමාන කරති. දුඹුරු, කළු, අළු වර්ණ යොදා මෙම සතුන් සිතුවම් කර තිබේ. මෙම පක්ෂීන්ගේ සිතුවම් එකපෙළටම ස්වභාවික වර්ණවලින් වර්ණගන්වා ඇත. මෙම සිතුවම් 'Meidium Geese' ලෙසද හඳුන්වනු ලබයි. විද්‍යාඥයින් සඳහන් කරන්නේ මෙම බිත්ති මත යම් කොටසක් හාරා ඉවත්කර වර්ණවලින්ම පුරවා සිතුවම් කරන්නට ඇති බවයි. ඒ නිසාවෙන් බොහෝ කාලයක් ආරක්ෂා වෙමින් ස්වභාවික වර්ණ ඒ අයුරින්ම පවතින්නට ඇතැයිද ඔවුහු සඳහන් කරති.

දැනට මෙම සිතුවම් සහිත කොටස කයිරෝ නුවර කෞතුකාගාරයේ ආරක්ෂිතව තැන්පත් කර ඇත.

**සංජය එරමුදුගොඩ**

(ඩේලිමේල් අනුග්‍රහයෙනි)

# ලේ බිඳුවෙන් කොරෝනා සොයන ඔක්ස්ෆර්ඩ් පරීක්ෂණයට ජ'පුර විද්‍යාඥවරියකුත්



## • පැයක් ඇතුළත ප්‍රතිඵල

**ඇඟිලි තුඩින් ලබා ගන්නා රුධිර බිඳුවකින් කොවිඩ් ආසාදිතව ඇති- නැති බව හඳුනාගත හැකි සරල පහසු ලාබදායී ප්‍රතිදේහ-පරීක්ෂාවක් ඔක්ස්ෆර්ඩ් සරසවිය නිර්මාණය කර තිබේ. ඔක්ස්ෆර්ඩ්සරසවිය මගින් හඳුන්වා දී ඇති නවතම කොවිඩ් පරීක්ෂණයේ සාර්ථක බව අත්හදා බැලීමට ලංකාව ප්‍රමුඛ රටවල් 21ක් එක්ව සිටියි.**



මහාචාර්ය නීලිකා මලවිගේ

දැනට මූලික සායනික පරීක්ෂාවන්ගෙන් සියයට 90ක පමණ සාර්ථකත්වයක් පෙන්වා ඇති මෙම පරීක්ෂාව කෙනකුට සිය නිවසේ කාර්යාලයේ හෝ ක්ෂේත්‍රයේ ඕනෑම තැනකදි ඉතා පහසුවෙන් සිදුකර ඇස්පනාපිට ප්‍රතිඵල ලබාගතහැකි ඉතා සරල පරීක්ෂාවකි.ඔක්ස්ෆර්ඩ් සරසවිය හඳුන්වාදී ඇති රසායනික ප්‍රතික්‍රියාකාරකයක් ඇතුළත් බොත්තමක්බඳු උපකරණයකට කෙනෙකුගේ ඇඟිලි තුඩින් ලබා ගන්නා රුධිර බිඳුවක් එකතු කර පැයක් ඇතුළත කොවිඩ් ආසාදිතයන් නිශ්චිතව සහ නිවැරැදිව පියවි ඇසින් හඳුනා ගත හැකිබව ලංකාවේ මේ පිළිබඳ මූලික සායනික පරීක්ෂා සඳහා මාස 06ක පමණ කාලයක් පුරා දායක වන ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය විදුසෙවණට පැවසුවාය.



කොවිඩ් වෛරස ස්පයික් ප්‍රෝටිනය නිසා ඇතිවන ප්‍රතිදේහ ඇසුරුකර ගනිමින් ආසාදිතයන් හඳුනාගන්නා මෙම ක්‍රමවේදය තුළදී රුධිර බීඳුව තුළඇති රතු රුධිරානු කැටි ගැසී ගොනුවී එහි හැඩය වෙනස්කරගන්නා ආකාරය අනුව කොවිඩ් ආසාදිතව ඇති- නැති බව සරලව හඳුනාගත හැකිබව ඇය පෙන්වා දෙයි.

ලේබිඳුවකින් කොවිඩ් සොයන මේ පරීක්ෂාව වැඩි දියුණු කිරීමට තායිවානය ඉන්දියාව සහ ප්‍රංශ විද්වතුන්දඔක්ස්ෆර්ඩ් සහ එංගලන්ත ජාතික සෞඛ්‍ය ආයතනයේ පර්යේෂකයෝද එක්ව සිටිති.මෙ නව පරීක්ෂණය මගින් වෛරස ස්පයික් ප්‍රෝටීනය නිසා සිරුරේ ඇතිවන ප්‍රතිදේහ අරමුණු කර ගන්නා නිසා එන්නත් ලබා ගත් අය තුළ ඒ එන්නත් ක්‍රියාකාරීත්වය මැනවින් සිදුවෙනවාද යන වග පැහැදිලිව සනාථ කර ගැනීමටද මෙයින් හැකියාව ලැබේ.

මේ නවතම අඩුමිල සහ පහසු පරීක්ෂාව සඳහා භාවිතාකරන ඔක්ස්ෆර්ඩ් රසායණික ප්‍රතිකාරකය සහිත උපකරණ නොමිලේම එය ලබාගැනිමට අවශ්‍ය ලෝකයේ ඕනෑම පර්යේෂකයකු හෝ කණ්ඩායමකට ලබාදීමට තමන් සූදානම් බව මේ පර්යේෂණය සැලසුම් කළ ඔක්ස්ෆර්ඩ්හි මහාචාර්ය ඇලේන් ටවුන්සෙඩ් කියා තිබේ.ඒ අනුව දැනටමත් ශ්‍රී ලංකාව,ඉන්දියාව,තායිවානය,කොලොම්බියාව සහ නෝර්වේඇතුළු රටවල් 21ක මේ නව පර්යේෂණ ක්‍රමවේදය මෙවනවිට සායනික පරීක්ෂාවට ලක්කෙරෙමින් පවති.

**- සුගත්ප්‍රිය කුලතුංගආරච්චි**

# ජාන ශක්තියෙන් සීතල දරාගන්නා මිනිස්සු

**ලෝකයේ 1/5ක ජනගහයකට අධි ශීත කාලගුණයක උපතින් ජීවත්වීමට සිදුවීම තමන්ගේ ජානමය හැකියාවක් මත සිදුවන බව විද්‍යාත්මක සොයාගෙන තිබේ.**

ස්වීඩනයේ කොරොලින්ස්කා ආයතනය සෞඛ්‍ය සම්පන්න අවු: 18-32 අතර පුද්ගලයින් 32ක් පර්යේෂණයට යොමුකරමින් මේ තත්ත්වය තහවුරුකරගෙන ඇත. ඔවුන් සෙන්ට්‍රිගේට් 35 උෂ්ණත්වයෙහි තටාකයකට බස්සවා ඉලෙක්ට්‍රොනික චුම්බක මගින් ශරීරයේ මාංශපේශී පරීක්ෂා කිරීමෙන් මේ අනාවරණයන් වෙත ළඟාවී ඇත. මෙහිදී ඔවුන්ගේ ආහාර කෙඳි සහිත මිශ්‍රණයක් මගින් ඒ උෂ්ණත්වයන්ට සංවේදී වන ආකාරය වාර්තා කරගෙන ඇත. අප්‍රිකාවේ වසර 50,000කට එහා ශීත මහාද්වීපකරණයේදී ඔවුන්ගේ ශරීරවල පැවති කෙඳි මාංශපේශීන්ගේ ක්‍රියාකාරිත්වය ඒ වෙනස්කම් වෙත යෑමට ඔරොත්තු දී ඇත. ඔවුන් තෙත් වානන්තර ප්‍රදේශවලට පිවිසීමෙන් ඔවුනට දඩමස් හා කෙඳි බහුලව අහාරවල මිශ්‍ර පෝෂණය ලැබෙන්නට ඇතයි විද්‍යාඥයෝ විශ්වාස කරති.



(ලන්ඩන් ඩේලි මිරර් අනුග්‍රහයෙන්ද සන්ඩේ ටයිම්ස් පලවූ ලිපිය පරිවර්තනය)

**- බන්දුල නෝනිස්**

# එදිනෙදා දිවියට

## විනාඩි 15න් රෙදි වේලෙන වැඩකාරයා

**වැසි දිනවල රෙදි වේලාගැනීම ටිකක් අපහසු කරුණක් වුවත් Morus Zero Vacuum Dryer යන්ත්‍රයට නම් එය විනාඩි 15ක වැඩකි.**



මෙම රෙදි වියළීමේ යන්ත්‍රයේ ඇති වැකුම් තාක්ෂණය මගින් රෙදිවල ඇති ජාලය උරාගන්නා අතර ඉතා ඉක්මනින් රෙදි වියළා ගැනීමට හැකියාව ලැබේ.

ඉක්මනින් රෙදි වේලුනද ඔබේ ඇඳුම්වලට එමගින් කිසිදු හානියක් නොවන බව සමාගම පවසයි.

මෙය එහා මෙහා ගෙන යා හැකි උපකරණයක් වන අතර අවම උෂ්ණත්වයක් යටතේ ඕනෑම වර්ගයක රෙදි පළුදු කිරීමකින් තොරව ආරක්ෂාකාරීව වියළීම සිදුකෙරේ.

එපමණක් නොව මෙම යන්ත්‍රයේ ඇති අල්ට්‍රා වයලට් විසබීජ නාශක තාක්ෂණය ඔස්සේ සියයට 99.9%ක පමණ විසබීජ විනාශය කිරීම සිදුකෙරේ.

මෙමගින් සාම්ප්‍රදායික රෙදි වියළන යන්ත්‍රවලට වඩා සියයට 40ක් පමණ විදුලිය ඉතිරි කරන බවද පැවසේ. මීට අමතරව රෙදි වියළීම අවසන් වූ පසුව එහි ඇති සංවේදක මගින් ස්වයංක්‍රීයව යන්ත්‍රය ක්‍රියා විරහිත කිරීම සිදුකෙරේ.

(ගැජට් ෆ්ලෝ වෙබ් අඩවිය ඇසුරිනි)

## රාත්‍රියේ දරුවා නිදිකරවන්න ලාම්පුවක්

**කිරි දී දරුවා නිදි කරවීමට ඇඳට ගියද මධ්‍යම රාත්‍රිය වනතුරු නිදා නොගැනීමත් නිදගත් දරුවා මධ්‍යම රාත්‍රියේ අවදිවීමත්බොහෝ මවුවරුන්ට කරදරයක් බව අවිවාදයෙන් කිව යුතුය.**



ඊට විකල්පයක් වශයෙන් ජපාන සමාගමක් විසින් Ainenne නමින් ලාම්පුවක් නිපදවා තිබේ. මෙම ලාම්පුව මගින් කෘත්‍රිමව උදෑසන ආලෝකයක් නිකුත් කරන අතර දරුවා සුවදයක නින්දක් කරා එමගින් රැගෙන යයි.


මෙම ලාම්පුවට කෘත්‍රිම බුද්ධිය තාක්ෂණය අඩංගු කර ඇති අතර මෙය ලොව ප්‍රථම නින්ද පුහුණු කරන කෘත්‍රිම බුද්ධි ලාම්පුව ලෙස සැලකේ. ඔබේ දරුවාට කොපමණ කාලයක් නින්ද අවශ්‍යයද යන්න තීරණය කර ස්වයංක්‍රීයව හොඳම කාලයක් දරුවා නිදකරවනු ඇත. මීට අමතරව දරුවා රාත්‍රී නින්දේදී ඇඬුවහොත් ඊට හේතුව මෙම ලාම්පුව මගින් පෙන්වා දෙයි.

මෙම ලාම්පුවට ලොවපුරා විවිධ රටවල් 150ක පමණ දරුවන් හඬන ආකාර 150,000ක් පමණ විශ්ලේෂණාත්මක අඩංගු කර තිබේ. ඒ අනුව එමගින් දරුවා හඬන්නේ බඩගින්නේද? එසේ නොමැති නම් නිදිමත හේතුවෙන්ද යන්න පිළිබඳව උපදෙස් ලබාදේ.

(ගැජට් ෆ්ලෝ වෙබ් අඩවිය ඇසුරිනි)

**- ගයාන්**

# අඟහරු ගිය හෙලිකොප්ටරය වැඩට බසියි



**අඟහරු හෙවත් රතු ග්‍රහයා මත පතිත කළ පර්සිවරන්ස් නාසා රොබෝ ගවේෂණ යානය ගැන අමුතුවෙන් කීමට අවශ්‍ය නැත. යානය ගොඩබෑවේ අඟහරුගේ ජෙසෙරෝ ආවාටයටය. කුඩා මෝටර් රථයක් තරම් ප්‍රමාණයෙන් යුතු පර්සිවරන්ස් යානය ජෙසිරෝ ආවාටයට පතිත කිරීමට නාසා විද්‍යාඥයන් තීරණය කළේ ඊට විශේෂ හේතුවක් ඇති නිසයි. නාසා විද්‍යාඥයන් මෙම ආවාටය ගැන දැනගෙන තිබෙන්නේ, මීට පෙර රොබෝ ගවේෂණ යානා සහ රෝවර් යානා යවමින් කළ ගවේෂණ අනුවය.**

පර්සිවරන්ස් රෝවර් යානයට තවත් යානයක් සම්බන්ධ වී තිබේ. මෙම යානය කුඩා හෙලිකොප්ටරයකි. මෙය නම් කර ඇත්තේ ඉන්ජිනියුටි යනුවෙනි. ඩ්‍රෝන යානා අද ලෝකයට අලුත් දෙයක් නොවෙයි. ඉන්ජිනියුටි ඩ්‍රෝන හෙලිකොප්ටරයකි. නාසා ඉන්ජිනේරුවන් ඉන්ජිනියුටි හෙලිකොප්ටරය, පර්සිවරන්ස් රෝවරයේ බඩට සම්බන්ධ කර ඇත. ඉන්ජිනියුටි යානයේ අරමුණ, රෝවර් යානයෙන් මිදී, ගුවනට නැග ගුවනේ සිට අවට සෝදිසි කිරීම සහ ගවේෂණයයි. පසුගිය දා එම මෙහෙයුම් කටයුතු ආරම්භ විය. එය සුවිශේෂී මෙන්ම ඓතිහාසික සිදුවීමක් බව නාසා කියයි.

නාසා ආයතනය හෙලිකොප්ටර් යානයක් අඟහරු වෙත යැවූ පළමු අවස්ථාව මෙයයි. ඉන්ජිනියුටි හෙලිකොප්ටරය රෝවරයට සම්බන්ධ වී තිබිය දී හෙලිකොප්ටරයේ බැටරි රෝවරයේ සූර්ය කෝෂ හරහා ආරෝපණය වී පණ ගැන්විණි. දැන් හෙලිකොප්ටරය ගුවන්ගත වී මෙහෙයුම් ආරම්භ කර ඇත්තේ, ඊට සවි කළ සූර්ය පැනල තනිවම ආරෝපණය කර ගනිමිනි. රෝවරය මෙන් නොව, මෙම හෙලිකොප්ටරය මාස කීපයක් හෝ සති කීපයක් හෝ පමණක් ක්‍රියාත්මක වනු ඇතැයි පැවසෙයි. ඒ, අඟහරු මතුපිට අධික සීතලට හෙලිකොප්ටරයේ පරිපත විනාශ විය හැකි බැවිනි. පියාසර කිරීමට සැහැල්ලු විය යුතු බැවින්, හෙලිකොප්ටරය නිපදවා ඇත්තේ ඉතා සරල උපාංගවලිනි. කෙසේ නමුත් ඊට සවි කර ඇති කැමරාව අති නවීන තාක්ෂණයෙන් නිර්මාණය කරන ලද්දකි.

**- ලුසිත ජයමාන්න**

(නාසා ඇසුරිනි)

# අවුරුදු සමයේ පරණ කෑම විකුණන්න තියාගත්ත කඩ හිමියන් 26 කට වැඩ වරදී

(වාද්දුව දයා හේමන්ත සිල්වා)

**අලුත් අවුරුද්ද වෙනුවෙන් මිනිස් පරිභෝජනයට නුසුදුසු ආහාර අලෙවි කිරීමට කටයුතු කරන වාද්දුවේ වෙළෙඳුන් සොයා පෙරේදා (01) විශේෂ වැටලීමක් කළ බව වාද්දුව පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්.ඒ.ඩී. සනන්ත මහතා පැවසීය.**

කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ උපදෙස් පරිදි සිදුකළ වැටලීමේදී, අමු මස් සමඟ පිසූ ආහාර අලෙවි කිරීම, දූවිල්ලට හා මැස්සන්ට නිරාවරණය වන පරිදි අලෙවිය සඳහා ආහාර ප්‍රදර්ශනය කිරීම, ස්වස්ථතා රෙගුලාසි උල්ලංඝනය කිරීම සහ අපවිත්‍ර, පිළිකුල්, දිරාපත් වූ, බාල කළ ආහාර අලෙවි කිරීමට ප්‍රදර්ශනය කිරීම සහ රසායනික ද්‍රව්‍ය සමග ආහාර එකට ගබඩා කර තිබීම යන වරදවල් යටතේ වෙළෙඳසැල් හිමියන් 26 දෙනකුට අවවාද කිරීම්, තිදෙනකුට රතු නිවේදන නිකුත් කිරීම් සහ පස් දෙනෙකුට නඩු පැවරීම් සිදු කිරීමට පියවර ගෙන තිබේ.

එහිදී සුපිරි වෙළඳ සංකීර්ණ, තොග වෙළෙඳසැල්, ආපනශාලා, සිල්ලර වෙළඳසැල් සහ තේ කඩ හිමියන් පරීක්ෂාවට ලක් කර ඇති අතර, එහිදී අයිතම 8ක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ භාරයට ගෙන 3ක් විනාශ කිරීමටත් 5 කට නඩු පැවරීමටත් කටයුතු කරන බව පැවසේ.

කළුතර ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක, ආහාර ඖෂධ පරීක්ෂක, පානදුර,

## පස්දෙනකුට නඩු

මිල්ලනිය, බණ්ඩාරගම සහ මදුරාවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහභාගිත්වයෙන් වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී ඉන්ද්‍රමාලී ප්‍රනාන්දු මහත්මියගේ උපදෙස් පරිදි පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්.ඒ.ඩී. සනන්ත, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වන කලන පීරිස්, රුක්ෂාන් ධනංජය සහ හසිත මධුරංග යන නිලධාරීහු වැටලීමට එක්වූහ.

# වැල්ලවත්ත - බත්තරමුල්ල මගී බෝට්ටු සේවය වඩාත් කාර්යක්ෂම වෙයි

වැල්ලවත්තේ සිට බත්තරමුල්ල පරිපාලන කේන්ද්‍රස්ථානයට විනාඩි විස්සෙන් ළඟාවීමට හැකියාව ඇති මගී බෝට්ටු සේවාව කොවිඩ් වසංගත තත්ත්වය හමුවේද එදිනෙද ගමන් පහසුකම් සපයා ගැනීමට සුදුසු ආරක්ෂිත මාර්ගයක් බවත් මේ දිනවල එම බෝට්ටු සේවාව ඔස්සේ මගීන් හයදෙනා බැගින් දුරස්ථභාවය රැකගනිමින් ප්‍රවාහනය කිරීමට පියවර ගෙන ඇති බවත් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති ජෙනරාල් (විශ්‍රාමික) එම්. ආර්.ඩබ්ලිව් සොයිසා මහතා පැවසීය.



පාසල් සිසුන් ගමන් ගන්නා අයුරු..

LRDC බෝට්ටු සේවය ලෙස නම් කොට ඇති මෙම මගී බෝට්ටු සේවයෙන් දිනපතා පාසල් දරුවන් සහ විවිධ සේවා ස්ථානයන් වෙත යන මගීන් ගමන් කරන අතර ඔවුන් වෙනුවෙන් උදෑසන හයයි තිහේ සිට සවස 7 දක්වා ගමන් වාර දහයකින් යුතු බෝට්ටු සේවාවක් යොදවා ඇත.



මගී බෝට්ටු සේවාවට ටිකට්පත් නිකුත් කරන ආකාරය

සාමාන්‍යයෙන් වැල්ලවත්ත කලාපයේ සිට බත්තරමුල්ල දෙසට පුද්ගලික රථයකින් ගමන් කළ ද අධික වාහන තදබදය හේතුවෙන් එම ගමන් මාර්ගය සඳහා විනාඩි 45ක කාලයක් වැය වන අතර මෙම බෝට්ටු සේවාව මගින් ඕනෑම අයකුට විනාඩි පහළවක් විස්සක් අතර කාලයකින් බත්තරමුල්ලට ළඟාවීමේ හැකියාව ඇති බව ඒ මහතා පැවසීය.

කොළඹ ප්‍රදේශය පුරා දිනපතා උදෑසන පවතින අධික මාර්ග තදබදයට විසඳුමක් ලෙස ආරම්භ කරනු ලැබූ මෙම බහු මගී බෝට්ටු සේවාව මේ වන විට කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ද ගමන් පහසුකම් සපයා ගැනීමට විශේෂිත වූ ආරක්ෂිත ප්‍රවාහන සේවයක් බව ද ඒ මහතා පැවසීය.

එක් මගියකුට රුපියල් සීයක් වැනි මුදලක් වැය කරමින් නවමු අත්දැකීමකට මුහුණදෙමින් ගමන් කළ හැකි මෙම සේවාව කොවිඩ් නීතිරීතිවලට අනුව වඩා කාර්යක්ෂමව සිදුකිරීමට මේ වන විට පියවර ගෙන ඇති බව ද ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

වැල්ලවත්තෙන් ගමන් ආරම්භ කොට බත්තරමුල්ල දක්වා යන ගමනේ දී මගියෙකුට අවශ්‍ය නම් නාවල ප්‍රදේශයට ඇතුළු විය හැකි වන ආකාරයට ඇති තොටුපොළෙන් ද ගොඩබිමට සේන්දු විය හැකි බව ද ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

(මොරටුව රේඛා තරංගනී ෆොන්සේකා)

# ගම්පහ දිස්ත්‍රික්කයේ සමෘද්ධි ලාභීන්ට වැඩියෙන් ප්‍රතිලාභ

(ගම්පහ තිලකරත්න දිසානායක)

**සමෘද්ධිලාභීන් වෙනුවෙන් ලබාදෙන ප්‍රතිලාභ වැඩි කිරීමට රජය පියවර ගෙන ඇති අතර සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ අංශ හතක් වෙනුවෙන් දීමනා වැඩි කොට ඇති බව ගම්පහ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කරයි.**

මේ අනුව සමෘද්ධිලාභී දරු උපත්වල දී පළමු, දෙවන සහ තෙවන දරු උපත් සඳහා රුපියල් 10,000 ක් වශයෙන් ද, නිවුන් දරු උපතක දී රුපියල් 10,000 ඇතුළුව රුපියල් 5000 බැගින් වර්ෂයක් සම්පූර්ණ වන තුරු ද තුන් නිවුන් දරු උපතක දී රුපියල් 10,000 ඇතුළුව රුපියල් 10,000 බැගින් වර්ෂයක් සම්පූර්ණ වන තුරු ද ගෙවීම් සිදු කෙරෙන බව ගම්පහ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අයේෂ් එම්. පෙරේරා මහතා පැවසීය.


මේ අතර ප්‍රතිලාභියා හෝ දරුවන්ගේ නීත්‍යානුකූල විවාහ අවස්ථා දෙකක දී රුපියල් 10,000 බැගින් ද රෝග අවස්ථාවන් හිදී දිනකට රුපියල් 350 බැගින් වර්ෂයකට දින 30 ක උපරිමයක් දක්වා ද සමෘද්ධිලාභී මරණයක දී රුපියල් 20,000 ක් වශයෙන් ද ගෙවීම් සිදුකෙරෙන බව අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

මීට අමතරව සිප්දෙර ශිෂ්‍යත්වය සඳහා රුපියල් 1500 ක් බැගින් උසස් පෙළ විභාගය තෙක් වසර දෙකක කාලයක් වෙනුවෙන් ගෙවීම සිදු කෙරේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභීන් වෙනුවෙන් ඉකුත් වසරේ ගෙවීම් කොට ඇති මුදල රුපියල් මිලියන 140 ක් බව ද අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් පැවසීය.

# යතුරුපැදිය ටිපරයක ගැටී පැදිකරුට බරපතළ තුවාල

## පාරේ තිබූ විශාල වළක් අනතුරින් පසු වසා දමලා



අනතුර සිදුවූ ටිපරය

**හංවැල්ල පොලිස් වසමේ පහළ හංවැල්ල 'නදී තෙර උද්‍යානය' අසල ඊයේ (02) දින පෙරවරුවේ ටිපර් රථයක යතුරුපැදියක් ගැටී යතුරු පැදිකරු බරපතළ තුවාල ලබා නවගමුව රෝහලටත් ඉන්පසු කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇතැයි හංවැල්ල පොලිසිය පවසයි.**



අනතුර සිදුවූ ස්ථානයේ තිබූ වළ

මෙම අනතුරින් යුද හමුද සාමාජිකයෙකු බව පවසන අඹේපුස්ස ප්‍රදේශයේ පදිංචි අයෙකුගේ එක් අතකට බරපතළ ලෙස තුවාල සිදුවී ඇති බව පොලිසිය පවසයි.

ටිපර් රථය කන්තලේ සිට හෝමාගමට වැලි ප්‍රවාහනය කරමින් තිබී ඇති බවත් යතුරු පැදිය කොළඹ දෙස සිට හංවැල්ල දෙසට ධාවනය වෙමින් තිබිය දී මෙම අනතුර සිදුවී ඇතැයි පොලිසිය පවසයි.

මෙම අනතුර හේතුවෙන් මාර්ගයේ දැඩි රථවාහන තදබදයක් තිබූ අතර හංවැල්ල පොලිස් ස්ථානාධිපතිවරයා එම ස්ථානයට පැමිණ ලොරි රථය එම ස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු සිදු කිරීමෙන් පසු රථවාහන තදබදය අවසන් විය.

මෙම අනතුර සිදුවූ ස්ථානයේ දින කීපයකට පෙර මාර්ගයේ හාරන ලද වළක් නිසි පරිදි වසා නොතිබූ බව පවසන ප්‍රදේශවාසීහු අනතුර සිදුවී පැය කීපයකට පසු මාර්ගයේ තිබූ එම වළ පස් දමා වසා තිබූ අයුරු ද දැකගත හැකි විය.

ලොරි රථයේ රියදුරු සහ ලොරි රථය පොලිස් භාරයට ගෙන ඇත.

හංවැල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වසන්ත කුමාර මහතාගේ උපදෙස් මත රථවාහන අංශයේ පොලිස් සැරයන් 28754 වැලිකල මහතා වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

(පාදුක්ක විශේෂ නිහාල් වෙත්තසිංහ)

# පුවක්පිටිය නගරයේ පිළිසකර කළ ඇළටත් කුණු දාලා...



(අවිස්සාවේල්ල විශේෂ සෝමසිරි හිඟුරලආරච්චි)

පුවක්පිටිය නගරයේ සිට ඇස්වතුඔයට c,hගලා බස්නා ඇළ මාර්ගය අපිරිසුදු වී පවතින අයුරු ඡායාරූපයේ දැක්වේ.

පසුගිය සමයේ මේ ඇළ මාර්ගය සීතාවකපුර නගර සභාවෙන් බැකෝ යන්ත්‍ර දමා හාරා පිළිසකර කර පැවැතියත් ඇතැම් පිරිස් නගර සභාවේ පවත්නා නීති රීති ද නොතකා කැළි කසළ මෙලෙස දැමීමට පුරුදුවී සිටිති.

# මගතොට-බස්වල බොරුවට රඟන වංචාකාරයන්ගෙන් පරිස්සම් වෙන්න

## මීගහවත්ත පොලිස් ස්ථානාධිපති කියයි

(මීගහතැන්න ප්‍රේමතිලක පෙරමුණ)

**විවිධ අයුරින් වෙස්වලාගෙන පැමිණ මුදල් වංචාවන් සිදු කරන පිරිසක් සම්බන්ධ සිද්ධීන් කිහිපයක් වාර්තා වී ඇති බවත් , මෙම වංචාකාරයන්ට හසු නොවී නිරතුරුවම අවධානයෙන් සිට බුද්ධිමත්ව කටයුතු කරන ලෙසත් මීගහතැන්න පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.එම්.ජේ. ආරියවංශ මහතා ජනතාවගෙන් ඉල්ලා සිටී.**

පසුගිය දින කිහිපය තුළ දී විදුලි උපකරණ අලෙවිකරුවන් ලෙස පැමිණි පුද්ගලයන් දෙදෙනකු කුට උපක්‍රම භාවිත කරමින් රංගනයක යෙදී පුද්ගලයකුගේ විශ්වාසය කඩ කිරීමක් සිදු කර රුපියල් 49000 ක් වංචා කළ සිදුවීමක්, සූක්ෂම උපක්‍රම භාවිතා කරමින් ව්‍යාජ මැණික් අලෙවි කරන කාන්තාවක්, ආබාධිත සහ රෝගී දරුවන්ගේ ඡායාරූප උපයෝගී කර ගනිමින් වංචා සහගත ලෙස ආධාර මුදල් එකතු කළ පුද්ගලයකු සහ විසිතුරු මසුන් මිල දී ගැනීමේ නියාවෙන් පැමිණ රන් මාලයක් කොල්ලකෑමේ සිද්ධියක් පිළිබඳ මීගහතැන්න පොලිස් බල ප්‍රදේශයෙන් වාර්තා වූ බව පොලිස් ස්ථානාධිපතිවරයා පැවසීය

මේ කරුණු සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීමේ දී, මෙවැනි පුද්ගලයන් පිළිබඳ අවබෝධයක් නොමැතිකමින් හා අසීමිත ලාබ ඉපයීමේ අපේක්ෂාව නිසා මෙවැනි වංචාකාරයන්ට බොහෝ පිරිසක් පහසුවෙන්ම ම හසුවන බව සනාථ වී ඇතැයි ද, මේ නිසා රටේ ලෝකයේ සිදු වන මෙවැනි දෑ පිළිබඳ නිරතුරුව ම අවධානයෙන් සිට බුද්ධිමත්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව ද පොලිස් ස්ථානාධිපතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.




# හමුද සෙබළුන් ගිය බසයට යටවූ කාන්තාවක් මරුට

(කළුතර - සුනිල් එස්. තන්ත්‍රිආරච්චි)

**යුද හමුද සෙබළුන් පිරිසක් ප්‍රවාහනය කරමින් සිටි බස් රථයකට ඉකුත් 15 වැනිද දහවල් 11.10ට පමණ කළුතර නගර මධ්‍යයේ මගී මාරුවේදී යටවී තුවාල ලැබූ සිවු දෙනා අතර සිටි කාන්තාවක් කළුතර නාගොඩ මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී ඊයේ (31 වැනිද) අලුයම 3.55ට මියගොස් ඇත.**

මියගොස් ඇත්තේ මතුගම බෝපිටියේ මොල්ලිගොඩ ලියනගේ සුමිත්‍රා මල්කාන්ති නම් වූ 46 හැවිරිදි අයෙකි.

මෙම අනතුරෙන් ඇගේ නිවුන් දරුවන් දෙදෙනා වූ ලිහාරා මල්මසි සමරනායක (අවු. 12) සහ ලජිත් නිම්රුද සමරනායකද (අවු. 12) තුවාල ලැබූ අතර ඉන් ලිහාරා මල්මසි දැරිය මේ වනවිටද කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින්නීය.

අනතුරෙන් තුවාල ලැබූ අනෙක් අය වන ජී.එම්. රසාංගනී චතුරංගනී (අවු. 29) මේ වනවිටත් ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ලබන බව පොලිසිය කියයි.

යුද හමුද සෙබළුන් ප්‍රවාහනය සඳහා කුලී පදනම මත ලබාගෙන තිබූ මෙම බස් රථය ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වෙමින් තිබියදී මෙම අනතුර සිදුවී ඇත.

අනතුරට අදළ බස් රථයේ රියැදුරු වූ යාපනය චුන්නාකම් ප්‍රදේශයේ පදිංචි සිවනේස්වරම් නම් වූ අය රක්ෂිත බන්ධනාගාර ගත කළ අතර ඔහු ඉකුත් 29 වැනිද කළුතර මහේස්ත්‍රාත් අධිකරණය මගින් ඇප මත මුද හරිනු ලැබ සිටියේය.

කළුතර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනෙත් ශාන්ත මහතාගේ උපදෙස් මත රථවාහන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රත්නවීර හා සැරයන් (6063) දිසානායක යන මහත්වරු මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# ගෙදර එකතුවන කුණුවලට ජා-ඇල ප්‍රා: සභාවෙන් සල්ලි



**ගෘහස්ථව එක්රැස් වන කසළ සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට මුදල් ලබා දීමට ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් කටයුතු ආරම්භ කරනු ලැබීය.**

වර්ල්ඩ් විෂන් ආයතනයේ ෆින්ලා ව්‍යාපෘතිය තුළින් මෙලෙස ගෘහස්ථ කසළ එක්රැස් කර ජා-ඇල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය හා පරිසර ඒකකය හරහා ගෘහ ඒකකවලට මුදල් ලබා දීම සිදුකරනු ලබයි.

ඉන්දුනීසියාව, පිලිපීනය ආදී රටවල සාර්ථකව ක්‍රියාත්මක වන කසළ කළමනාකරණය තුළින් ජීවන උපාය ගොඩ නගාගැනීම මෙරටට හඳුන්වා දෙමින් ආරම්භ කර තිබෙන මෙම කසළ මිල කිරීමේ වැඩසටහන මේ වනවිට ලංකාවේ ජා-ඇල, වත්තල හා චාවකච්චේරිය වැනි ප්‍රදේශවල ක්‍රියාත්මකව පවතින අතර කසළ සඳහා මුදල් ලබා දීම ලංකාවේ ප්‍රථම වරට සිදුකර ඇත්තේ ජා-ඇල ප්‍රාදේශීය සභාව විසිනි.

**ජා-ඇල ප්‍රාදේශීය සභාවේ සභාපති චන්ද්‍රපාල මදුරප්පෙරුම මහතා පවසා සිටියේ** ගෘහස්ථව ජනනය වන ප්ලාස්ටික්, යකඩ, පොලිතීන්, කඩදාසි, රෙජිෆෝම්, වීදුරු වැනි නොදිරන අපද්‍රව්‍ය මින් මතු ගෘහයට කරදරයක් නොව මුදල් උපයන සම්පතක් බවට පත් කිරීම යථාර්ථයක් කර තිබෙන බවයි. ඒ සඳහා මුදල් ගෙවීම ජා-ඇල ප්‍රාදේශීය සභාව ආරම්භ කර අවසන් බව ද සභාපතිවරයා කීය.

**ෆින්ලා ව්‍යාපෘතියේ තාක්ෂණික විශේෂඥ නිමල් ප්‍රේමසිරි මහතා මෙම අවස්ථාවට එක් වෙමින් පැවසුවේ** ලංකාව අමුද්‍රව්‍ය ගෙන්වීම සඳහා විශාල විදේශ විනිමයක් වැය කිරීම රටට බරක් බවත් මෙම කසළ රැස් කිරීමේ ව්‍යාපෘතිය තුළින් අමුද්‍රව්‍ය මෙරටදීම නිපදවීම සිදු කරන බවත්ය. ලංකාවේ මේ වනවිට කසළ ප්‍රතිචක්‍රීයකරණය කරන ආයතන හාරසියයක් පමණ ඇතත් ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය අපද්‍රව්‍ය නොමැති බවත් ඔවුන්ට අවශ්‍ය ද්‍රව්‍ය රටට කසළ ලෙස බරක්ව පවතින්නක් බවත් මේ කසළ සඳහා මුදල් ලබා දී ගෘහස්ථ ජීවන උපාය සංවර්ධන කර වසර කිහිපයක් තුළ මෙරට කසළ ගොඩගැසීම අවසන් කිරීම තම අපේක්ෂාව බවද නිමල් ප්‍රේමතිලක මහතා පැවසීය.

මෙම අවස්ථාවට වර්ල්ඩ් විෂන් ආයතනයේ ව්‍යාපෘති කළමනාකාර හේමන්ත ජයමාන්න, ජා-ඇල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය හා පරිසර කමිටුවේ සභාපති රසික සොයිසා මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් එක්ව සිටියහ.

(ජා-ඇල ප්‍රසංග පෙරේරා)

# මතුගම - වෙල්ලත පාර සෝදු පාළුවට ගිහින්: පයින් යන්නත් බෑ ජනතාව කියති

(මතුගම බන්දු තඹවිට)

**මතුගම වැල්කන්දල හරහා වෙල්ලත මාර්ගය ගමන් කිරීමට නොහැකි තත්ත්වයට අබලන්වී ඇති බව එම ප්‍රදේශවාසීහු පවසති.**

මතුගම වැල්කන්දල සිට වෙල්ලත දක්වා ගමන් කරන මෙම මාර්ගයේ ගල් ගැලවී මාර්ගය දැඩි සෝදපාලුවට ලක්වීම නිසා එම මාර්ගයේ වාහනයක තබා පයින්වත් ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් උදවී ඇත.

**මෙම මාර්ගය පිළිබඳව මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපති මෙරිල් මුණසිංහ මහතා මෙසේ පැවසීය.**

මෙම වැල්කන්දල මාර්ගය අබලන්වීම පිළිබඳව එම ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවට පත්වෙලා තිබෙනවා. මේ වනවිට මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන අබලන්ම මාර්ගය මෙම මාර්ගයයි. පසුගිය රජයේ අයි රෝඩ් ව්‍යාපෘතියෙන් මෙම මාර්ගය සංවර්ධනය කිරීමට ආරම්භකර එම කටයුතු අතරමග නතර කිරීම නිසා දැන් පාරේ පයින්වත් යන්න බැරි තත්ත්වයකට පත්වෙලා. එම ඉදිකිරීම් සමාගමේ කටයුතු පසුගිය රජයේ ප්‍රාදේශීය බලධාරීන් අධීක්ෂණය නොකිරීම නිසා මුළු පාරම විනාශ වෙලා. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය දැන්



මතුගම - වෙල්ලත පාර අබලන් වී ඇති අයුරු..

කියන්නේ මේ පාරට අධිකරණයේ නඩුවක් පවතින නිසා එම ආයතනයට මෙම මාර්ගයේ කිසිම කටයුත්තක් සිදුකළ නොහැකි බවයි.

පළාත් පාලන ආයතනයක් විදිහට අපට ජනතාවගේ ගැටලුවක් පිළිබඳව ඇස් කන් පියාගෙන ඉන්න බැහැ. නඩුවක් පවතිද්දී මාර්ගය මුළුමනින්ම සංවර්ධනය කිරීමට නොහැකි වුණත් ජනතාවට අපහසුවකින් තොරව ගමන් කළ හැකි තත්ත්වයට මෙම මාර්ගය අලුත්වැඩියා කර දෙන්න අප පියවර ගන්නවා. මෙම වැල්කන්දල මාර්ගය භාවිතා කරන ජනතාවට මෙම සිංහල අවුරුද්දට පෙර නිරුපද්‍රිතව ගමන්කළ හැකි ආකාරයට මාර්ගය පිළිසකර කර දීමට පියවර ගන්නවා යැයි පැවසීය.

# වොලිබෝල් නිලවරණයට පිට අයත් එනවා යයි උප සභාපති ධූර අපේක්ෂකයාගෙන් විරෝධතාවක්

(නාමල් පතිරගේ)

**රීඩ් මාවත ක්‍රීඩා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී හෙට (4) පෙරවරු 10.00 ට පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ නිලවරණයේ දී ඡන්දය ප්‍රකාශ කරන නියෝජිතයන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා උපසභාපති ධූර අපේක්ෂක මහින්ද සෙනරත් බණ්ඩාර මහතා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විරෝධතාවක් බාරදී තිබේ.**

කොළඹ දිස්ත්‍රික් වොලිබෝල් සංගමයේ සභාපතිවරයාද වන බණ්ඩාර මහතා ක්‍රීඩා ඇමැතිවරයා හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයාටද පිටපත් යොමු කරමින් එම විරෝධතාවයෙන් පෙන්වාදී ඇත්තේ නිලවරණයේ දී ඡන්දය ප්‍රකාශ කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වොලිබෝල් සංගම්හි නියෝජිතයන් අදාළ සංගමයට අයත් බල ප්‍රදේශයේම පදිංචිකරුවකු බවට සහතික කර ගත යුතු බවයි. ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වොලිබෝල් සංගම් නියෝජනය කරමින් නිලවරණයට සහභාගි වන නියෝජිතයන්ගේ අනන්‍යතාව සම්බන්ධයෙන් මතුවී ඇතැයි කියන ගැටලු පිළිබඳව අවධාරණය කරමින් උපසභාපති ධූර අපේක්ෂකයා එම විරෝධතාව බාරදී ඇතැයි ද වාර්තා වේ.

ඒ පිළිබඳව 'ලංකාදීප' ය කළ විමසුමකදී ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය මහතා පැවසුවේ අදාළ විරෝධතාව සම්බන්ධයෙන් නිලවරණ කමිටුව දැනුවත් කිරීමට පියවර ගත් බවයි. එහිදී ඡන්ද නියෝජිතයන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමේ දී වඩාත් අවධානය යොමුකරන ලෙස නිලවරණ කමිටුවට උපදෙස් දුන් බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

මේ අතර වොලිබෝල් සම්මේලනයේ ලේකම් ඒ.එස්. නාලක මහතා පැවසුවේ නිලවරණයේදී ඡන්දය ප්‍රකාශ කරන නියෝජිතයන් සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් පැන නැගී නැති බවයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වොලිබෝල් සංගමයේ ලේකම්වරයා සහ සභාපතිවරයා අනුමතකර එවන නියෝජිතයන් එහිදී පිළිගන්නා බවත් ලේකම්වරයා පැවසීය.

වත්මන් සභාපති, නියෝජ්‍ය කතානායක රංජිත් සියඹලාපිටිය මහතා සිය නාමයෝජනාව ඉල්ලා අස්කර ගැනීමෙන් හෙට පැවැත්වෙන ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ නිලවරණයේදී සභාපති ධූරය සඳහා එහි වත්මන් ජ්‍යෙෂ්ඨ උපසභාපති කංචන ජයරත්න මහතා දැනටමත් නිතරගයෙන් පත්ව සිටියි. වත්මන් ප්‍රධාන ලේකම් ඒ.එස්. නාලක, වත්මන් භාණ්ඩාගාරික තුෂාර සම්පත් පෙරේරා, උපලේකම් ධූර දෙකක් සඳහා සමන්සිරි අබේවර්ධන, කාන්තසිරි මීගමුවගේ, උපභාණ්ඩාගාරික ධූරයට අසංක රාජපක්ෂ යන මහත්වරු යළිත් නිතරගයෙන් පත්ව සිටිති.

කෙසෙ වෙතත් උපසභාපති ධූර හයක් සඳහා නාමයෝජනා අටක් ඉදිරිපත්ව තිබේ. ඒ අන්දමට ජාතික සංවිධායක ධූරයට ද නාමයෝජනා දෙකක් ඉදිරිපත්ව තිබේ.

කාරක සභාව සඳහා කාන්තාවක්ද ඇතුළුව, ධූර 11ක් සඳහා නාම යෝජනා 13ක් බාරදී තිබේ. එහිදී කාන්තා නියෝජනයට නිතරග පත්වීම් කෙරේ.

හෙට පැවැත්වෙන වොලිබෝල් නිලවරණය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ව්‍යවස්ථාපිත හා විශේෂිත යන සංගම් 98 ක් ඡන්දය භාවිතා කිරීමට සුදුසුකම් ලබා සිටියි. මුළු ඡන්ද එකතුව 196 කි. නිලවරණයට පෙර මහ සභා රැස්වීම හෙට පෙරවරු 9.00 ට ආරම්භ වේ.

# ක්‍රිකට් කළමනාකරණයට කමිටුවක්

**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පරිපාලනය සඳහා මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් යුත් නිලධාරීන් පස් දෙනකුගේ කමිටුවක් ඊයේ පත්කරනු ලැබිණ.**

ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් පවතින බලතල යොදා ගනිමින් මෙම පංච පුද්ගල කමිටුව ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා විසින් පත්කරන ලදි.

ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය, සුජීව මුදලිගේ, උචිත වික්‍රමසිංහ සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ඈෂ්ලි ද සිල්වා යන මහත්වරු එහි සෙසු සාමාජිකයෝ වෙති.

හිටපු නිලධාරී මණ්ඩලයේ නිල කාලය පසුගිය පෙබරවාරි මස 20 වැනිද අවසන් වූ බවත් මීළඟ ක්‍රිකට් නිලවරණයෙන් නව නිලධාරීන් පත්වන තෙක් ක්‍රිකට් පරිපාලනයට කමිටුවක් පත්කළ යුතු බවත් කෝල්ට්ස් ක්‍රිකට් සමාජයේ සභාපතිවරයා සහ ලේකම්වරයා විසින් ක්‍රීඩා අමාත්‍යංශයට විරෝධතාවක් ගොනුකර තිබිණ. පසුව මෙම විරෝධතාව වැඩිදුර උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යවන ලදි.

නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් වූයේ වත්මන් නිලධාරීන්ගේ පාලන කාලය පෙබරවාරි මස 20 වැනිද අවසන් වූ බැවින් මීළඟ නිලවරණය දක්වා කළමනාකරණ කමිටුවක් පත්කරන ලෙසයි.

ලබන මැයි මස 20 වැනිද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය පැවැත්වීමට නියමිතය.

මේ අතර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දැනට පවතින ව්‍යවස්ථාව වෙනස් කරමින්, නිලවරණය පැවැත්වීම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමයක් හඳුන්වාදෙන ලෙසත් ඉල්ලා සිටිමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතයේ හිටපු නිලධාරීන් මෙන්ම හිටපු ක්‍රිකට් ක්‍රීඩකයෝ 12 දෙනෙක් අභියාචනාධිකරණයෙන් ඉල්ලීමක් කර තිබේ.

# දිමුත්-තිරිමාන්න සාර්ථක සටනකට අරම්භයක්

**ළහිරු තිරිමාන්න (නොදැවී 37) සහ දිමුත් කරුණාරත්න (නොදැවී 54) සාර්ථක ආරම්භයක් ලබාගැනීම හේතුවෙන් ඇන්ටිගුවාහිදී පැවැත්වෙන දෙවැනි ටෙස්ට් තරගයේ පස්වැනි සහ අවසන් දිනයවූ ඊයේ (2 වැනිදා) දිවා ආහාරයට තරගය නතර කරන විට ශ්‍රී ලංකා දෙවැනි ඉනිමට කිසිවකු නොදැවී ලකුණු 93 ක් රැස්කර සිටියේය.**


ලහිරු තිරිමාන්න සහ දිමුත් කරුණාරත්න (ඡායාරූපය- ඒ.එෆ්.පී)

දිනය ආරම්භයේදී වාර්ෂාවෙන් බාධා ඇතිවීම නිසා මිනිත්තු 55 ක පමණ කාලයක් තරගය පමාවූ අතර ජයග්‍රහණය සඳහා ලකුණු 377 ක ඉලක්කයක් හඹායන ශ්‍රී ලංකාවට තරගය අවසන් කිරීමට පෙර ඕවර 60 කදී තවත් ලකුණු 284 ක් අවශ්‍යව තිබුණි.

සිය ටෙස්ට් දිවියේ 25 වැනි අර්ධ ශතකය වාර්තා කිරීමට දිමුත් කරුණාරත්න සමත්වූවද මොවුන් දෙදෙනා මන්දගාමී ලකුණු රැස්කිරීමක නිරත වූහ.

තරගයේ සිවුවැනි දිනය වූ බ්‍රහස්පතින්ද දිනය නිමා වන විට ශ්‍රී ලංකා කණ්ඩායම කිසිවකු නොදැවී ලකුණු 29 ක් ලබා සිටියේය.

කෙසේ වෙතත් තරගයේ අවසන් හෝරා හතරක පමණ කාලය ශ්‍රී ලංකා පිතිකරුවන්ට බෙහෙවින් අභියෝගාත්මක එකක් වනු ඇත. විශේෂයෙන්ම කෙටි පන්දු සඳහා තණතීරුවෙන් ලැබෙන සහයෝගයත්, පුල් පහර ගැසීමට ශ්‍රී ලංකා පිතිකරුවන් දක්වන කැමැත්තත් හේතුවෙන් පා ඉන්න පැත්තෙන් වැඩිපුර ක්‍රීඩකයන් රඳවා පිතිකරුවන් එවන් පහර කරා පෙළඹවීම කොදෙව් උපාය වන්නට පුළුවන. ඒ සඳහා අවශ්‍ය තරම් ලකුණු කොදෙව් පුවරුවේ තිබේ.

## ලකුණු පුවරුව

**බටහිර ඉන්දීය කොදෙව් - පළමු ඉනිම 354**
**ශ්‍රී ලංකාව - පළමු ඉනිම 258**
**බටහිර ඉන්දීය කොදෙව් - දෙවැනි ඉනිම කඩුලු 4 ට 280**

**ශ්‍රී ලංකාව - දෙවැනි ඉනිම**

| | |
|---|---|
| ළහිරු තිරිමාන්න - නොදැවී | 37 |
| දිමුත් කරුණාරත්න - නොදැවී | 54 |
| අතිරේක | 2 |
| එකතුව ඕවර 34 කදී කිසිවකු නොදැවී | 93 |

**පන්දුවට පහරදීමට සිටින පිතිකරුවෝ**
ඕෂධ ප්‍රනාන්දු, දිනේෂ් චන්දිමාල්, ධනංජය ද සිල්වා, පැතුම් නිස්සංක, නිරෝෂන් දික්වැල්ල, සුරංග ලක්මාල්, ලසිත් ඇඹුල්දෙණිය, දුෂ්මන්ත චමීර සහ විශ්ව ප්‍රනාන්දු

**පන්දු යැවීම**
කෙමර් රෝච් : 9-1-26-0, ජේසන් හෝල්ඩර් : 5-2-11-0, රකීම් කොන්වෝල් : 9-1-20-0, ශැනන් ගේබ්‍රියල් : 4-2-14-0, අල්සාරී ජෝසප් : 3-0-12-0, ජර්මේන් බ්ලැක්වුඩ් : 3-1-05-0, ක්‍රෙග් බ්‍රැත්වෙයිට් : 1-0-04-0

# සාග් ටයිකොන්ඩෝ පදක්කම්ලාභීන්ට උපහාර

**වසර 2019 දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේදී පදක්කම් දිනූ ටයිකොන්ඩෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අගැයීමේ උත්සවයක් තලවතුගොඩ 'ග්‍රෑන්ඩ් මොනාක්' හෝටලයේ දී පසුගියද පැවැත්විණි. එහිදී ටයිකොන්ඩෝ ක්‍රීඩාවෙන් පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 27 දෙනකු අගැයීමට ලක් කෙරිණ.**





කත්මණ්ඩු සාග් ක්‍රීඩා උළෙලේ දී ටයිකොන්ඩෝ ක්‍රීඩාවෙන් රන් පදක්කම් හතරක්, රිදී පදක්කම් හතක් හා ලෝකඩ පදක්කම් 16ක් දිනා ගැනීමට ශ්‍රීලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ.

මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූ ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පදක්කම් දිනූ ක්‍රීඩකයකුට හා ක්‍රීඩිකාවකට සමරු තිළිණ ප්‍රදනය කළ අයුරු.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනයේ වත්මන් සභාපති කංචන ජයරත්න, පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය තේනුක විදනගමගේ, ක්‍රීඩා අමාත්‍යාංශයේ ලෙක්ම් අනුරාධ විජේකෝන්, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් රවීන්ද්‍ර සමරවික්‍රම, ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂ සජිත් ජයලාල් යන මහත්වරු ද සහභාගි වූහ.

පදක්කම්ලාභීන් වෙනුවෙන් ටයිකොන්ඩෝ ක්‍රීඩා උපකරණ බෙදාදීමක් ද එහිදී සිදු කෙරුණි.

# එන්.සී.සී. - ද්‍රවිඩ සංගමය රාගම - නාවික හමුදාව අර්ධ අවසන් පූර්ව වටයට

(රොෂාන් ගුණරත්න)

**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධානය කරන සීමිත ඕවර (ඕවර 50) ක්‍රිකට් තරගාවලියේදී පළමුවෙන්ම අර්ධ අවසන් පූර්ව වටයේ සිය ස්ථාන වෙන්කර ගැනීමට එන්.සී.සී, ද්‍රවිඩ සංගමය, රාගම සහ නාවික හමුද යන කණ්ඩායම් සමත් වූහ.**

'බී' සහ 'සී' කාණ්ඩ සඳහා කණ්ඩායම් 6 ක් පමණක් ක්‍රීඩාකරන බැවින් එම කාණ්ඩයන්හි මූලික වටයේ තරග ඊයේ (1 වැනිදා) අවසන් විය. ඒ අනුව ප්‍රසාද ලකුණු 23 ක් ලබාගත් රාගම ක්‍රීඩා සමාජය සහ ප්‍රසාද ලකුණු 14 ක් ලබාගත් නාවික හමුදව 'බී' කාණ්ඩයෙන් අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබාගත්තේය.

ප්‍රසාද ලකුණු 23 ක් ලබාගත් එන්.සී.සී පිල සහ ප්‍රසාද ලකුණු 15 ක් ලබාගත් ද්‍රවිඩ සංගම් පිල 'සී' කාණ්ඩයෙන් අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබාගැනීමට සමත්වූහ.

තරග 5 කට සහභාගිවූ රාගම සහ එන්.සී.සී කණ්ඩායම් සියලුම තරග ජයගනිමින් අපරාජිත වාර්තාව රැකගැනීමට සමත්ව සිටිති.

'ඒ' සහ 'ඩී' කාණ්ඩ සඳහා කණ්ඩායම් 7 බැගින් ක්‍රීඩා කරන බැවින් එම කාණ්ඩයන්හි මූලික වටයේ තරග මේ මස 5 වැනිදා අවසන් වීමට නියමිතව ඇත.

ප්‍රසාද ලකුණු 15 බැගින් ලබාසිටින සී.සී.සී සහ බදුරලිය කණ්ඩායම් මේ වනවිට 'ඒ' කාණ්ඩයේ ප්‍රසාද ලකුණු සටහනේ ඉදිරියෙන් සිටිති. එස්.එස්.සී පිල ප්‍රසාද ලකුණු 19 ක් සහ කෝල්ට්ස් පිල ප්‍රසාද ලකුණු 15 ක් ලබාගනිමින් මේ වනවිට 'ඩී' කාණ්ඩයේ ඉදිරියෙන් පසුවෙති.

සීමිත ඕවර තරගාවලියේ අර්ධ අවසන් පූර්ව තරග 7 වැනිදාත්, අවසන් පූර්ව තරග 9 වැනිදාත් අවසන් මහා තරගය 11 වැනිදාත් පැවැත්වීමට නියමිතව ඇත.

# ලෝක කුසලාන සංවත්සරයදා සචින් තෙන්ඩුල්කාර් රෝහලේ

**ඉන්දියාව දෙවැනි වරට (2011) ලෝක කුසලාන දිනාගැනීමේ දශක පූර්ණ සංවත්සරය පැවැති ඊයේ (02 වැනිදා) මුම්බායි නුවර රෝහලකට වී සිටීමට, 2011 කණ්ඩායමේ අසහාය පිතිකරු, සචින් තෙන්ඩුල්කාර්ට සිදුවී තිබිණ. කොරෝනා වයිරසය අසාදනය වීම හේතුවෙන් දින කිහිපයක් තිස්සේ නිවසේ නිරෝධායනය වෙමින් සිටි තෙන්ඩුල්කාර් ඊයේ හදිසියේම රෝහල් ගතකළ බව රොයිටර් පුවත් සේවය වාර්තා කළේය.**



ඔහුගේ පූර්ව ආරක්ෂාව සඳහා රෝහලට ඇතුළත් කර ඇතැයිද වාර්තා වේ.

මේ වන විට 47 වැනි වියේ පසුවන තෙන්ඩුල්කාර් පවසා ඇත්තේ තමන් නිවසේදී නිරෝධායනය වෙමින් සිටියත්, වෛද්‍ය උපදෙස් මත රෝහලට ඇතුළත් වූ බවයි.

"ටික දිනකින් මා ආපසු ගෙදර යනවා.. මට සුබ පැතූ සියලු දෙනාටම ස්තුතියි.. ඔබත් පරිස්සමෙන් ඉන්න"

"අපේ ලෝක කුසලාන ජයග්‍රහණයේ 10 වැනි සංවත්සරය සමරන සියලු දෙනාටත් මගේ හෘදයංගම සුබපැතුම් එක් කරනවා"යයි තෙන්ඩුල්කාර් ට්විටර් පණිවුඩයක් නිකුත් කර ඇතැයි ද රොයිටර් පුවත් සේවය වාර්තා කළේය.

# ඩයලොග් වෙරළ පාපන්දු පළමු අදියර අද

**'ඩයලොග්' ශූරතා වෙරළ පාපන්දු තරගමාලාවේ පළමු අදියර තරගාවලිය අද (03) හම්බන්තොට වෙරළ තීරයේදී පැවැත්වේ. ඒ සඳහා කණ්ඩායම් 12ක් තරග වදියි.**



ඩයලොග් වෙරළ පාපන්දු තරගාවලියට අනුග්‍රහය දක්වමින් ඩයලොග් ආසියාටා සමාගම වෙනුවෙන් එහි ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරී (මාධ්‍ය හා ලාංඡන) හර්ෂ සමරනායක මහතා ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සභාපති අනුර ද සිල්වා මහතාට අනුග්‍රාහකය නිල වශයෙන් ප්‍රදානය කළ අයුරු.

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය, ඩයලොග් ආසියාටා සමාගමේ අනුග්‍රහයෙන් මෙම තරගමාලාව සංවිධානය කරයි. මෙම තරගාවලියේ තවත් අදියර තුනක් වැල්වැටිතුරෙයි, කල්මුණෛ හා මීගමුවේදී පැවැත්වීමට කටයුතු යොද තිබේ.

පාපන්දු සම්මේලනයේ වෙරළ පාපන්දු කමිටුව හා ෆුට්සාල් කමිටුව තරගාවලියේ සංවිධාන කටයුතුවලට සහය දක්වයි.

පසුගිය වසරේදී පැවැත්වීමට තිබූ මෙම තරගාවලිය කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කල්දැමීමට සිදුවිය.

**හම්බන්තොට තරගාවලියට සහභාගි වන කණ්ඩායම්**

හම්බන්තොට කිංග්ස්, හම්බන්තොට හෝෆ්ට්ස්, මාතර මැරිනර්ස්, මාතර ඊගල්ස්, මාතර ගෝල්ඩ් ස්ටැන්ලියන්ස්, මාතර ගෝල් ජයන්ඩ්ස්, අම්බලන්ගොඩ ටයිටන්ස්, අම්බලන්ගොඩ ඇවෙන්ජර්ස්, බේරුවල බ්ලූස්, බේරුවල ලයන්ස්, කළුතර රෝයල්ස් සහ කළුතර නයිට්ස්.

රැඩිකල් ලොක්කෝ දෙන්නෙක් පුට්ටු කරන්න අලුත් ඛපුවෙක්!
මේ සතියේ දේශය බලන්න....

දේශය
ඉරිදා සංග්‍රහය
දේශයේ අනාගතය වෙනුවෙන්...
මිල රු 50/- යි
ඔබේ පිටපත කලින් වෙන්කරවා ගන්න..
wijeyanewspapers
helping shape opinions
විජය ප්‍රකාශනයක්

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අප්‍රේල් මස 3 වැනිදා සෙනසුරාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.
Lankadeepa - Printed and published by Wijeya Newspapers Ltd. on Saturday 03rd April 2021 at No. 8, Hunupitiya Cross Road, Colombo 02, Sri Lanka.
Telephone: Editorial Dept: 2448321, 2423919, 5330813 Fax: 2438039, Advertising Dept: 2479540, 5383383, 5330330, Fax: 2314864, 2304144 Circulation Dept: 2435454, 2448322, 2479625 Fax: 2459725 General: 2314714